*සැ. යු.-* 2020.12.04 දින අංක 2205 දරන ගැසට් පත්‍රයේ I:III, II, III, IV(අ) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,206 - 2020 දෙසැම්බර් මස 11 වැනි සිකුරාදා - 2020.12.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | — | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 ජනවාරි මස 01 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 දෙසැම්බර් මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1 B 82085 — 5,403 (2020/12)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරී - බණ්ඩ 2 ශ්‍රේණියේ ප්‍රජා විශෝධන නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම (විවෘත) - 2020

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ ප්‍රජා විශෝධන නිලධාරී II ශ්‍රේණියේ තනතුරෙහි (වයඹ, උතුරු මැද, උතුර හා නැගෙනහිර) පළාත්වල පවතින පුරප්පාඩු 09ක් සඳහා සුදුස්සන් තෝරා ගැනීම සඳහා සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙළ කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර **''කොමසාරිස්, ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව, අංක 35ඒ, ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත, බොරැල්ල, කොළඹ 08''** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් සහ dcbcorrection @gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනයට, විද්‍යුත් තැපැල් මගින් එවීම හෝ ඉහත ලිපිනයෙහි පිහිටා ඇති ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල වෙත අතින් ගෙනවිත් භාර දිය යුතු ය. ලියාපදිංචි තැපෑලෙන් හා අතින් ගෙනවිත් භාරදීමේදී කවරයේ වම් පස ඉහළ කෙලවරේ **''ප්‍රජා විශෝධන නිලධාරී තනතුරු සඳහා බඳවා ගැනීම (විවෘත) - 2020''** යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු අතර විද්‍යුත් තැපැල් මගින් එවීමේදී විෂයයෙහි (Subject) ''**CCO Recruitment** -2020 - (**Open**)'' ලෙස පැහැදිලිව සටහන් කළ යුතුය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2021 ජනවාරි 15 දින වේ.

**සටහන .-** ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලෙන් නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට ලැබෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුය.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :

ප්‍රජා පාදක විශෝධ කොමසාරිස් විසින් පත් කරුනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා දෙන ලකුණු මත තෝරා ගනු ලබයි.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අයදුම්කරුවන් යටත් විය යුතු වේ. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දයක මුදල් ගෙවිය යුතුය.

(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර,එම වසර තුන (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 1/2014 අනුව අනෙක් භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම වසර 05ක් තුළ දී ලබාගත යුතුය. රාජ්‍ය භාෂාවකින් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුණු නිළධාරීන් විසින් වසර 03ක් තුළදී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳව ප්‍රවීණතාවය ලබාගත යුතු අතර, අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය වසර පහක් (05) ඇතුළත ලබාගත යුතු ය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලටද මෙම පත්වීම යටත් වේ.

03. *වැටුප් පරිමාණය* :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 අනුව MN 05-2016 ආරම්භක වැටුප් පියවර වේ. (රු. 34,605 - 10x660 - 11 x 755 - 15 x 930 - රු. 63,460/-)

04. *අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්* :

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් අපරාධ විද්‍යාව/සමාජ විද්‍යාව/නීතිය පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම;

හෝ

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වීම;

සහ

දැනට රාජ්‍ය සේවයේ නියුතු නිලධාරියෙකු වීම,

05. *පළපුරුද්ද :*

අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද අමතර සුදුසුකමක් සේ සැලකේ.

06. *වයස් සීමාව :*

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු හා 35ට නොවැඩි විය යුතුය.

07. *සුදුසුකම් :*

සැම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

අනෙක් සුදුසුකම් :

- අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
- අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සුදුසුකම් සැම ආකාරයකින්ම සම්පූර්ණ විය යුතුය.

08. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :*

ප්‍රජා පාදක විශෝධන කොමසාරිස් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ලකුණු ලබාදීම සිදු කරනු ලැබේ.

09. *සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීමේ ක්‍රමය :*

| | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් :<br>i. සමාජවිද්‍යාව/අපරාධ විද්‍යාව/නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය<br>ii. වෙනත් පශ්චාත් උපාධි<br>iii. පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා<br>iv. ඩිප්ලෝමා පාඨමාලා (වසරකට වැඩි)<br>v. ඩිප්ලෝමා පාඨමාලා (මාස 09ට වැඩි) | 25<br>20<br>15<br>10<br>05 | 25 |
| 02 | අතිරේක වෘත්තීය සුදුසුකම් :<br>i. රජය පිළිගත් ආයතනයකින් මත් නිවාරණය/සමාජ වැඩ/ උපදේශනය හෝ අපරාධ විද්‍යාව පිළිබඳ ලබා ඇති ඩිප්ලෝමා (එකකට ලකුණු 03)<br>ii. සමාජ වැඩ/මත් නිවාරණය හා උපදේශනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා (එකකට ලකුණු 03) | 10 | 10 |
| 03 | භාෂා හැකියාව :<br>i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් මව් බස හැර වෙනත් භාෂාවකින් උපාධිය හදරා තිබීම<br>ii. ඉංග්‍රීසි/දෙමළ/සිංහල/ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (මව් භාෂාව හැර එක් භාෂාවකට ලකුණු 10, භාෂාවන් දෙකකට ලකුණු 15)<br>iii. ඉංග්‍රීසි/දෙමළ/සිංහල/සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා (මව් භාෂාව හැර එක් භාෂාවකට ලකුණු 05 බැගින්, භාෂාවන් දෙකකට ලකුණු 10) | 15<br>15<br>10 | 15 |

| | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 04 | අදල ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද (පුනරුත්ථාපනය/පරිවාස/සමාජ සුභසාධනය/නීතිය/ප්‍රජා පාදක විශෝධන ක්ෂේත්‍රයන් හි පළපුරුද්ද (පිළිගත හැකි ලේඛන මගින් තහවුරු කළ යුතුය.) | | 30 |
| | i. වසර 05 හෝ ඊට වැඩි නම් | 30 | |
| | ii. වසර 04 හෝ ඊට වැඩි නම් | 25 | |
| | iii. වසර 03 හෝ ඊට වැඩි නම් | 20 | |
| | iv. වසර 02 හෝ ඊට වැඩි නම් | 15 | |
| | v. වසර 01 හෝ ඊට වැඩි නම් | 10 | |
| | vi.මාස 06 හෝ ඊට වැඩි නම් | 05 | |
| 05 | පරිගණක හැකියාව : | | |
| | i.රජය මගින් පිළිගත් ආයතනයකින් මාස 12 නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් හදරා තිබීම. | 15 | 15 |
| | ii.මාස 09ට නොවැඩි හෝ මාස 06 නොඅඩු | 10 | |
| | iii.මාස 03ට වැඩි පරිගණක පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදරා තිබීම | 05 | |
| | iv.වෙනත් පරිගණක සහතික සඳහා | 03 | |
| | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | 05 |

10. අයදුම්පත්‍රය මේ සමග දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව විය යුතු අතර සෙ.මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදසිවල සකස් කළ යුතු වේ. අදළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ඉල්ලුම් පත්‍රය ලැබුණු බව දන්වනු නොලැබේ.

සැලකිය යුතුය :

i. සහතිකපත්වල මුල් පිටපත් ඉල්ලු අවස්ථාවලදී ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.
ii. රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතුය.
iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධ නිකුත් කර ඇති චක්‍රලේඛ හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුරු සඳහා අදළ වේ.

(මෙම ගැසට් නිවේදනයේ සිංහල,දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.)

________,
ආර්. පී. එස්. සමන්කුමාරි,
කොමසාරිස්,
ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ ප්‍රජා විශෝධන නිලධාරී II ශ්‍රේණියට බඳවා ගැනීම (විවෘත) - (2020)

01. පුද්ගලික තොරතුරු :

01. 1.1 සම්පූර්ණ නම (සිංහල/දෙමළ) :————.
1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි) :————.
02. 2.1 මුලකුරු සමග නම (සිංහල/දෙමළ) :————.
2.2 මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි) :————.
03. 3.1 ස්ථිර ලිපිනය (සිංහල/දෙමළ) :————.
3.2 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි) :————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
05. විවාහක/අවිවාහක බව :————.
06. ජාතික හැඳුනුම්පත් අංකය :————.
07. උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :————.
08. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස : අවු. :————. මාස. :————. දින :————.
09. දුරකථන අංකය :————.

02. දැනට දරන තනතුර පිළිබඳ විස්තර :

2.1 දැනට දරන තනතුර :————.
2.2 පත්වීම් දිනය :————.
3.3 පත්වීමේ ස්වභාවය (ස්ථිර, පරිවාස) :————.

03. අධ්‍යාපන සුදුසුකම් :

3.1 උපාධිය :————.
3.2 විශ්වවිද්‍යාලය :————.
3.3 උපාධිය ලද දිනය :————.

| *අනු. අංකය* | *සුදුසුකම* | *ආයතනය* | *සුදුසුකම ලද දිනය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

04. අතිරේක අධ්‍යාපන සුදුසුකම් :

| *අනු. අංකය* | *සුදුසුකම* | *ආයතනය* | *සුදුසුකම ලද දිනය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

05. වෘත්තීය සුදුසුකම් :

| *අනු. අංකය* | *සුදුසුකම* | *ආයතනය* | *සුදුසුකම ලද දිනය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

06. වෙනත් සුදුසුකම් :..........................................................................................
..........................................................................................
..........................................................................................

07. පළපුරුද්ද : ..........................................................................
..........................................................................
..........................................................................

08. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, මෙහි සඳහන් කරුණු සාවද්‍ය බව අනාවරණය වුවහොත්, ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමට ද, සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .......................... මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී ......... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

10. ප්‍රධානියාගේ සහතිකය :

.................................................... මහතා/මහත්මිය/මෙනවිය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම දෙපාර්තමේන්තුවේ/අමාත්‍යාංශයේ ස්ථිර සේවකයෙකු/සේවිකාවක වශයෙන් සේවය කරන බවත්, මෙම තනතුරට අදාලව ගැසට් පත්‍රයේ සඳහන් සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවත් ඔහුට/ඇයට විරුද්ධව කිසිඳු විනය ක්‍රියා මාර්ගයක් පවතින/නොපවතින බවත් මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ බලය
පවරනු ලැබූ නිලධාරියාගේ
අත්සන.

දිනය :————.
තනතුර :————.
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

12-201/1

---

**බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය**

## ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 නිලධර ගණය

**වැඩ පරීක්ෂක තනතුර සඳහා බඳවා ගැනීම (විවෘත) - 2019 (2020)**

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ වැඩ පරීක්ෂක III ශ්‍රේණියේ තනතුරෙහි ඌව, උතුරුමැද, වයඹ, උතුරු පළාත් තුළ පවතින පුරප්පාඩු 16ක් සඳහා සුදුස්සන් තෝරාගැනීම පිණිස සුදුසුකම් සහිත ශ්‍රී ලංකීක පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙළ කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ට පෙර **''කොමසාරිස්,**

**ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව, අංක 35ඒ ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත, බොරැල්ල, කොළඹ 08** '' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් සහ dcbcorrection@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනයට, විද්‍යුත් තැපැල් මගින් එවීම හෝ ඉහත ලිපිනයෙහි පිහිටා ඇති ප්‍රජා පාදක විශෝධන ප්‍රධාන කාර්යලය වෙත අතින් ගෙනවිත් භාර දිය යුතු ය. ලියාපදිංචි තැපෑලෙන් හා අතින් ගෙනවිත් භාරදීමේදී කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''**වැඩ පරීක්ෂක තනතුරු සඳහා බඳවා ගැනීම 2019 (2020)** යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු අතර විද්‍යුත් තැපැල් මගින් එවීමේදී විෂයයෙහි ( Subject) **"WS Recruitment 2019(2020)** ලෙස පැහැදිලිව සටහන් කළ යුතු ය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය : 2021 ජනවාරි 15 දින වේ.

**සටහන** : ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලෙන් නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට ලැබෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි හානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතු ය.

01. *තනතුරට පැවරෙන කාර්යයභාරය සැකෙවින්* : 1999 අංක 46 දරන ප්‍රජා පාදක විශෝධන පනතේ II වන කොටසෙහි දක්වන වරදක් සම්බන්ධයෙන් අධිකරණයෙන් වරදකරු වූ ප්‍රජා විශෝධන ආඥාලාභීන් විශෝධනය කිරීමේ ක්‍රියාවලියට අදාළව -

- ප්‍රජා විශෝධන රාජකාරී සඳහා ප්‍රජා විශෝධන නිලධාරියාට සහයවීම
- විශෝධන වැඩසටහන් සැලසුම් කිරීමට හා විශෝධන වැඩසටහන් පැවැත්වීමට සහයදීම
- ආඥාලාභීන් යොදවන ව්‍යාපෘති බිම්වලට ගොස් ඔවුන් ප්‍රජා විශෝධන නියෝග අනුව කටයුතු කරන්නේ දැයි සොයා බැලීම
- ප්‍රජා විශෝධන ආඥාලාභීන්ගේ නිවාස පරීක්ෂාවේ යෙදී ප්‍රතිකාර වැඩසටහන් සඳහා සහභාගීවීම සොයා බැලීම හා අවශ්‍ය පසු විපරම් සිදු කිරීම.
- නිසි ලෙස ප්‍රජා විශෝධන වැඩසටහන් සඳහා සහභාගී නොවන ආඥාලාභීන් පිළිබඳව නිවාස පරීක්ෂාවේ යෙදෙමින් සොයා බලා නැවත ඔවුන් විශෝධන ක්‍රියාවලියට යොමු කිරීම.

02. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :

ප්‍රජා පාදක නිශෝධන කොමසාරිස් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා දෙන ලකුණු මත තෝරා ගනු ලබයි. පත්වීම ක්‍රියාත්මක වන දිනය ප්‍රජා පාදක විශෝධන කොමසාරිස් විසින් තීරණය කරනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

i. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතිය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අයදුම්කරුවන් යටත් විය යුතු වේ. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

ii. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර, එම වසර තුන (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

iii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 1/2014 අනුව අනෙක් භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම වසර 05ක් තුළ දී ලබාගත යුතු ය. රාජ්‍ය භාෂාවකින් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් වසර 03ක් තුළ දී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳව ප්‍රවීණතාවය ලබාගත යුතු අතර, අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය වසර පහක් (05) ඇතුළත ලබාගත යුතුය. iii කාණ්ඩයට අයත් දෙවන රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය හෝ ඊට සමාන විෂය නිර්දේශය සහිත පැය 150ක පුහුණු පාඨමාලාවක් හැදෑරිය යුතු ය.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

04. *වැටුප් පරිමාණය* :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 අනුව MN - 1- 2016 ආරම්භක වැටුප් පියවර වේ. රු. 27,140-10x300-11 x 350-10 x 495-10 x660 - රු. 45,540.

05. *අධ්‍යාපන සුදුසුකම්* :

(අ) i. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව
ii. ගණිතය සහ
iii. තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

06. *පළපුරුද්ද* :

රජය විසින් පිළිගත් ආයතනයක සමාජ සේවා හා සමාජ වැඩ පිළිබඳව වසරක පළපුරුද්ද

07. *වයස් සීමාව* :

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 30ට නොවැඩි විය යුතු ය

08. *සුදුසුකම්* :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

අනෙකුත් සුදුසුකම් :

- අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
- අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සුදුසුකම සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

09. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය* :

ප්‍රජා පාදක විශෝධන කොමසාරිස් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලක් මගින් ලකුණු ලබාදීම සිදු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලද ලකුණුවල කුසලතාව මත පත් කිරීම කරනු ලැබේ.

සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීමේ ක්‍රමය : ලකුණු 100

| | විෂයය | ලකුණු |
|---|---|---|
| 01. | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 |
| 02. | ඉංග්‍රීසි භාෂා දැනුම | 20 |
| 03. | පරිගණක දැනුම | 25 |
| 04. | අතිරේක පළපුරුද්ද (මූලික සුදුසුකම වන වසරක පළපුරුද්දට අමතරව) | 30 |
| 05. | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අනුමැති පරිදි නායකත්වය, පෞරෂය හා සන්නිවේදන කුසලතා | 05 |
| 06. | එකතුව | 100 |

10. අයදුම්පත්‍රය මේ සමග දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල විය යුතු අතර, සෙ. මී. 22 - 29 ප්‍රමාණයේ A4 කඩදාසි වල සකස් කළ යුතු වේ. අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිළිව ඇතුළත් කළ යුතු ය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන මූලික සුදුසුකම් නොමැති හා නියමිත දිනට පසුව ලැබෙන හා ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්

පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදල ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ඉල්ලුම්පත්‍රය ලැබුණු බව දන්වනු නොලැබේ.

**සැළකිය යුතු ය :**

i. සහතික පත්වල මුල් පිටපත් ඉල්ලූ අවස්ථාවල දී ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.
ii. රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතු ය.
iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධව නිකුත් කර ඇති චක්‍රලේඛ හා ඊට සිදු කර ඇති සංශෝධනයන් හි කොන්දේසි මෙම තනතුර සඳහා අදල වේ.

(මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.)

ආර්. පී. එස්. සමන්කුමාරි,
කොමසාරිස්,
ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා [ ]

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ වැඩ පරීක්ෂක III ශ්‍රේණිය තනතුරට බඳවා ගැනීම - 2019 (2020)

01. පුද්ගලික තොරතුරු :
1. සම්පූර්ණ නම (සිංහල/දෙමළ) :————.
සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්) :————.
2. මුලකුරු සමග නම (සිංහල/දෙමළ) :————.
මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්) :————.
3. ස්ථිර ලිපිනය (සිංහල/දෙමළ) :————.
ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි) :————.
4. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
5. විවාහක/අවිවාහක බව :————.
6. ජාතික හැඳුනුම්පත් අංකය :————.
7. උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :————.
8. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස : අවු. :————. මාස. :————. දින :————.
9. දුරකථන අංකය :————.

02. අධ්‍යාපන සුදුසුකම් :

2.1 අ. පො. ස. (සා. පෙළ) විභාග ප්‍රතිඵල :
(1) විභාග වර්ෂය :————.
(2) විභාග අංකය :————.
(3) විභාග ප්‍රතිඵල :————.

| විෂය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

2.2 අ. පො. ස. (උ. පෙළ) විභාග ප්‍රතිඵල :
(1) විභාග වර්ෂය :————.
(2) විභාග අංකය :————.
(3) විභාග ප්‍රතිඵල :————.

| විෂය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 3. | |
| 2. | | 4. | |

03. සමාජ සේවා/සමාජ වැඩ පිළිබඳ පළපුරුද්ද :.....................................................................................
..........................................................................................................
..........................................................................................................

04. වෙනත් සුදුසුකම් :.......................................................................................................
..........................................................................................................
..........................................................................................................

05. ඉල්ලුම්කරුගේ ප්‍රකාශය :

මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් මෙහි ඇතුලත් තොරතුරුවලින් යම්කිසි තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමටද මෙම තනතුරට මා පත් කර ගැනීමෙන් පසුව එම වරද දැනගන්නට ලැබුණහොත් කිසිම වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වන බව මා දනිමි. එසේම මා තෝරාගනු ලැබුවහොත් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා මාගේ කැමැත්ත මෙයින් ප්‍රකාශ කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

06. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති ........................... නැමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් තබන ලද බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.
සහතික කරන්නාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————. (නිල මුද්‍රාව තබන්න)

07. රාජ්‍ය සේවයේ/පළාත් සේවයේ සේවකයකුනම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

..................................................... මහතා/මහත්මිය/මෙනවියගේ ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ/ස්ථිර /තාවකාලික/අනියම්/සේවකයෙකු/සේවිකාවක වශයෙන් සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න)

දිනය :————.

12-201/2

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

කෘෂිකර්ම අමාත්‍යාංශය

**පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ III වන ශ්‍රේණියේ පශු වෛද්‍ය නිලධාරි තනතුරු සඳහා බඳවා ගැනීම - 2020

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ III වන ශ්‍රේණියේ පශු වෛද්‍ය නිලධාරි තනතුරෙහි පවත්නා පුරප්පාඩු එකසිය දහනවයක් (119) සඳහා පත්කිරීමට සුදුසුස්සන් තෝරා ගැනීම සඳහා සුදුසුකම්ලත් පශු වෛද්‍ය විද්‍යා උපාධිධාරීන්ගෙන්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ.පෙ.13, ගැටඹේ, පේරාදෙණිය යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස කෙළවරේ, "ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ III වන ශ්‍රේණියේ පශු වෛද්‍ය නිලධාරි තනතුර " යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2021.01.08 දිනය වේ.

**සටහන :** ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය. මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

I. පශු වෛද්‍ය නිලධාරි තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශු වෛද්‍ය පීඨය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන කුසලතා ලේඛනය මත බඳවා ගනු ලැබේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෙනත් විශ්වවිද්‍යාලයකින් පශු වෛද්‍ය උපාධි සුදුසුකම් ලබා ගන්නා අයදුම්කරුවන් ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචිය සඳහා සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන වසරට අදාළව ලියාදපදිංචි දිනය අනුව අනුපිළිවෙලින්, කුසලතා ලේඛනයේ අවසානයට ඇතුළත් කරනු ඇත.

II. පුරප්පාඩු සංඛ්‍යාවෙන් සියයට එකසිය දහයක (110%) කට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, කුසලතා ලේඛනයේ අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගැනීම සිදු කෙරේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමක් සිදු නොකෙරේ.

III. පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

02. *සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

ii. තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ පශු වෛද්‍ය නිලධාරි තනතුරක පුරප්පාඩු පිරවීම සඳහා පත්කරනු ලැබේ.

iii. තනතුරට පත් කරනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 අනුව හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවක් ලබා ගත යුතු වේ. ඔබගේ බඳවාගැනීම මාධ්‍යය වනුයේ ඔබ විසින් උපාධිය සම්පූර්ණ කරන ලද මාධ්‍යය වේ.

iv. සෙසු සේවා නියමයන් සහ සේවා කොන්දේසි 2013.12.31 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ හා වරින් වර නිකුත් කරන ලද සංශෝධන නියමයන් වලටද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද , රජයේ මුදල් රෙගුලාසි වලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලටද මෙම පත්වීම යටත් වේ.

03. *වැටුප් පරිමාණය :*

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාල මාසික වැටුප් පරිමාණය රු. 47,615 - 10 x 1335 - 8 x 1630 - 17 x 2170 - 110,895/- (SL-1-2016) වේ.

04. *අධ්‍යාපන සුදුසකම් :*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධියක්

05. *වයස් සීමාව :*

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

06. *කායික සුදුසුකම්* :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු අතර, මනා ශරීර සෞඛ්‍ය තත්ත්වය වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මඟින් සනාථ විය යුතුය.

07. *වෙනත් සුදුසුකම්* :

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
iii. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචිය තිබීම ඇතුළුව මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සෑම ආකාරයෙකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

08. *සම්මුඛ පරීක්ෂණය* :

8.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : (ලකුණු ලබා දෙනු නොලැබේ.) සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේ දැයි පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම.

09. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

i. ඉල්ලුම් පත්‍රය සෙ.මී.22-29 ප්‍රමාණයේ A4 කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් ආදර්ශ අයදුම්පත අනුව සකස් කළ යුතුය.

ii. සම්මුඛ පරීක්ෂණය සඳහා දැනුම් දුන් විට පහත සඳහන් ලියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

a) උප්පැන්න සහතිකය
b) උපාධිය හා අදාළ වෙනත් සහතික
c) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (මින් එකක් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීන්ගෙන් ලබාගත් හා ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කළ යුතුය.)
d) සිංහල / දෙමළ හා ඉංග්‍රීසී භාෂාවන්ගෙන් සමත් වූ උසස්ම විභාගවල සහතික
e) පශු වෛද්‍යවරයෙකු වශයෙන් ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීමේ සහතිකය

10. *වෙනත් විධිවිධාන* :

i. මෙම ගැසට් නිවේදනයේ විධිවිධාන පනවා නොමැති කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වනු ඇත.

ii. පුරප්පාඩු පිරවීම නොපිරවීම හෝ කොටසක් පමණක් පිරවීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

iii. මෙම ගැසට් නිවේදනය සිංහල, දෙමළ, ඉංග්‍රීසී භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨ බල පැවැත්විය යුතුය.

iv. අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු වනු ඇත.

v. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇතිනම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

සුමේධ පෙරේරා ඩබ්ඩබ්වී ආර්ඩබ්පී
ආර්එස්පී යූඑස්පී එන්ඩියු
මේජර් ජනරාල් (විශ්‍රාමික)
ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය

ආදර්ශ අයදුම්පත

**ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ III ශ්‍රේණියේ**
**පශු වෛද්‍ය නිලධාරි තනතුරු පුරප්පාඩු සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ**
**අයදුම්පත**

| |
|---|
| |

(කාර්යාල ප්‍රයෝජනය සඳහා)

01. (i) මුලකුරු සමඟ නම :
සිංහලෙන් :————.
ඉංග්‍රීසියෙන් (ඉංග්‍රිසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |

(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රිසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |

02. ජාතික හැඳුනුම්පත් අංකය ෘ

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

03. තැපැල් ලිපිනය :—————.
(ලිපිනයෙහි යම් වෙනසක් සිදු වුවහොත් , වහාම ඒ බව දැනුම් දිය යුතු ය.)

04. ස්ථිර පදිංචි ස්ථානය අයත්,
(i) පළාත් සභාව :—————.
(ii) දිස්ත්‍රික්කය :—————.

05. උපන් දිනය ෘ වර්ෂය :—————. මාසය :—————. දිනය :—————.
අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස ෘ
වර්ෂ :—————. මාස :—————. දින :—————.

06. (අ) ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද යන වග :—————.
(ආ) ජාතිය (සිංහල/ශ්‍රී ලාංකික ද්‍රවිඩ/ඉන්දියානු ද්‍රවිඩ/මුස්ලිම්/වෙනත්) :—————.

07. (අ) ස්ත්‍රී / පුරුෂ භාවය :—————.
(ආ) විවාහක / අවිවාහක / වැන්දඹු ද යන වග :—————.

08. අධ්‍යාපන සුදුසුකම් ෘ

| සමත් වූ උපාධිය / පශ්චාත් උපාධි සුදුසුකම | පන්තිය | විශ්වවිද්‍යාලය | වර්ෂය |
|---|---|---|---|
| | | | |

09. ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංකය හා දිනය :—————.

10. සේවා විස්තර (දැනට ස්ථිර තනතුරක් දරන්නේ නම්)

| දැනට දරණ තනතුර | සේවා කලය | | සේවා ස්ථානය | දෙපාර්තමේන්තුව / පළාත් සභාව |
|---|---|---|---|---|
| | සිට | දක්වා | | |
| | | | | |

11. මෙම ඉල්ලුම්පත්‍රයෙහි මවිසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු සත්‍යවුත්, නිවැරදිවූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි ඒවා බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සෙකු වීමට යටත් වන බවත්, පත්කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මා කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් මම දැන සිටිමි. මම කිසිදු උසාවියකින් සාපරාධී වරදකට වැරදිකරුවකු වී නොමැති බවද මගේ සුපුරුදු අත්සන තබා මින් සහතික කරමි.

—————,
අයදුම්කරුගේ අත්සන

දිනය :—————.

(දැනට ස්ථිර තනතුරක් දරණ අපේක්ෂකයින්ට පමණක් අදාළ වේ.)

ඉහත අයදුම්කරු වූ ................................ මහතා / මිය / මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ / ................................ පළාත් සභාවේ ....... ............................ තනතුරක් දරණ නිලධාරිවරයකු බවත්, ඉල්ලුම්පත්‍රයේ සඳහන් තොරතුරු ඔහුගේ / ඇයගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදි බවත් සහතික කරමි.මෙම තනතුර සඳහා මෙම නිලධාරියා තේරී පත්වුවහොත් ඔහු / ඇය මෙම දෙපාර්තමේන්තුවෙන් / පළාත් රාජ්‍ය සේවයෙන් මුදා හැරීමට හැකි / නොහැකි බවත් දන්වමි. (අදාළ නොවන වචන කපා හරින්න.)

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා
(නිල මුද්‍රාව)

දිනය :—————.
ලිපිනය :—————.

12-545

**වාරිමාර්ග අමාත්‍යාංශය**

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ III ශ්‍රේණියේ තනතුරු**

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ III ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

මීට යාකර ඇති අයදුම් පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2021.01.11 දින හෝ ඊට පෙරාතුව ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් කොළඹ 07, අංක 230, බෞද්ධාලෝක මාවත, වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබෙනසේ එවිය යුතුය

මෙම දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

1. අයදුම්පත බහාලන ලියුම් කවරයේ උඩ වම්පස කෙළවරේ "වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ III ශ්‍රේණියේ තනතුරු'' යනුවෙන් සඳහන් කළ යුතුය.

2. *වැටුප් ක්‍රමය* .- පුහුණුවීම් කාලය සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසු මෙම තනතුර සඳහා මාසික ඒකාබද්ධ වැටුප් ප්‍රමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි MN3 වැටුප් ක්‍රමය වන රු. 31,040 – 10x445-11x660-10x730-10x750-රු. 57,550 වේ. (රු. 32,375/- වාර්ෂික වැටුප් පියවරට පූර්වයෙන් කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් ඇත.)

3. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය.

(ආ) 2021.01.11 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 30 ට වැඩි නොවිය යුතුය. (පළාත් හා රාජ්‍ය සේවයේ නියුතු සේවකයින් කෙරෙහි ඉහත වයස් සීමාව බලපාන්නේ නැත.)

(ඇ) මනා චරිතයකින් යුක්ත විය යුතුය.

(ඈ) යහපත් සෞඛ්‍ය තත්වයෙන් යුතු අයෙකු විය යුතුය. ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු බවට රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් සහතික කළහැකි වන පරිදි වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීම අවශ්‍යය.

(ඉ) පහත සඳහන් I, II, III, IV, V, VI, VII, VIII යටතේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිය යුතුය.

I සිංහල / දෙමළ, ඉංග්‍රීසි භාෂාවල ගණිතය සහ විද්‍යාව විෂයයන්ට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් (06) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම;

සමඟ

පැරණි විෂය නිර්දේශය අනුව භෞතික විද්‍යාව, ශුද්ධ ගණිතය, ව්‍යවහාර ගණිතය හා රසායනික විද්‍යාව යන ක්ෂේත්‍රයන්ට අදාළ විෂයයන්ගෙන් එක්වරකදී අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත්වීම;

හෝ

නව නිර්දේශය අනුව උසස් ගණිතය හෝ සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව හා රසායනික විද්‍යාව, යන ක්ෂේත්‍රයන්ට අදාළ විෂයයන් තුනකින් (03) එකවර අ.පො.ස.(උසස් පෙළ) විභාගය සමත්වීම.

II. සිංහල/දෙමළ, ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් විෂයයන් එකකට සම්මාන සමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම;

සමඟ

පැරණි විෂය නිර්දේශය අනුව භෞතික විද්‍යාව, ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය හා රසායනික විද්‍යාව, යන ක්ෂේත්‍රයට අදාළ විෂයයන්ගෙන් එක් වරකදී අ.පො.ස. (උ.පෙළ) විභාගය සමත්වීම;

හෝ

නව නිර්දේශය අනුව උසස් ගණිතය හෝ සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව, යන විෂයයන් තුනකින් එක්වරකදී අ.පො.ස. (උ.පෙළ) විභාගය සමත්වීම;

සමඟ වෘත්තීය සුදුසුකම්

III. ගල්ගමුව, කොත්මලේ වාරිමාර්ග අධ්‍යාපන ආයතනයක වාරිමාර්ග ඉංජිනේරු ඩිප්ලෝමාව හදරා සහතිකය ලබා තිබීම;

හෝ

IV. මොරටුව කටුබැද්ද විශ්වවිද්‍යාලයේ ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල් ඉංජිනේරු) හදාරා සහතිකය ලබා තිබීම;

හෝ

V. මට්ටක්කුලිය ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය මගින් පවත්වනු ලබන උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල් ඉංජිනේරු) හදාරා තිබීම;

හෝ

VI. කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය මගින් පවත්වනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (සිවිල් ඉංජිනේරු) හදාරා සහතිකය ලබා තිබීම;

හෝ

VII. විවෘත විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන තාක්ෂණික ඩිප්ලෝමා (සිවිල් ඉංජිනේරු) සහතිකය ලබා තිබීම;

හෝ

VIII. විශ්වවිද්‍යාල කොමිෂන් සභාව හෝ තෘතීයික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඉහත පාඨමාලාවන්ට සමාන පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.

මෙම පාඨමාලා N.V.Q. 6 මට්ටම විය යුතුය.

**සටහන:-** පාඨමාලාව සම්පූර්ණ කර ඇති එහෙත් සහතිකය ලබා නොමැති අයදුම්කරුවන්ට ද අයදුම් කළ හැකි අතර ඔවුන් එකී සහතිකය සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. නමුත් සහතිකයේ බලාත්මක දිනය ඉල්ලුම් පත් කැඳවීමේ අවසාන දිනට පෙර විය යුතුය.

4. *බඳවා ගැනීමේ ක්‍රමය :*

(අ) සියලුම බඳවා ගැනීම් 15/90 අනුව දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාර සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව සිදුකරනු ඇත.

(ආ) I. ඉහත 3 (ඉ) I යටතේ සඳහන් සුදුසුකම් සහිතව බඳවා ගන්නා ලද ආධුනිකයින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ඇති ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනයේ නේවාසිකව පවත්වනු ලබන වර්ෂ දෙකක (02) න්‍යායාත්මක හා එක් වර්ෂයක (01) ප්‍රායෝගික වශයෙන් වර්ෂ තුනකින් (03) සමන්විත පූර්ණකාලීන පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසුව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනය මගින් පිරිනමනු ලබන වාරිමාර්ග ඉංජිනේරු ඩිප්ලෝමා සහතිකය ලැබීමට සුදුසුකම් ලබති.

II. නියමිත විභාග වලින් අසමත්වන වාරිමාර්ග ආධුනිකයින්ට එසේ අසමත් වූයේ වැඩ කටයුතු පැහැර හැරීම, උනන්දුව නැතිවීම හෝ අයහපත් පැමිණීම නිසා නොවේ නම් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි ඔවුන්ගේ පුහුණුව මාස 06 කට නොවැඩි කාලපරිච්ඡේදයකින් දීර්ඝ කරවා ගැනීමට ඉඩ ප්‍රස්ථාව ඇත. අසමත් වූ ආධුනිකයින් එසේ දීර්ඝ කරන ලද පුහුණුවීමේ කාලපරිච්ඡේදය අවසානයේදී ඔවුන් සඳහා පවත්වන අවසාන විභාගය ඇතුළු නියමිත විභාග සියල්ලම සමත්විය යුතුය. එම විභාගය ද අසමත්වන ආධුනිකයින්ගේ සේවය අවසන් කරනු ලැබේ.

III. පුහුණු කාලය තුළදී ආධුනිකයින් යටත් පිරිසෙයින් දේශනවලින් 80% කටවත් සහභාගිවී සතුටුදායක පුහුණුවීම් වාර්තාවක් ඉදිරිපත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. අවශ්‍ය අවම පැමිණීම හා සතුටුදායක පුහුණුවීමේ වාර්තාවක් නැති යම් කිසි ආධුනිකයෙක් වෙතොත් නියමිත විභාගයට පෙනී සිටීමට ඉඩ නොදෙන අතර පුහුණුව ද අවසන් කරනු ලැබේ.

IV. ඉහත 3 (ඉ) II, III, IV, V, VI, VII,VIII යටතේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් සහිතව බඳවා ගන්නා ලද ආධුනිකයින් දේශන හා ප්‍රායෝගික පුහුණුව ද ඇතුලත් වනසේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන හය මසක (06) පුහුණුවකින් පසුව පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයකින් සමත්විය යුතුය.

(v) මෙම අභ්‍යාසලාභීන් ලබා ඇති එක් වසරක ක්ෂේත්‍ර පුහුණුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව තුල සාර්ථකව ලබාගෙන ඇත්නම් බඳවා ගැනීමෙන් පසුව ආධුනිකයින් ලැබිය යුතු හය මසක (06) පුහුණු කාලසීමාවෙන් නිදහස් කරනු ලබන අතර ඔවුන් සියලු දෙනාම ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.

(ඇ) සියලුම දේශන හා පුහුණු පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

(ඈ) පුහුණුව සාර්ථකව අවසාන කරන අයවලුන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ III ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ.

5. *සේවා කොන්දේසි :*

(අ) මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් අයකරනු ලැබේ.

(ආ) අයදුම්කරුවන් ප්‍රථම වශයෙන් වාරිමාර්ග ආධුනිකයන් වශයෙන් බඳවා ගැනේ.

(ඇ) වාරිමාර්ග ආධුනිකයින් සඳහා 3 (ඉ) I සුදුසුකම් සහිතව බඳවා ගනු ලැබූ වාරිමාර්ග අධුනිකයින් හට එම පුහුණුව ලබන කාලය තුලදී පහත සඳහන් පරිදි දීමනාවක් ගෙවනු ලැබේ.

පළමු වසර සඳහා මසකට රු.27140/- බැගින්,
දෙවන වසර සඳහා මසකට රු.27440/- බැගින්,
තුන්වන වසර සඳහා මසකට රු.27740/- බැගින්,

3 (ඉ) II, III, IV, V, VI, VII, VIII සුදුසුකම් සහිතව බඳවා ගන්නා ලද ආධුනිකයින්ට ඔවුන්ගේ 06 මසක පුහුණු කාලය තුලදී මසකට රු. 27740/- බැගින් දීමනාවක් ගෙවනු ලැබේ.

මෙම දීමනාව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ අවසරය පරිදි දීර්ඝ කරනු ලබන පුහුණුවීමේ කාලපරිච්ඡේදයෙහි දී ලැබීමට හිමිකම් ඇත. වෙනත් වරප්‍රසාද හෝ හිමිකම් කිසිවක් නොලැබේ.

(ඈ) වාරිමාර්ග ආධුනිකයින් ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට හා රජය මගින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසිවලට යටත්විය යුතුය. පුහුණුව ලබන කාලසීමාව තුලදී ඔවුනට නිවාඩු හෝ නිවාඩු දුම්රිය බලපත් ලැබීමට හිමිකම් නැත.

(ඉ) මෙම පත්වීම් ආධුනික කාලය සම්පූර්ණ කරනු ලදුව III ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර විධිමත් පත්වීම් භාරගත් දින සිට අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

(ඊ) මෙම සේවය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10-12 දක්වා වගන්තිවල විධිවිධාන අදාල වේ.

(උ) ඉහත 3 (ඉ) I යටතේ තෝරා ගන්නා ලද අයදුම්කරුවන් වසර 05 ක අනිවාර්ය සේවා කාලයක් ඉංජිනේරු සහකාර තනතුරේ සේවය කරන බවට ගිවිසුමකට අත්සන් කළයුතුය. ඊට පෙර සේවයෙන් ඉවත්වීමට අවශ්‍ය වුවහොත් ගිවිසුමේ සඳහන් මුදල රජයට ගෙවිය යුතුය.

6. අයදුම්කරු අයදුම්පත්‍රය සමඟ පහත දැක්වෙන සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතුය. :-

I. ලබාගෙන ඇති තාක්ෂණික සහතිකයන්
II. අ.පො.ස. (උ.පෙළ) සහතික පත්‍රය
III. අ.පො.ස. (සා.පෙළ) සහතික පත්‍රය
IV. රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ උප්පැන්න සහතිකය
V. මෑතකදී ලබාගත් චරිත සහතික තුනක් (මින් එක් සහතිකයක් අවසන් වරට ඉගෙන ගත් පාසලෙන් හෝ විද්‍යාලයේ විදුහල්පතිගෙන් සහ තවත් සහතිකයක් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරියාගෙන් විය යුතුය).

**සටහන.-** ඉහත සඳහන් සහතිකවල පිටපත් ආපසු දෙනු නොලැබේ.

7. පළාත් සහ රාජ්‍ය සේවාවන්හි නියුතු සේවකයින් ඔවුන්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානින් මාර්ගයෙන් එවිය යුතුය.

8. අයදුම්කරුවන් කොළඹ දිස්ත්‍රික්කයේ හෝ තෝරාගත් දිස්ත්‍රික්ක කිහිපයකදී හෝ පැවැත්වෙන ලිඛිත විභාගයකට සහ කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයට ඔවුන්ගේම වියදමින් පෙනී සිටිය යුතුය. මෙම විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීම පිළිබඳ අවසන් තීරණය වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් සතුය.

9. සේවා අවශ්‍යතාවය මත ඕනෑම අවස්ථාවක දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ඔවුන් සූදානමින් සිටිය යුතුය. දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම් වැඩබිම් බොහෝ විට ප්‍රවාහන හා නවාතැන් පහසුකම් අඩු දුෂ්කර ප්‍රදේශවල පිහිටා ඇති බව අයදුම්කරුවන් වටහා ගතයුතුය. තෝරා ගන්නා ලද අයදුම්කරුවන් විශේෂයෙන් පහත සඳහන් සේවා ස්ථානවලට අනුයුක්ත කරන අතර එම සේවා ස්ථානවල අවම වශයෙන් අවුරුදු 05 ක් සේවය කළ යුතුය. එම සේවා ස්ථානවල සේවය කිරීමට අකමැත්තක් දක්වන අය ඉල්ලුම්පත් ඉදිරිපත් නොකළ යුතුය. එම සේවා ස්ථාන අම්පාර, පොතුවිල්, කල්මුනේ, අක්කරපත්තුව, මහඔය, පදවිය, රාජාංගනය, හුරුලුවැව, මාපකඩ, බදුල්ල, කන්දකැටිය, නවකිරි, රුගම්, තිස්ස, වීරකැටිය, හම්බන්තොට, වැල්ලවාය, වේලිඔය, බිබිල, මොනරාගල, පොලොන්නරුව, කවුඩුල්ල, ඇලහැර, ඉගිනිමිටිය, පුත්තලම, මූතූර්, කන්තලේ, මොරවැව, මුරුක්කන්, වව්නියාව, සිලාවතුර වැනි වාරිමාර්ග කොට්ඨාශ සහ ව්‍යාපෘති කාර්යාල වේ.

10. අයදුම්පතේ සඳහන් කර ඇත්තාවූ යම් අසත්‍ය තොරතුරක් බඳවාගැනීමට පෙර අනාවරණය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. එබඳු අසත්‍ය තොරතුරක් බඳවා ගැනීමෙන් අනතුරුව අනාවරණය වුවහොත් ඔහුගේ සේවය අවසන් කෙරෙනු ඇත. මීට අමතරව අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට එරෙහිව නීති මගින් දඬුවම් ලබාදීමට සිදුවනු ඇත.

11. රජයේ තනතුරුවලට පත් කරනු ලැබීම සම්බන්ධයෙන් බලපැවැත්වෙන රීති සහ රෙගුලාසි සඳහා *ශ්‍රී ලංකා රජයේ ගැසට් පත්‍රයේ* I කොටසේ II (අ) ඡේදය කෙරෙහි අවධානය යොමු කෙරේ.

12. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක.1589/30 හා 2009.02.20 දිනැති *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශිත කාර්යපටිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

13. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක. 2013/31 දරන 2017.04.07 දිනැති අතිවිශේෂ *ගැසට් පත්‍රයේ* සඳහන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය සහ එයට වරින් වර කරනු ලබන සංශෝධන වලට අනුව ඔබගේ පත්කිරීම්, ශ්‍රේණි උසස් කිරීම, සේවා කොන්දේසි ආදිය රඳාපවතිනු ඇත.

14. ඉහත අංක 13 හි සඳහන් සේවා ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

15. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්වේ.

ඉංජි. කේ.ඩී. නිහාල් සිරිවර්ධන,
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්.

2020 දෙසැම්බර් මස 11 වන දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
අංක.230, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

අයදුම්පත්‍රය

**වාරිමාර්ග අමාත්‍යාංශය**

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ III ශ්‍රේණියේ තනතුරු**

1. (අ) සම්පූර්ණ නම : ……………………………………………………………..………..
(සිංහලෙන්)

(ආ) සම්පූර්ණ නම : ………………………………………………………………………
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(ඇ) මුලකුරු සමඟ නම : …………………………………………………………………….
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

2. ස්ත්‍රී/පුරුෂ භාවය ඃ

3. (අ) ලිපිනය ඃ ……………………………………………………………………..
(සිංහලෙන්)

(ආ) ලිපිනය ඃ ……………………………………………………………………..
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(ඇ) ස්ථිර පදිංචි ලිපිනය ඃ ……………………………………………………………………..

(ඈ) දුරකථන අංකය ඃ නිවස ඃ …………………………..
ජංගම ඃ …………………………..

(ඉ) විද්‍යුත් තැපැල් ලිපිනය ඃ ……………………………………………………………..

4. පදිංචි දිස්ත්‍රික්කය ඃ……………………………………………………………………..................………..

5. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නම ඃ ………………………….............................................

6. උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණන්න)

(අ) අවුරුද්ද ඃ …………… මාසය ඃ ………… දිනය ඃ ……………

(ආ) උපන් ස්ථානය ඃ ………………………

(ඇ) 2021.01.11 දිනට වයස ඃ
අවුරුදු ඃ …………… මාස ඃ …………… දින ඃ ……………

7. ජාතික හැඳුනුම්පත් අංකය ඃ ………………………........................

8. ඔබ ශ්‍රී ලාංකිකයෙක් ද ? ඔව් / නැත
ජාතිය ඃ

| | | | |
|---|---|---|---|
| සිංහල | ☐ | මුස්ලිම් | ☐ |
| ශ්‍රී ලංකා ද්‍රවිඩ | ☐ | වෙනත් | ☐ |
| ඉන්දියානු ද්‍රවිඩ | ☐ | | |

9. අධ්‍යාපන සුදුසුකම්ඃ- (සහතිකවල පිටපත් අමුණන්න)

9.1 අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය ඃ

විභාග අංකය :————. අවුරුද්ද :————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |
| 6. | |
| 7. | |
| 8. | |
| 9. | |
| 10. | |

9.2 අ.පො.ස.(උසස් පෙළ) විභාගය ：

විභාග අංකය :————.    අවුරුද්ද :————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

10. තාක්ෂණික සුදුසුකම්:- (සහතිකවල පිටපත් අමුණන්න)

………………………………… පාඨමාලාව හා තාක්ෂණ ආයතනයේ නම සඳහන් කරන්න)

11. ඔබ කලින් රජයේ දෙපාර්තමේන්තුවක හෝ පළාත් රාජ්‍ය සේවයේ සේවය කොට සේවය අතහැර ගියේද/අස්වූයේද/සේවය නතර කරනු ලැබුවේද/සේවයෙන් පහකරනු ලැබුවේද? එසේ නම් ඊට හේතු ：…………………........................................

12. ඔබ දැනට රැකියාවක යෙදී ඇත්නම් ඒ පිළිබඳ විස්තර ：…………………………………………………………

(අ) තනතුර ： …………………………………………………………
(ආ) ආයතනය ：…………………………………………………………
(ඇ) පත්වීම් ලද දිනය ：……………………………
(ඈ) පත්වීමේ ස්වභාවය ： (ස්ථිර / තාවකාලික / අනියම්) ……………………………

13. මෙම අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව හෝ තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා මෙම තනතුර සඳහා නුසුදුස්සකු බවට පත්වන බවත් පත් කිරීමෙන් පසු එවැනි දෑ අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මෙයින් දැනුම් දෙමි.

දිනය ： ……………………    ……………………………,
අයදුම්කරුගේ අත්සන.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය (රජයේ දෙපාර්තමේන්තුවක/පළාත් රාජ්‍ය සේවයක අයදුම්කරුවන් සඳහා පමණි)

…………………………… මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු බවත් ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවත් මෙම තනතුර අයදුම් කිරීම සඳහා නියමිත අවශ්‍යතාවයන් සහ කොන්දේසි වලට අනුකූල බවත් මම මින් සහතික කරමි. ඔහු/ඇය තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් වැඩිදුරටත් සඳහන් කිරීමට රිසියෙමි.

……………………………,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

නම ：- ……………………….....……
තනතුර ：-……………………………
ලිපිනය ：-……………………………
දිනය ：-………………………..……..

12-369

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

### 2021 පළමු අර්ධ වර්ෂයට ආධුනිකයින් බඳවාගැනීම සඳහා අයදුම් කිරීම

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ දිවයින පුරා පිහිටි ජාතික වෘත්තීය පුහුණු ආයතන, දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයන්හි හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක අනෙක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ආයතනවල වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා 2021 පළමු අර්ධ වර්ෂයට ආධුනිකයින් බඳවා ගැනීම දැන් ආරම්භ කර තිබේ. එම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයන්හි ක්‍රියාත්මක NVQ (ජාතික වෘත්තිය සුදුසුකම්) පාඨමාලා හා NVQ නොවන පාඨමාලා සංකේත අංක යටතේ පහත දක්වා තිබේ. NVQ මට්ටම හා පාඨමාලා කාලය ද සඳහන් කර ඇත. වෘත්තීය පුහුණු අධිකාරියේ සියලුම පූර්ණකාලීන පාඨමාලා නොමිලේ හැදෑරිය හැකිය.

පාඨමාලා සඳහා අයදුම් කිරීම :

දිස්ත්‍රික් මට්ටමින් හා ජාතික වෘත්තීය පුහුණු ආයතනවල ලිපිනය හා ක්‍රියාත්මක පාඨමාලා සංකේත අංක යටතේ පහත දක්වා තිබෙන අතර ඔබ කැමති පාඨමාලාවක් තෝරාගෙන අදාළ දිස්ත්‍රික්කයට/ජාතික වෘත්තීය පුහුණු ආයතනයට ලියාපදිංචි තැපෑලෙන් අයදුම්පතක් යොමුකළ යුතුය. මේ සමඟ ඉදිරිපත් කරන ආදර්ශ අයදුම්පත්‍රයට අනුව යොමුකළ යුතුය. ඔබ විසින් අයදුම්පත යොමු කරන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ "2021 - I පාඨමාලා සඳහා අයදුම් කිරීම " යනුවෙන් සඳහන් කළ යුතුය.

| | | |
|---|---|---|
| පාඨමාලා ආරම්භය | - | 2021 ජනවාරි 04 |
| වැඩි විස්තර සඳහා - | | |
| දුරකතන අංක | - | 011-7277888 |
| | | 011-7270270 |
| | | 011-2352185 |
| | | 011-2352160 |
| | | 011-2555407 |
| ෆැක්ස් අංකය | - | 011-2502342 |
| ඊ-මේල් ලිපිනය | - | cgjp@vtasl.gov.lk |
| වෙබ් ලිපිනය | - | www.vtasl.gov.lk |
| ෆේස්බුක් පිටුව | - | www.facebook.com.vta |

දමිත වික්‍රමසිංහ,
සභාපති/ප්‍රධාන විධායක නිලධාරි,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය,
4 වන මහල, නිපුණතා පියස,
ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05.

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියෙන් ඔබට ලැබෙන ප්‍රතිලාභ :

- නිපුණතා පාදක පුහුණුව (CBT) යටතේ පාඨමාලා හැදෑරීම
- ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ) මට්ටම 03 හා 04 ලබා ගැනීමෙන් පසු ඩිප්ලෝමා හා තාක්ෂණ උපාධිය ලබාගැනීමේ අවස්ථාව
- විශේෂ වූ පාඨමාලා කිහිපයක් සඳහා මාසික දීමනාවක්
- සහනදායී මුදලකට ලංගම ප්‍රවේශ පත්‍ර

- වෘත්තීය උපදේශන සේවාව හා වෘත්තීය ඉංග්‍රීසි දැනුම
- ව්‍යවසායකත්ව දැනුම
- ශිල්පීය ප්‍රවර්ධන දැනුම
- මාසික දීමනාවක් සමඟින් වැඩිපුර පුහුණුව
- රජයේ පිළිගත් සහතිකයක්
- විදේශීය රැකියා සඳහා යොමු කිරීම
- ස්වයං රැකියා සඳහා යොමු කිරීම
- කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමට අවශ්‍ය ව්‍යවසායකත්ව පුහුණුව සමඟ ණය පහසුකම් සඳහා යොමු කිරීම
- ව්‍යාපාර උපදේශන සේවා
- ක්ෂේත්‍රයේ ශිල්පීය නිපුණතාවය වර්ධනය කිරීමේ වැඩමුළු මඟින් දැනුම යාවත්කාලීන කිරීම
- වෘත්තීය අධ්‍යාපනය තුළින් කාර්මික ක්ෂේත්‍රයේ උපාධියක් ලබා ගැනීමේ අවස්ථාව.

ආදර්ශ අයදුම් පත්‍රය

**ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය**

*2021 පළමු අර්ධ වර්ෂය සඳහා ආධුනිකයන් බඳවා ගැනීම*

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. පදිංචිය :————.
   i. ග්‍රාමසේවා වසම :————.
   ii. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
   iii. දිස්ත්‍රික්කය :————.
4. දුරකතන අංකය :————.
5. උපන් දිනය :————.
6. ජාතික හැඳුනුම්පත් අංකය :————.
7. ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම :————.

8. ඔබගේ රුචිකත්වය හා සුදුසුකම් අනුව හැදෑරීමට කැමති පාඨමාලා හා මධ්‍යස්ථාන අනුපිළිවෙලින් සඳහන් කරන්න. ៖

| පාඨමාලාව | අදාළ මධ්‍යස්ථානය |
|---|---|
| (i) .................................... | (i) .................................... |
| (ii) .................................... | (ii).................................... |
| (iii) .................................... | (iii).................................... |

ඉහත තොරතුරු නිවැරදි හා සත්‍ය බවට සහතික කරමි.

................,
අයදුම්කරුගේ අත්සන

දිනය :............

ඔබගේ අයදුම්පත පාඨමාලාව තෝරාගත් දිස්ත්‍රික්කයේ සහකාර අධ්‍යක්ෂ ලිපිනයට යොමු කරන්න. පාඨමාලා ආරම්භය 2021 ජනවාරි 04 වේ.

**ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය**

ආධුනිකයන් බඳවා ගැනීම - 2021 පළමු අර්ධ වර්ෂය

| පාඨමාලා අංකය | වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | පාඨමාලා කාලය (කර්මාන්තශාලා පුහුණුව සමඟ) | NVQ Levels |
|---|---|---|---|
| | **මෝටර් රථ අළුත්වැඩියාව සහ නඩත්තුව** | | |
| 1 | මෝටර් රථ වායු සමීකරණ ශිල්පී | 12 | 3/4 |
| 2 | රියදුරු (සැහැල්ලු වාහන) අර්ධ කාලීන | 6 | Non |
| 3 | මෝටර් රථ පින්තාරු ශිල්පී | 6 | 3/4 |
| 4 | මෝටර් රථ වැද්දුම් ශිල්පී | 12 | 3/4 |
| 5 | යතුරුපැදි කාර්මික ශිල්පී | 12 | 3/4 |
| 6 | ත්‍රීරෝද රථ කාර්මික ශිල්පී | 6 | 3/4 |
| 7 | මෝටර් රථ කාර්මික ශිල්පී | 24/36 | 3/4 |
| 8 | මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී | 24 | 3/4 |
| 9 | කෘෂි යන්ත්‍ර හා උපකරණ කාර්මික ශිල්පී | 24 | 2/3 |
| 10 | Automobile Technology (ඩිප්ලෝමා) | | 5 |
| 11 | Automobile Technician | | 4 |
| | **විදුලි විද්‍යුත් සහ විදුලි සංදේශ** | | |
| 12 | විදුලි ශිල්පි (කර්මාන්ත) | 18 | 4 |
| 13 | විදුලි මෝටර් එතුම් ශිල්පී | 12 | 3/4 |
| 14 | විදුලි ගෘහස්ථ ශිල්පී | 24 | 3/4 |
| 15 | ජංගම දුරකතන අළුත්වැඩියා ශිල්පී | 12 | 3 |
| 16 | ගෘහස්ථ විදුලි උපකරණ අළුත්වැඩියා ශිල්පී | 24 | 3 |
| 17 | නියුමැටික් ශිල්පී (Pneumatic Technician) | | 4 |
| 18 | විද්‍යුත් උපකරණ තාක්ෂණ ශිල්පී | 18 | 4 |
| 19 | Solar Power Technician | 18 | 3 |
| 20 | Electronic Technology (ඩිප්ලෝමා) | | 6 |
| 21 | Mechatronic Technology (ඩිප්ලෝමා) | | 5 |
| 22 | Automation& Robotics Technology (ඩිප්ලෝමා) | | 6 |
| 23 | Fluid Power Technology (ඩිප්ලෝමා) | | 5 |
| 24 | Electrical Technology (ඩිප්ලෝමා) | | 5 |
| | **තොරතුරු සන්නිවේදන තාක්ෂණය** | | |
| 25 | පරිගණක දෘඩාංග ශිල්පී + CISCO IT Essential (A+) | | 4 |
| 26 | IT Support (with CISCO IT Essential (A+) | | 4 |
| 27 | පරිගණක දෘඩාංග ශිල්පී | 12 | 3/4 |
| 28 | Adobe Certified Professional/ Computer Graphic Designer | 12 | 4 |
| 29 | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (NVQ 5 in ICT with Oracle Academy Java Programming and data base certification training) (ඩිප්ලෝමා) | 15 | 5 |

| පාඨමාලා අංකය | වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | පාඨමාලා කාලය (කර්මාන්තශාලා පුහුණුව සමඟ) | NVQ Levels |
|---|---|---|---|
| 30 | Software Developer | | 4 |
| 31 | Multimedia Designing Associate | | 4 |
| 32 | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලාව (NVQ Level 4 in ICT) | 12 | 4 |
| 33 | CISCO Computer Networking / National Certificate Network Technician | | 4 |
| 34 | ග්‍රැෆික් නිර්මාණ ශිල්පී | 12 | 4 |
| 35 | ග්‍රැෆික් නිර්මාණ ශිල්පී (ශ්‍රවණාබාධිත) - නාරාහේන්පිට | 12 | 4 |
| 36 | Web Designing & Development | 12 | 4 |
| 37 | Computer Application Assistant | 6 | 3 |
| 38 | Computer Hardware and Network Technician with CISCO IT Essential (A+) | | 4 |
| | **හෝටල් හා සංචාරක** | | |
| 39 | වෘත්තීය සූපවේදී | 12 | 3/4 |
| 40 | කාමර සේවක | 12 | 3/4 |
| 41 | භෝජනාගාර සේවක | 12 | 4 |
| 42 | පිළිගැනීමේ නිලධාරී/ නිලධාරිණී | 12 | 4 |
| 43 | Food & Beverage Service | | 4 |
| | **මැණික් හා ස්වර්ණාභරණ** | | |
| 44 | ස්වර්ණාභරණ ගල් බැඳීම් ශිල්පී | 12 | 3/4 |
| 45 | ස්වර්ණාභරණ ශිල්පී | 24 | 3/4 |
| | **පුද්ගල හා සමාජ** | | |
| 46 | රූපලාවන්‍ය ශිල්පී | 6 | 3/4 |
| 47 | කොණ්ඩා සැකසුම් ශිල්පී | 6 | 3/4 |
| 48 | පෙර පාසල් ගුරු පුහුණු | 24 | 3/4 |
| 49 | Child Caregiver | 12 | 4 |
| 50 | ජනමාධ්‍ය පිළිබඳ විශේෂ පාඨමාලාව | 3 | 3 |
| | **ආහාර හා තාක්ෂණය** | | |
| 51 | බේකරි ශිල්පී | 12 | 3/4 |
| 52 | පළතුරු සහ එළවළු නිෂ්පාදන සැකසුම් ශිල්පී | 12 | 3 |
| | **දැව ආශ්‍රිත** | | |
| 53 | ලී කැටයම් ශිල්පී (Wood Craver) | 12 | 3/4 |
| 54 | ලී වැඩ කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ) | 12/24 | 3/4 |
| 55 | ලී වැඩ කාර්මික ශිල්පී (ගොඩනැගිලි) | 24 | 3/4 |
| 56 | Wood Craftsman (Buildings) with relevant Aluminium Modules | | 4 |
| | **රෙදිපිළි හා ඇඟලුම්** | | |
| 57 | මෝස්තර නිර්මාණ ශිල්පී (අර්ධකාලීන) | 12 | 4 |
| 58 | අධිවේගී මහන යන්ත්‍ර කාර්මික ශිල්පී (ISM Mechanic) | 12 | 3/4 |
| 59 | අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු (ISM Operator) | 6 | 3 |

| පාඨමාලා අංකය | වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | පාඨමාලා කාලය (කර්මාන්තශාලා පුහුණුව සමඟ) | NVQ Levels |
|---|---|---|---|
| 60 | ඇඳුම් මැසීම (කාන්තා හා ළමා) (Dress Maker / Tailor) | 12 | 2/3/4 |
| 61 | තිර මුද්‍රණකරු (Screen Printer) | 12 | 4 |
| 62 | ඇඳුම් මැසීම (පිරිමි) (Tailor Gents) | 12 | 3/4 |
| 63 | ඇඟළුම් නිෂ්පාදන සුපරීක්ෂක (Garment Production Supervisor) | 12 | 4 |
| 64 | ඇඟළුම් තත්ත්ව පාලක (Garment Quality Controller) | | 4 |
| 65 | වැඩ අධ්‍යයන නිලධාරි (Work Study Officer) | 12 | 4 |
| 66 | Pattern Maker | 24 | 4 |
| 67 | Apparel Manufacture Technologist (ඩිප්ලෝමා) | | 5 |
| 68 | Apparel Designing Technician | | 4 |
| | **ශීතකරණ හා වායුසමීකරණ ශිල්පි** | | |
| 69 | ශීතකරණ හා වායුසමීකරණ ශිල්පි | | 3/4 |
| 70 | Refrigerator & Air-condition Technology (ඩිප්ලෝමා) | | 5 |
| 71 | Air-conditioner (Samsung School) | | Non |
| | **ලෝහ සහ ලුහු ඉංජිනේරු** | | |
| 72 | Fabricator Metal (ලෝහ පිරිසැකසුම්) | 12 | 4 |
| 73 | Fitter (General) වැද්දුම් ශිල්පි | 12 | 4 |
| 74 | Machinist (යන්ත්‍ර ශිල්පි) CNC Milling & Lathe | 12 | 4 |
| 75 | Machinist (General) යන්ත්‍ර ශිල්පී | 24 | 3/4 |
| 76 | Machinist / Turner යන්ත්‍ර ශිල්පී | | 4 |
| 77 | Machinist, CNC Lathe, Milling and General | | 4 |
| 78 | Welder | | 3 |
| 79 | Welder (GAS /ARC/TIG/MAG) | | 4 |
| 80 | Welder (GAS/ARC/MAG) | | 4 |
| 81 | CNC Technology (ඩිප්ලෝමා) | | 5 |
| 82 | Welding Technology (ඩිප්ලෝමා) | | 5 |
| 83 | Machinist (CNC Milling) | | 4 |
| | **ගොඩනැගිලි සහ ඉදිකිරීම්** | | |
| 84 | ඇළුමිනියම් පිරිසැකසුම් ශිල්පී | 12 | 3/4 |
| 85 | Aluminium Fabricator and Interior Decorator | | 4 |
| 86 | ඉදිකිරීම් ශිල්පි (පෙදරේරු) | | 3/4 |
| 87 | ජලනල කාර්මික ශිල්පී | 12/18 | 3/4 |
| 88 | සහකාර ප්‍රමාණ සමීක්ෂක | 12 | 4 |
| 89 | උද්‍යාන අලංකරණ තාක්ෂණ ශිල්පී | 12 | 3/4 |
| 90 | ඉදිකිරීම් තාක්ෂණ ශිල්පි (ඩිප්ලෝමා) | 12 | 5 |
| 91 | ප්‍රමාණ සමීක්ෂණ ශිල්පි (ඩිප්ලෝමා) | 48 | 5 |
| 92 | සැලසුම් ශිල්පි (Draughtsperson) | 12 | 4 |
| 93 | Draughting Technology (ඩිප්ලෝමා) | | 5 |
| 94 | Bar Bender | | 3 |

| පාඨමාලා අංකය | වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | පාඨමාලා කාලය (කර්මාන්තශාලා පුහුණුව සමඟ) | NVQ Levels |
|---|---|---|---|
| 95 | Block Layer | | 3 |
| 96 | Construction Site Supervisor | | 4 |
| 97 | Painter | | 3 |
| 98 | Rigger | | 3 |
| 99 | Tiler | | 3 |
| | **මුද්‍රණ හා ඇසුරුම්** | | |
| 100 | ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරු | 12 | 3/4 |
| 101 | Book Binder | 6 | 3 |
| | කෘෂිකර්ම වැවිලි සහ පශු සම්පත් | | |
| 102 | කෘෂිකාර්මික ක්ෂේත්‍ර සහායක | | 3 |
| 103 | පැළ තවාන් සංවර්ධන සහායක | | 3 |
| | **සම් ආශ්‍රිත නිෂ්පාදන** | | |
| 104 | පාවහන් ශිල්පී | | 3 |
| 105 | සම්භාණ්ඩ නිෂ්පාදන ශිල්පී | 12 | 3 |
| | **කාර්යාල කළමනාකරණය** | | |
| 106 | ලේකම් පරිචය (Secretarial Practice) | 12 | 4 |
| | **ධීවර හා මත්ස්‍ය වගා ක්ෂේත්‍රය** | | |
| 107 | මෝටර් බෝට්ටු කාර්මික (බාහිර එන්ජින්) | | 4 |
| | **වෙනත්** | | |
| 108 | ඉංග්‍රීසි හා මෘදු කුසලතා (අර්ධකාලීන) | 12/24 | Non |
| 109 | Diploma in Industrial Management | | Non |
| 110 | Private Security Officer Training Course. | | Non |
| 111 | Sea Marshal Training Course' | | Non |
| 112 | Security Management & Consultancy Course' | | Non |
| 113 | Train the Trainer on Private Security Training | | Non |
| | **සෞඛ්‍ය හා සමාජ** | | |
| 114 | Caregiver (Elder) | | 3 |
| 115 | Caregiver (Elder) අර්ධකාලීන | | 2 |

**2021 අධ්‍යයන වර්ෂය**

ජාතික වෘත්තීය පුහුණු ආයතන හා දිස්ත්‍රික්කයන්ගේ ක්‍රියාත්මක පාඨමාලා සංකේත අංක අනුව

| ජාතික වෘත්තීය පුහුණු ආයතනය | පාඨමාලා අංකය | දිස්ත්‍රික් වෘත්තීය පුහුණු ආයතනය | පාඨමාලා අංකය | දිස්ත්‍රික් වෘත්තීය පුහුණු ආයතනය | පාඨමාලා අංකය | දිස්ත්‍රික් වෘත්තීය පුහුණු ආයතනය | පාඨමාලා අංකය |
|---|---|---|---|---|---|---|---|
| නාරාහේන්පිට 071-2592233 071-1213048 | 1, 3, 11, 12, 28, 30, 31, 32, 35, 38, 39, 43, 46, 47, 48, 49, 51, 75, 83, 85, 91, 92, 100, 109, 114 | ගම්පහ 033-2294790 071-1361130 | 5, 8, 11, 12, 13, 14, 15, 16, 18, 25, 27, 31, 32, 34, 37, 39, 45, 46, 47, 49, 51, 54, 55, 56, 58, 59, 66, 68, 69, 75 , 78, 80, 84, 87, 89, 95, 98, 110, 111, 112, 113 | ත්‍රිකුණාමල ය 026-2234517 071-8920003 | 9, 12, 13, 14, 32, 34, 36, 39, 40, 43, 46, 47, 51, 54, 60, 78, 84, 86, 87 | අම්පාර (සිංහල ) 063-2223821 071-8167993<br>අම්පාර (දෙමළ) 067-2251155 071-1211501 | 5, 7, 8, 11, 12, 13, 14, 16, 27, 32, 34, 39, 40, 42, 43, 46, 47, 51, 54, 56, 59, 60, 64, 68, 69, 78, 84, 86, 87, 91, 96, 106 |
| රත්මලාන 011-2638850 071-0991707 | 7, 12, 16, 17, 25, 32, 34, 69, 75, 79, 84, 86, 88, 89, 91, 92, 94, 97, 99 | ගාල්ල 091-2234540 071-8136566 | 3, 4, 5, 8, 11 , 12, 13, 14, 15, 16, 17, 19, 25, 27, 32, 34, 39, 40, 42, 43, 45, 46, 47, 51., 52, 54, 55, 56, 58, 59, 60, 61, 64, 65, 66, 69, 75, 78, 84, 87, 89, 90, 100, 101, 103, 106, 107 | බදුල්ල 057-2223043 071-0318731 | 5, 7, 9, 12, 13, 14, 16, 25, 32, 34, 39, 40, 43, 46, 47, 51, 54, 56, 60, 64, 69, 72, 75, 78, 79, 84, 86, 87, 92, 106 | | |
| මිරිජ්ජවිල 047-2220501 071-1212372 | 12, 16, 25, 32, 46, 47, 54, 69, 72, 79, 87 | කළුතර 034-2263698 071-1213189 | 1, 5, 12, 13, 14, 16, 25, 30, 31, 32, 39, 40, 45, 46, 47, 49, 51, 54, 56, 60, 62, 63, 64, 66, 68, 69, 72, 78, 84, 87, 89 92, 103 | මොණරාගල 055-2274775 071-1040026 | 5, 9, 11, 12, 13, 14, 16, 25, 32, 34, 39, 43, 46, 47, 51, 54, 60, 62, 69, 75, 78, 79, 84, 86, 92 | මඩකලපුව 065-2240159 071-1211656 | 5, 14, 32, 34, 46, 47, 51, 54, 60, 62, 78, 84, 86, 87 |
| බද්දේගම 091-2293119 071-4475721 | 12, 13, 16, 25, 31, 32, 39, 43, 48, 49, 51, 84, 87, 91 | මහනුවර 081-2387200 071-1212013 | 5, 11, 12, 14, 16, 25, 32, 34, 36, 39, 40, 43, 46, 47, 49, 54, 56, 60, ' 68, 69, 75, 78, 79, 84, 87, 89, 91, 92, 106, | මාතර 041-2235955 071-0796902 | 4, 5, 7, 12, 13, 14, 25, 31, 32, 34, 46, 47, 54, 56, 58, 60, 61, 64, 66, 68, 69, 78, 84, 86, 87, 92 | නුවරඑළිය 052-2223216 071-0318745 | 5, 7, 12, 14, 25, 32, 34, 39, 40, 43, 46, 47, 48, 51 , 54, 60, 64, 68, 75, 78, 84, l06 |
| නියාගම 091–2296445 071–1213609 | 5, 12, 25, 32, 34, 40, 43, 46, 47, 48, 56, 69, 74, 75, 79, 86, 87, 114 | මාතලේ 066–2286683 071–1212341 | 5, 9, 11, 12, 14, 25, 32, 34, 39, 43, 46, 47, 51, 53, 54, 60, 61, 66, 69, 75, 78, 84, 86, 87, 89, 106 | කුරුණෑගල 037–2237436 071–1212259 | l, 3, 4, 5, 7, 11, 12, 14, 16, 32, 34, 38, 39, 43, 45, 46, 47, 49, 51, 53, 56, 58, 60, 61, 66, 69, 73, 78, 84, 87, 89, 92, 106 | කොළඹ 011–2844151 071–0318733 | 1, 5, 7, 12, 14, 16, 18, 19, 25, 30, 32, 34, 39, 44, 46, 47, 48, 49, 51, 56, 59, 60, 62, 68, 69, 72, 78, 84, 86, 87, 89, 106 |

**2021 අධ්‍යයන වර්ෂය**

ජාතික වෘත්තීය පුහුණු ආයතන හා දිස්ත්‍රික්කයන්ගේ ක්‍රියාත්මක පාඨමාලා සංකේත අංක අනුව

| ජාතික වෘත්තීය පුහුණු ආයතනය | පාඨමාලා අංකය | දිස්ත්‍රික් වෘත්තීය පුහුණු ආයතනය | පාඨමාලා අංකය | දිස්ත්‍රික් වෘත්තීය පුහුණු ආයතනය | පාඨමාලා අංකය | දිස්ත්‍රික් වෘත්තීය පුහුණු ආයතනය | පාඨමාලා අංකය |
|---|---|---|---|---|---|---|---|
| තලල්ල 041-2259331 071-1039415 | 7, 12, 16, 25, 32 , 36, 39, 43, 46, 47, 48, 49, 51, 56, 69, 75, 78, 82, 84, 86, 87, 89, 102 | පොළොන්නරුව 027-2245442 071-4481356 | 5, 8, 9, 11, 12, 14, 25, 32, 34, 46, 47, 51, 54, 59, 60, 68, 69, 75, 78, 79, 84, 86, 87 | කෑගල්ල 035-2282565 071-1212267 | 3, 4, 5, 11, 12, 14, 16, 18, 25, 32, 34, 39, 45, 46, 47, 48, 54, 55, 56, 58, 60, 68, 69, 75, 78, 84, 86, 87, 89, 92, 106, 114 | යාපනය 021-2227949 071-0318737 | 5, 11, 12, 14, 25, 32, 34, 39, 40, 42, 43, 46, 47, 48 , 51, 54, 60, 69, 78, 84, 86, 87 |
| මඩකලපුව 065-2240159 071-1211656 | 11, 12, 16, 32, 46, 47, 56, 69, 74 , 75, 86, 91, 102 | අනුරාධපුර 025-2221400 071-1211558 | 1, 5, 7, 8, 9, 11, 12, 13, 14, 16, 25, 32, 39, 43, 46, 47, 51, 54, 59, 60, 61, 69, 75, 78, 85, 86, 87, 89, 92, 104 | පුත්තලම 032-2254110 071-1213906 | 5, 7, 8, 11, 12, 13, 14, 16, 25, 32, 34, 39, 43, 46, 47, 51, 56, 60, 69, 75, 78, 84, 87, 88, 92 | කිළිනොච්චිය 021-2285686 077-7352865 | 5, 9, 12, 14, 27, 32, 34, 46, 47, 49, 54, 60, 69, 78, 84, 86, 87, 88, 92, 107 |
| ඔරුගොඩවත්ත 011-2072850 071-4706444 | 10, 20, 21, 22, 23, 24, 70, 81, 82 | මන්නාරම 071-0318750 | 14, 32, 46, 47, 54, 60, 87 | හම්බන්තොට 047-2241724 071-1211846 | 1 , 3, 4, 5, 8, 9, 12, 13, 14, 16, 27, 32, 34, 39, 40, 43, 46, 47, 48, 51, 54, 55, 59, 60, 66, 68, 69, 75, 78, 84, 86, 87, 92 | වවුනියා 024-2221617 077-1906071 | 5, 9, 12, 27, 32, 34, 46, 47, 54, 60, 68, 69, 78, 84, 86, 87, 105 |
| | | මුලතිවු 021-2290097 071-3956503 | 5, 12, 14, 27, 32, 34, 37, 46, 47, 51, 60, 85, 87 | රත්නපුර 045-2274699 071-0378748 | 3, 5,11, 12, 13, 14, 16, 25, 32, 34, 39, 46, 47, 51, 54, 58, 60, 66, 68, 69, 78, 84, 86, 87, 89 | | |

| ජා. වෘ. පුහුණු ආයතනය/දිස්ත්‍රික්කය | - දුරකථන අංකය |
|---|---|
| නාරාහේන්පිට | - 011-2592233<br>071-1213048 |
| රත්මලාන | - 011-2638850<br>071-0991707 |
| මිරිජ්ජවිල | - 047-2220501<br>071-1212372 |
| බද්දේගම | - 091-2293119<br>071-4475721 |
| නියාගම | - 091-2296445<br>071-1213609 |
| තලල්ල | - 041-2259331<br>071-1039415 |
| මඩකලපුව | - 065-2240159<br>071-1211656 |
| ඔරුගොඩවත්ත | - 011-2072850<br>071-4706444 |
| ගම්පහ | - 033-2294790<br>071-1361130 |
| ගාල්ල | - 091-2234540<br>071-8136566 |
| කළුතර | - 034-2263698<br>071-1213189 |
| මහනුවර | - 081-2387200<br>071-1212013 |
| මාතලේ | - 066-2286683<br>071-1212341 |
| පොළොන්නරුව | - 027-2245442<br>071-4481356 |
| අනුරාධපුර | - 025-2221400<br>071-1211558 |
| මන්නාරම | - 071-0318750 |
| මුලතිවු | - 021-2290097<br>071-3956503 |
| ත්‍රිකුණාමලය | - 026-2234517<br>071-8920003 |

| ජා. වෘ. පුහුණු ආයතනය/දිස්ත්‍රික්කය | - දුරකථන අංකය |
|---|---|
| බදුල්ල | - 057-2223043<br>071-0318731 |
| මොණරාගල | - 055-2274775<br>071-1040026 |
| මාතර | - 041-2235955<br>071-0796902 |
| කුරුණෑගල | - 037-2237436<br>071-1212259 |
| කෑගල්ල | - 035-2282565<br>071-1212267 |
| පුත්තලම | - 032-2254110<br>071-1213906 |
| හම්බන්තොට | - 047-2241724<br>071-1211846 |
| රත්නපුර | - 045-2274699<br>071-0378748 |
| අම්පාර (සිංහල) | - 063-2223821<br>071-8167993 |
| අම්පාර (දෙමළ) | - 067-2251155<br>071-1211501 |
| මඩකලපුව | - 065-2240159<br>071-1211656 |
| නුවරඑළිය | - 052-2223216<br>071-0318745 |
| කොළඹ | - 011-2844151<br>071-0318733 |
| යාපනය | - 021-2227949<br>071-0318737 |
| කිලිනොච්චි | - 021-2285686<br>077-7352865 |
| වවුනියා | - 024-2221617<br>077-1906071 |

## සංශෝධනයයි

### ඉඩම් අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2020**

අංක 2193 දරන 2020 සැප්තැම්බර් මස 11 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ''ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2020'' විභාග නිවේදනයෙහි 02(අ) යටතේ සඳහන් විෂය නිර්දේශය පහත පරිදි සංශෝධනය විය යුතුය. :-

| | *ප්‍රශ්න පත්‍රයේ නම* | *කාලය (පැය)* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 1 | අවබෝධය | 02 | 100 | 40 |
| 2 | බුද්ධි පරීක්ෂණය | 01 | 100 | 40 |
| 3 | සාමාන්‍ය දැනීම | 01 | 100 | 40 |

*01. අවබෝධය* :

පැය දෙක (02)ක කාල සීමාවකට සීමාවන මෙම ප්‍රශ්න පත්‍ර මගින් කෙටි පාඨ ගණනාවක් අයදුම්කරුවන් වෙත දෙනු ලැබේ. ඇතැම් පාඨ දෙනු ලබන්නේ එක් වාක්‍යයකින් අදහස් ප්‍රකාශ කිරීම පිණිස වේ. යටින් ඉරි ඇඳි පදවලට විවරණ සැපයීමේ ප්‍රශ්න ද දෙනු ලැබේ. තවත් ඇතැම් පාඨ සම්බන්ධයෙන් අයදුම්කරුවන් වෙත විකල්ප ප්‍රකාශ ගණනාවක් ඉදිරිපත් කරන අතර, එයින් එකක් මෙම පාඨයේ අන්තර්ගත කරුණුවලට වඩාත්ම හොඳින් ගැළපෙයි. අයදුම්කරුවන් මෙයින් වඩාත් උචිත ප්‍රකාශය තෝරාගත යුතුය. තවත් ඇතැම් පාඨ සම්බන්ධයෙන් අයදුම්කරු වෙත ප්‍රශ්න කිහිපයක් ඉදිරිපත් කරනු ඇත. ඒවාට නිවැරදි පිළිතුරු ලබාදීම අපේක්ෂා කෙරේ. මෙම ප්‍රශ්න පිළියෙල කරනු ලබන්නේ අයදුම්කරු එම පාඨයන්ගේ අර්ථය වටහාගන්නා ආකාරය පරීක්ෂා කිරීම සඳහා ය. මෙයට අමතරව සාරාංශය ලිවීම සඳහා දිග පාඨයක් දෙනු ලැබේ.

*02. බුද්ධි පරීක්ෂණය* :

පැයක කාලසීමාවකට සීමාවන මෙය සකස් කර ඇත්තේ අයදුම්කරුගේ සිතීමේ තර්කානුකූල තත්ත්වයටත්, ඔහුගේ සිතෙහි විශ්ලේෂණ හැකියාවත්, ඔහුගේ තීරණ ගැනීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා ය. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්වලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු වේ.

*03. සාමාන්‍ය දැනීම* :

පැයක කාල සීමාවකට සීමාවන මෙම ප්‍රශ්න පත්‍රය ශ්‍රී ලංකාවේ දේශපාලන, සමාජ, සංස්කෘතික, ආර්ථික හා පරිසරය ද ඇතුළුව සමස්තය පිළිබඳව සහ ජාතික හා අන්තර් ජාතික වැදගවත්වන නූතන කරුණු මෙන්ම විද්‍යාත්මක, තාක්ෂණික හා කාර්මික සංවර්ධනය ද සම්බන්ධයෙන් ඇති දැනීම පරීක්ෂා කිරීම සඳහා සකස් වූ පොදු ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු වේ.

ඒ. එල්. ශ්‍යාමලී චිත්‍රලේඛා පෙරේරා,
සර්වෙයර් ජනරාල්.

2020 නොවැම්බර් මස 30 වැනි දින,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

12 - 293

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

## සීමිත පදනම මත රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන තරග විභාගය -2018 (2020)

සීමිත පදනම මත රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිශ්‍රේණියට උසස් කිරීම සඳහා වන තරග විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2021 මාර්තු මස කොළඹදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කෙරේ.

02. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, අංක 2053/18 දරන 2018.01.09 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙන් පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට යටත්ව 2020.10.31 දිනට ගණනය කර ඇති රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සේවයේ අධි ශ්‍රේණියේ පුරප්පාඩුවලින් 35% ක ප්‍රමාණයක් සීමිත පදනම මත උසස් කිරීම මඟින් සම්පූර්ණ කරනු ලැබේ.

03. සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින රෝහල් හා සෞඛ්‍ය ආයතනවල සේවයේ නියුතු, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව **MN**-02-2016 වැටුප් කේතය යටතේ වැටුප් ලබන සහ එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටින 2020.10.31 දිනට මෙහි 07 ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධරයින් මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලබයි. පළාත් රාජ්‍ය සේවයට අයත් නිලධරයන්ට මෙම විභාගයට පෙනී සිටිය නොහැකිය.

04. 2016.02.25 දිනැති හා අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN-07-2016 වැටුප් බණ්ඩය මෙම තනතුරට හිමිවන අතර එයට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 41,580/-11 x 755 - 18 x 1030 - රු. 68,425/- ක් වේ.එම වැටුප ඔබට හිමිවනුයේ 2020.01.01 දින සිට වේ. එම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

05. *සේවා කොන්දේසි* :

I. පත් කරනු ලබන නිලධරයන් සංඛ්‍යාව සහ පත්වීම් ක්‍රියාත්මකවන දිනය පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

II. රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවාවේ නිලධාරීන්ගේ සාමාන්‍ය රාජකාරී වේලාව අවුරුද්දේ සියලුම දිනවල පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ. එහෙත් රාජකාරී අවශ්‍යතාව මත හා රාජකාරී ස්වාභාවය අනුව ඉහත වේලාවන් වෙනස් විය හැක. තවද සේවා අවශ්‍යතාව අනුව රාත්‍රී සේවයේ යෙදවිය හැකිවන අතර, රාජකාරී ස්වාභාවය අනුව අමතර රාජකාරී සඳහා ද නියෝග කරනු ලැබිය හැකිය. බඳවා ගනු ලබන නිලධරයන් වසරේ දින තුන්සිය හැට පහේම (365) සේවයට යටත් වනු ඇත.

III. සේවා අවශ්‍යතාව අනුව සෞඛ්‍ය ආයතන සහ රෝහල්වල සේවයේ නියුතු නිලධරයන්ට සෙනසුරාදා, ඉරිදා සහ රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනවල සේවය කිරීමට නියම කළ හැකිය. එම සේවය වෙනුවෙන් අතිකාල හෝ නිවාඩු දින වැටුප් හෝ හිලව් නිවාඩු ලබා ගත හැකිය.

IV. සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් නියම කරන රාජකාරී ඉටු කරන නිලධාරීන් විසින් රුපියල් 5000/- ක ඇප මුදලක් තැබිය යුතුය.

06. *ඇගයීමේ ක්‍රමවේදය* :

අධිශ්‍රේණියේ පුරප්පාඩුවලින් 35% ක ප්‍රමාණයක් සීමිත පදනම මත සම්පූර්ණ කරනු ලැබේ. මේ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන කාර්යාල කළමනාකරණය, කාර්යාල ක්‍රම, ආයතන කාර්ය හා කාර්ය පටිපාටික රීති, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, පොදු ප්‍රශ්න පත්‍රය - I කොටස - II කොටස පරීක්ෂණ සඳහා මුහුණ දී අවම වශයෙන් ලකුණු 40% ක් ලබා සමත් විය යුතුය. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන්නේ උක්ත සඳහන් ආකාරයට අවම ලකුණු 40% ක් ලබා ගත් අයදුම්කරුවන් පමණි. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්

සෞඛ්‍ය සේවා කමිටුව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින්, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පත් කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය අයදුම්කරුවන්ගේ සුදුසුකම් සනාථ කෙරෙන සහතික පරීක්ෂා කිරීම සඳහා පමණක් වන අතර එහිදී ලකුණු දීමක් සිදු නොවේ.

| | *ප්‍රශ්න පත්‍රය /ලකුණු ලබා දෙන නිර්ණායකය* | *කාලය* | *මුළු ලකුණු* |
|---|---|---|---|
| 1. | කාර්යාල කළමනාකරණය | පැය 2 | 100 |
| 2. | කාර්යාල ක්‍රම | පැය 2 | 100 |
| 3. | ආයතන කාර්ය හා කාර්ය පටිපාටික රීති | පැය 2 | 100 |
| 4. | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | පැය 2 | 100 |
| 5. | පොදු ප්‍රශ්න පත්‍රය - I කොටස | පැය 1 | 50 |
| | - II කොටස | පැය 1 | 50 |

I. කාර්යාල කළමනාකරණය - ලිඛිත පරීක්ෂණය ( කාලය පැය 2 ලකුණු 100)

සංවිධාන ව්‍යුහය, සංවිධාන පිළිබඳ මූලධර්මය, කාර්ය විශ්ලේෂණය හා කාර්ය ඇගයීම්, නායකත්වය, අධීක්ෂණය හා තීරණ ගැනීමේ හැකියාව, සංදේශනය, මහජන සම්බන්ධතාවය, සම්බන්ධීකරණය හා ගැටලු නිරාකරණය

II. කාර්යාල ක්‍රම - ලිඛිත පරීක්ෂණය ( කාලය පැය 2 ලකුණු 100)

කාර්යාල ක්‍රම පිළිබඳ මූලධර්ම, කාර්යාල පටිපාටි, ලේඛන සහ ගොනු කිරීම, ආකෘති පත්‍ර පාලනය, කාර්යාලයේ සැලැස්ම හා වටපිටාව, රැකියා විස්තරය, වැඩ අධ්‍යයනය හා ක්‍රම අධ්‍යයනය, වැඩ මැනීම, කාර්යාල මෙහෙයුම් අත්පොත

III. ආයතන කාර්ය හා කාර්ය පටිපාටික රීති - ලිඛිත පරීක්ෂණය ( කාලය පැය 2 ලකුණු 100)

රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග, රාජ්‍ය නිලධාරීන්ගේ ආයතනික කටයුතු, පෞද්ගලික ලිපි ගොනුවක් පවත්වාගෙන යාම, රාජ්‍ය සේවකයන් පත් කිරීම, මාරු කිරීම, උසස් කිරීම හා සේවය අවසන් කිරීම යන කාර්යයන්හි බලතල පැවරීම, සුභ සාධනය, රාජ්‍ය නිලධාරීන්ට හිමි වරප්‍රසාද, ආයතන කාර්ය පිළිබඳව රජය විසින් මෙතෙක් නිකුත් කර ඇති රෙගුලාසි හා චක්‍රලේඛ පිළිබඳව සාමාන්‍ය අවබෝධය පරීක්ෂා කෙරේ.

IV. රාජ්‍ය මූල්‍ය කළමනාකරණය - ලිඛිත පරීක්ෂණය ( කාලය පැය 2 ලකුණු 100)

වාර්ෂික ඇස්තමේන්තු හා ගණන් දීමේ නිලධාරියකුගේ වගකීම, මුදල් පාලනය, මූල්‍ය වගකීම පැවරීම, මුදල් භාර ගැනීම, ගිණුම්ගත කිරීම හා ප්‍රතිග්‍රහණය කිරීම, ගෙවීම්, රාජ්‍ය මුදල් භාරකාරත්වය, අග්‍රිම හා බැංකු ගිණුම්, සැපයුම් හා සේවාවන්, ප්‍රසම්පාදන කටයුතු, භාණ්ඩ සමීක්ෂණ, විගණන විමසුම්, රජයේ කාර්යාල වල භාවිතය පිළිබඳ මෙතෙක් නිකුත් කර ඇති චක්‍රලේඛ හා රෙගුලාසි පිළිබඳ සාමාන්‍ය අවබෝධය පරීක්ෂා කෙරේ.

V. පොදු ප්‍රශ්න පත්‍රය - I කොටස - ලිඛිත පරීක්ෂණය ( කාලය පැය 1 ලකුණු 50)

රාජ්‍ය පරිපාලනයේ ස්වභාවය, රාජ්‍ය පරිපාලන ව්‍යුහය, රාජ්‍ය ප්‍රතිපත්තිය හා නව රාජ්‍ය ප්‍රතිසංස්කරණ, මූල්‍ය අයිතිවාසිකම්, මානව හිමිකම්, මානව හිමිකම් කොමිෂන් සභාව, ඔම්බුඩ්ස්මන්වරයා, පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව, කාර්යාල සංස්කෘතිය, ආචාර ධර්ම හා සාරධර්ම, මැනවින් කාර්යාල භෞතික පරිසර නිර්මාණය කිරීම සහ සිවිල් තත්ත්වය පිළිබඳ සමාජ විද්‍යාත්මක පිළිගැනීම, සේවාලාභීන්ට රාජ්‍ය නිලධාරීන්ගෙන් ඉටුවිය යුතු යුතුකම්.

VI. පොදු ප්‍රශ්න පත්‍රය - II කොටස - ලිඛිත පරීක්ෂණය ( කාලය පැය 1 ලකුණු 50)

සෞඛ්‍ය හා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අරමුණු, රේඛීය අමාත්‍යාංශයේ හා පළාත් සභාවල සෞඛ්‍ය සේවා ව්‍යුහය, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මූලිකාංග හා ඊට අදාළ ආයතන, රෝගී සත්කාර සේවාවේ ව්‍යුහාත්මක වර්ධනය, රෝහලක ක්‍රියාකාරීත්වය, අමු ආහාර ද්‍රව්‍ය ඇණවුම් කිරීම, භාර ගැනීම හා පිසූ ආහාරවල ගුණාත්මක තත්ත්වය පිළිබඳ පරීක්ෂාව, ඖෂධ ශල්‍ය හා වෛද්‍ය උපකරණ සැපයීම හා අනෙකුත් සැපයීම්, වෛද්‍ය සංඛ්‍යාලේඛන කළමනාකරණය, වෛද්‍ය ආයතනවල සන්නිවේදන

කාර්යභාරය හා මහජන සම්බන්ධතාවය, රෝහල් ගාස්තු හා වතු එලදාව, රෝහල්වල විශේෂිත ඒකක හා විමධ්‍යගත විශේෂිත ව්‍යාපාර, ගෙවන වාට්ටු කළමනාකරණය කර ගැනීම, ජාතික හා හදිසි ආපදාවකදී ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳ දැනුම බැලෙන ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ.

07. *සුදුසුකම්* :

7.1 (අ) (i) සේවයේ I ශ්‍රේණියේ නිලධරයෙකු වීම;

හෝ

(ii) අවම වශයෙන් සේවයේ වසර අට (08)කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ, පූර්වාසන්න වැටුප් වර්ධක පහ (05) ම උපයාගෙන ඇති II ශ්‍රේණියේ නිලධරයෙකු වීම;

හෝ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිය සමත්, අවම වශයෙන් සේවයේ වසර (05) කටනොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවාකාලයක් සම්පූර්ණ කළ, පූර්වාසන්න වැටුප් වර්ධක පහ (05) මඋපයාගෙන ඇති සේවයේ II ශ්‍රේණියේ නිලධරයෙකු වීම.

7.2 කායික සුදුසුකම්-

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

7.3 වෙනත් සුදුසුකම්-

(i) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(ii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් 2020.10.31 දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.
(iii) 2020.10.31 දිනට පූර්වාසන්න වූ වර්ෂ 05 ක් තුළදී කිසිදු විනයානුකූල දඬුවමකට යටත් කර නොතිබීම.

***සටහන*** : මෙහිදී සිතාමතා අසත්‍ය තොරතුරු ඇතුළත් කරන ලද බව පෙනී ගියහොත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ උපදෙස්වලට යටත්ව අයදුම්කරුවන්ට සහ එම අයදුම්පත් සහතික කරන ලද දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට එරෙහිව කටයුතු කරනු ලැබේ. පෞද්ගලික ලිපිගොනුවෙන් සනාථ නොවන සුදුසුකම් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

08. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

(අ.) ඉල්ලුම් පත්‍රය මෙම චක්‍රලේඛයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර එය A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සම්පූර්ණ කළ යුතුය. අයදුම්පතේ අංක 01 සිට 7.10 තෙක් වූ ශීර්ෂ පළමු පිටුවටද, සෙසු ශීර්ෂ අනෙක් පිටුවලටද ඇතුළත් වන පරිදි අයදුම්පත සකස්කළයුතු අතර එය විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන මාධ්‍යයෙන් තම අත්අකුරින්ම අපේක්ෂකයා විසින්ම සම්පූර්ණ කළ යුතුය. අයදුම්පතේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය. නිවේදනයේ ඇතුළත් ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත්කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පතට ඇතුළත්කොට ලදුපත අලවා ඇත්ද යන්න පිළිබඳවත් පරීක්ෂා කර,අයදුම්පත් 2021.01.04 දිනට ප්‍රථම ආයතන ප්‍රධානියා වෙත බාර දිය යුතු අතර, ඔහු විසින් සෑම අයදුම්කරුවකු/ අයදුම්කාරියකම ඉදිරිපත් කරන ලද තොරතුරු සත්‍ය සහ නිවැරදි බවට පුද්ගලිකව සහතික කර ගැනීමෙන් පසු සියලු අයදුම්පත්,

"අධ්‍යක්ෂ (පාලන) 06,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
තැ.පෙ.385,
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10."

ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් **2021.01.18 දිනට** පෙර ඉදිරිපත් කළ යුතුය.ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ "රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවය සඳහා වූ සීමිත පදනම මත තරග විභාගය සඳහා අයදුම්පත" ලෙස සඳහන් කර එවිය යුතු වේ.

*සැ.යු.* .- (අ) තෝරා ගන්නා අයදුම්කරුවන් වෙත පත්වීම් ලිපි නිකුත් කරනු ලබන්නේ අයදුම්පතේ සටහන් කරනු ලබන මුලකුරු සමඟ නමට පමණක් වන බැවින් අයදුම්පතේ සඳහන් ආදර්ශය අනුගමනය කරමින් නම නිවැරදිව සඳහන් කළ යුතුය. පත්වීම නිකුත් කරනු ලබන අවස්ථාවේ නමෙහි සංශෝධනයක් කිරීමට හෝ යම් කොටස් ඇතුළත් කිරීමට/ඉවත් කිරීමට හෝ ඉඩ දෙනු නොලැබේ. සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(*ආ*) විභාගය සඳහා අයදුම්කරන අයදුම්කරුවන්ගේ අවසාන දිනට පැවති, තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

(*ඇ*) මෙම විභාගය සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අපේක්ෂකයින්ට සිය මනාපය පරිදි මින් එක් භාෂා මාධ්‍යයකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැකි අතර ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(*ඈ*) මෙහි නියමිත සුදුසුකම් තමන් විසින් සපුරා ඇති බවට අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අයදුම්කරුවන් / අයදුම්කාරියන් සෑහීමට පත් විය යුතුය.මෙම නිවේදනයේ දැක්වෙන සුදුසුකම් නොමැතිව විභාගයට ඉදිරිපත්වන අයදුම්කරුවන්/ අයදුම්කාරියන් විභාගයේදී ප්‍රමාණවත් ලකුණු මට්ටමක් ලැබුවද පත්වීම් ලැබීමට නුසුදුස්සෝ වෙති.

(*ඉ*) පත්වීම සඳහා අයදුම්කරු/අයදුම්කාරිය තෝරා ගනු ලැබී නම් ඔහු/ඇය මුදා හැරීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ එකඟතාව තිබිය යුතුය.

(*ඊ*) අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා චක්‍රලේඛය අනුව සුදුසුකම් පරීක්ෂා කිරීමේ දී අවශ්‍ය මූලික සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

09. *විභාග ගාස්තු* :

i. අයදුම්කරුවන් විභාග ගාස්තුව වශයෙන් රු.600 ක් විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක් / දිස්ත්‍රික් /ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබාගන්නා ලදුපත, එහි එක් දාරයක් මඟින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. මෙම විභාග ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරුකිරීමක් හෝ නොකරන බවද සලකන්න. විභාග ගාස්තුව ගෙවන ලද ලදුපතේ ඡායා පිටපතක් තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

ii. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් තම ප්‍රවේශපත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමඟ, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපත් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයන්ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින් විමසා සිටිය යුතුය. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ලඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

10. *විභාගයට පෙනී සිටීම* :

i. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ පසු යම් අයදුම්කරුවකු වෙත ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනයද, ගාස්තු ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපතෙහි සටහන් කරමින් ඒ බව විභාග දෙපාර්තමේන්තුවට දන්වා සිටිය යුතුය. (කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් ප්‍රවේශ පත්‍ර එවිය යුතු ෆැක්ස් අංකයද ඉහත විස්තර සමඟ ඉදිරිපත් කළ යුතුය).

ii. අයදුම්පතේ සහ විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. විභාගයට ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවකුම තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා, සහතික කරවා ගත යුතුය. තමාට නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේදී පමණක් විභාගයට පෙනී සිටීමට අවසර ලැබෙන අතර එසේ පෙනී සිටීමේදී ප්‍රථමයෙන් විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. එසේ ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.

11. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii) වලංගු රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේම තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

12. *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :*

ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වීමේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ ඇය රජයේ සේවයෙන් පහ කෙරේ.

13. අපේක්ෂකයකු හට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට ද විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

14. මෙහි සඳහන් නොවන වෙනත් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

15. මෙම සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පවතීනම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කළ යුතුය.

වෛද්‍ය එස්.එච්. මුණසිංහ,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2020 නොවැම්බර් මස 30 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශය.
අංක 385, සුවසිරිපාය,
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ආදර්ශ අයදුම්පත්‍රය

**සීමිත පදනම මත රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සේවයේ අධි ශ්‍රේණියට**
**උසස් කිරීම සඳහා වන තරග විභාගය - 2018 (2020)**

COMPETITIVE EXAMINATION FOR PROMOTION TO THE SUPERGRADE OF THE PUBLIC HEALTH MANAGEMENT SERVICE ON LIMITED BASIS - 2018 (2020)

විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යය

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(නිලධාරියා විසින්ම සම්පූර්ණ කළ යුතුය)

01. 1.1. සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්)෴..........................................................................................

1.2. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා (SILVA A.B. ෴...........................

1.3. සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) ෴...............................................................................'

02. 2.1. රාජකාරී ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)෴............................................................................

2.2. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)෴..................................................................................

2.3. ස්ථිර ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්)෴.......................................................................................

03. ස්ත්‍රී / පුරුෂ භාවය (අදාළ අංකය කොටුව තුළ ලියන්න) ෴

පුරුෂ - 1
ස්ත්‍රී - 0

04. ජාතික හැඳුනුම්පත් අංකය ෴

05. ජංගම දුරකථන අංකය ෴

06. උපන්දිනය ෴

වර්ෂය෴..................මාසය෴ .................. දිනය෴ ..................

07. 7.1. වර්තමාන සේවා ස්ථානය හා ලිපිනය෴...........................................................................

7.2. සේවයේ මුල් පත්වීම් දිනය හා පත්වීම් ලිපි අංකය෴...........................................................

7.3. වර්තමාන තනතුර ෴..................................................................................................

7.4 වර්තමාන තනතුරට අන්තර්ග්‍රහණය වූ දිනය෴...........................................................................
(අන්තර්ග්‍රහණ ලිපිය අමුණන්න)

7.5. සේවයේ II ශ්‍රේණියට උසස්කරන ලද දිනය෴.....................................................................

7.5.1. සේවයේ I ශ්‍රේණියට උසස්කරන ලද දිනය෴.....................................................................
(ලිපි අමුණන්න)

7.6. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කළ දිනය෴.....................................................

7.7. II ශ්‍රේණියට පත්වූ දින සිට අයදුම්පත් කැඳවීමේ අවසාන දින දක්වා සේවා කාලය ඃ

වර්ෂය ඃ …………….. මාසය ඃ……………… දින ඃ……………

7.7.1. I ශ්‍රේණියට පත්වූ දින සිට අයදුම්පත් කැඳවීමේ අවසාන දින දක්වා සේවා කාලය ඃ

වර්ෂ ඃ …………….. මාස ඃ……………… දින ඃ……………

7.8. අයදුම්පත් කැඳවන අවසාන දිනට වාර්ෂික ඒකාබද්ධ වැටුප ඃ…………………………

7.9. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිය සමත් වී ඇත/නැත ඃ

7.9.1. "ඇත" නම් එම උපාධිය බල පැවැත්වෙන දිනය ඃ……………………………

7.9.2. විශ්වවිද්‍යාලය/ ආයතනය ඃ…………………………………………………

7.9.3. උපාධිය ඃ…………………………………………………………………

7.10. 2015.10.31 දින සිට 2020.10.31 වන දින දක්වා උපයාගත් වැටුප් වර්ධක දිනයන් හා වාර්ෂික වැටුප් තල ඃ

| *වැටුප් වර්ධක දින* | *වාර්ෂික වැටුප් තල(රුපියල්)* |
|---|---|
| 01 | |
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |

7.11. ඉකුත් අවුරුදු 05 තුළ විනයානුකූල නීති යටතේ ඔබට විරුද්ධව ක්‍රියා කරනු ලැබ ඇත්ද?
……………………………………………………………………………………………………
එසේ නම් වරදේ සහ පනවන ලද දඬුවමේ ස්වභාවය සහ දඬුවම් කළ දිනය ආදියේ විස්තර දක්වන්න.(පිටපත් අමුණන්න)
……………………………………………………………………………………………………
……………………………………………………………………………………………………

08. වැටුප් රහිත නිවාඩු/ අඩ වැටුප් නිවාඩු ලබා ගෙන ඇත්නම් එම කාලවකවානු දින ගණන ☐

09. අයදුම්කරුගේ ප්‍රකාශය ඃ

…………………………………………… වන මා විසින් ඉහත සඳහන් කර ඇති සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. තවද මා විසින් සපයා ඇති ඉහත තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් මෙම ව්‍යවස්ථාවේ අධි ශ්‍රේණියට උසස් වීම් පිළිබඳ වූ මාගේ හිමිකම් නොසලකා හැරීමටද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම සත්‍ය වශයෙන් දනිමි.

දිනය ඃ ………………………… …………………………
නිලධරයාගේ අත්සන.

II කොටස

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/ ආයතන ප්‍රධානියාගේ සහතිකය

........................................................................................................................................ මහතා/මහත්මිය/මෙනවිය

1. රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I/ II ශ්‍රේණියේ නිලධරයකු බව,
2. අවම වශයෙන් සේවයේ වසර 08 ක නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බව, පූර්වාසන්න වසර 05 තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබෙන බව හා සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බව,
3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිය සමත් / අදාළ නැති බවත්,

4. (i). I/ II වන ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කරන ලද දිනය :

| | ගිණුම් ක්‍රම | කාර්යාල ක්‍රම |
|---|---|---|
| විභාගය පැවැත්වූ දිනය | | |
| විභාග අංකය | | |

(ii). දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කර ඇත/නැත

ඇත්නම් එම ලිපියේ යොමු අංකය හා දිනය:.........................................................................

5. (i) වැටුප් රහිත නිවාඩු /අඩ වැටුප් නිවාඩු ලබාගෙන ඇත්නම් එම කාලවකවානු/දින ගණන

(II ශ්‍රේණියට පත් කළ/උසස් කළ දින සිට).........................................................................

(ii) මොනයම් ආකාරයක හෝ දඬුවමකට/දඬුවම්වලට (අවවාද කිරීම් හැර) ලක් කර ඇත්නම් ඒ පිළිබඳ කෙටි විස්තරයක් සඳහන් කරන්න (යොමු අංකය ද සඳහන් කරන්න) .........................................................................

6. සංස්ථාවක හෝ වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය සඳහා නිලධාරියා/නිලධාරිණිය මුදා හැර සිටී නම් අදාළ කාල වකවානුව පිළිබඳ විස්තර: .........................................................................................

2020.10.31 දිනට සේවයේ I ශ්‍රේණියේ /II ශ්‍රේණියේ වසර 05 ක/ 08 ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති/ නැති බවත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිය සමත්/ අදාළ නැති බවත්, අවම වශයෙන් වසර 05ක/ වසර 08 ක සතුටුදායක හා සක්‍රීය සේවා කාලය සපුරා ඇති/නැති බවත්, ඉහත සඳහන් කළ සියලු කරුණු පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවත් රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සේවා ව්‍යවස්ථාව අනුව සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීම සඳහා නිලධාරියා/නිලධාරිණිය සියලුම සුදුසුකම් සපුරා ඇති බවත් නිර්දේශ කරමි. මෙම තනතුර සඳහා අයදුම්කරු තෝරාගතහොත් වර්තමාන තනතුරෙන් නිදහස් කිරීමට එකඟ වෙමි.

..............................,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම:....................................................................
පදවි නාමය:.........................................................
දිනය : ................................ (නිල මුද්‍රාව තබන්න)

12 - 333

## වාරිමාර්ග අමාත්‍යාංශය

### වාරිමාර්ග දෙපාර්තමේන්තුව

**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරග විභාගය - 2020**

වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට පැවැත්වෙන විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1. බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරු :

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *බඳවා ගන්නා ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | සැලසුම් ශිල්පී | 72 | පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් වසරක පුහුණුව සඳහා) |
| 2. | විදුම් සහකාර | 02 | පුහුණු කිරීමේ ශ්‍රේණිය (දෙවසරක පුහුණුව සඳහා) |
| 3. | පර්යේෂණ සහකාර (සාමාන්‍ය) | 01 | |
| 4. | සිවිල් ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂක | 11 | |
| 5. | පාංශු ප්‍රස්ථාරක | 01 | |
| 6. | ජල විද්‍යා සහකාර | 05 | |
| 7. | ජල විද්‍යා ක්ෂේත්‍ර සහකාර | 02 | |
| 8. | පර්යේෂණ සහකාර (ඉංජිනේරුමය ද්‍රව්‍ය) | 02 | |
| 9. | පස් සමීක්ෂක | 05 | |
| 10. | පර්යේෂණ සහකාර (ජල ශක්ති) | 02 | |
| 11. | යාන්ත්‍රික මූලික | 08 | III වන ශ්‍රේණියට බඳවා ගැනේ. එහෙත් බඳවා ගැනීමෙන් අනතුරුව මුල් මාස 06 තුළ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික වැඩපලක සේවාස්ථ පුහුණුවක් ලබා දෙනු ලැබේ. |

1.2. තනතුරුවල රාජකාරී ස්වභාවය :

| *අනු අංකය* | *තනතුරු නාමය* | *පැවරෙන කාර්යයන්* |
|---|---|---|
| 1. | සැලසුම් ශිල්පී | 1) ඉංජිනේරු කාර්ය මණ්ඩලය විසින් දෙනු ලබන නිර්මාණ සටහන්, මූලික පරාමිති, කෙටුම්පත් සටහන් ඇසුරෙන් විස්තරාත්මක සැලසුම්පත් පිළියෙළ කිරීම/පරීක්ෂා කිරීම : බිම් මැනුම් තලමිති මැනුම් ආශ්‍රයෙන් පිඹුරුපත්, සමෝච්ච රේඛා සිතියම්, දික්කඩ හරස්කඩ සැලසුම්පත් පිළියෙල කිරීම/පරීක්ෂා කිරීම, වාරිමාර්ග ව්‍යාපාරවල ඉඩම් කට්ටි කිරීමේ සැලසුම්පත්, ඉඩම් පවරා ගැනීමේ සැලසුම්පත්, මෙහෙයුම් නඩත්තු සැලසුම්පත් ආදිය පිළියෙල කිරීම/ පරීක්ෂා කිරීම.<br>2) ප්‍රමාණ ගණනය : ගාස්තු සඳහා මිල විශ්ලේෂණය : ප්‍රමාණ බිල්පත් පිළියෙල කිරීම/ පරීක්ෂා කිරීම.<br>3) වැඩ ඇස්තමේන්තු පරීක්ෂා කිරීම. වැඩ ඇස්තමේන්තු අනුසාරයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාල පෝරම, උප ලේඛනය පිළියෙල කිරීම/ පරීක්ෂා කිරීම : වැඩ සඳහා ගෙවීම් කිරීමට අදාල මිනුම් පොත්, ගෙවීම් බිල්පත්, අවසන් ගෙවීම් වාර්තා හා සැලසුම්පත් පරීක්ෂා කිරීම.<br>4) වාරිමාර්ග ව්‍යාපාරවල තාක්ෂණික මෙහෙයුම් හා මනා දත්ත පිළිබඳ ලේඛන නඩත්තුව : ප්‍රගති වාර්තා සටහන් පිළියෙල කිරීම/පරීක්ෂා කිරීම.<br>5) සැලසුම්පත්, පිඹුරුපත් සහ අනෙකුත් සැලසුම් කාර්යාලීය ලේඛන ද්‍රව්‍ය හා උපකරණවල භාරකාරත්වය හා නඩත්තුව.<br>විධායකය/කළමනාකරණය විසින් පවරනු ලබන අනෙකුත් සැලසුම් ශිල්පීමය රාජකාරී |

| අනු. අංකය | තනතුරු නාමය | පැවරෙන කාර්යයන් |
|---|---|---|
| 2. | විදුම් සහකාර | ■ මධ්‍යම හා මහා පරිමාණ ඉදිකිරීම් සඳහා භූමියේ ශක්තිමත්භාවය භූගත ජල කාන්දුවීම් ආදිය පරීක්ෂා කිරීමේ කටයුතු.<br>■ විශාල ඉදිකිරීම්වල අත්තිකාරම් සඳහා විවිධ ගැඹුරු මට්ටම්වලින් පාෂාණ හා පස් තට්ටුවල සාම්පල ලබා ගැනීම.<br>■ පාෂාණ ස්ථරවල කාන්දුවීම නැවැත්වීම හා ඒවා ශක්තිමත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.<br>■ නිම කරන ලද ඉදිකිරීම්වල සිමෙන්ති හා රසායනික ද්‍රව්‍ය කාවැද්දීම මඟින් ද මතුපිට යන්ත්‍ර මඟින් කොන්ක්‍රීට් ආස්තරණ යෙදීම මඟින්ද ජල කාන්දුවීම හා වෙනත් දුර්වලතාවලට පිළියම් යොදා ශක්තිමත් කිරීමේ කටයුතු කිරීම.<br>■ ඉහත කාර්යයන්ට අදාල වාර්තා ඉදිරිපත් කිරීම.<br><br>ඉහත කාර්යයන්ට අවශ්‍ය වන විදුම් යන්ත්‍ර,ජල පොම්ප හා වෙනත් උපකරණ ද ඒවාට අදාල ඩීසල් හා පෙට්‍රල් යන්ත්‍ර ක්‍රියාකරවීම, නඩත්තු කිරීම හා අලුත්වැඩියා කිරීම. |
| 3. | පර්යේෂණ සහකාර (සාමාන්‍ය) | 1) දැනට කෙරෙමින් පවතින හා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන වාරිමාර්ග හා වෙනත් සංවර්ධන ව්‍යාපෘතීන්හි ශක්‍යතා අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය වන පස් හා ජල සාම්පලවල භෞතික හා රසායන ගතිගුණ නිර්ණය සඳහා විශ්ලේෂණ කිරීම.<br>2) ද්‍රාවන හා ප්‍රතිකාරකයන් නිරවද්‍ය ලෙස පිළියෙල කිරීම,එදිනෙදා විශ්ලේෂණ කාර්යන්හිදී භාවිතා වන නවීන සූක්ෂම ඉලෙක්ට්‍රොනික් විද්‍යුත් හා විද්‍යුත් යාන්ත්‍රික උපකරණ නිසි ලෙස භාවිතා කිරීම, නිරවද්‍යව අංක ශෝධනය කිරීම හා මැනවින් නඩත්තු කිරීම,විශ්ලේෂණ මඟින් ලබා ගන්නා දත්තයන් සම්පාදනය කිරීම. |
| 4. | සිවිල් ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂක | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාරි ව්‍යාපෘති ඉදිකිරීම් සඳහා අවශ්‍ය ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂණ කටයුතු කිරීම,එම ක්ෂේත්‍රයේ ඉංජිනේරුමය ද්‍රව්‍ය සඳහා තත්ත්ව පාලන කටයුතුවල (පස් සහ කොන්ක්‍රීට් ද්‍රව්‍යන්හි ගතිගුණ හා ශක්තීන් පිළිබඳ) නිරතවීම හා එම ප්‍රමිතීන් සහතික කිරීම.<br><br>රාජ්‍ය හා පුද්ගලික ආයතනවල ඉල්ලීම මත කෙරෙන ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ඉංජිනේරුමය ද්‍රව්‍ය පර්යේෂණ කටයුතුවල නිරතවීම. |
| 5. | පාංශු ප්‍රස්ථාරක | ■ පාංශු සමීක්ෂණ හා පාංශු පරිශීලන සිතියම් ඒකාබද්ධ කිරීම හා රාශිභූත කිරීම.<br>■ ලබා දෙන්නා වූ දත්ත ආශ්‍රයෙන් සිතියම් ඇඳීම හා සිතියම් වර්ණ ගැන්වීම.<br>■ දළ පාංශු සිතියමට (Draft Soil Map) පාංශු සිතියම (Final Soil Map) පිළියෙල කිරීම.<br>■ ගුවන් ඡායාරූප ඉංජිනේරු මිනුම්පත් ආදිය ඇසුරෙන් ඉඩම් වර්ගීකරණ පාංශු හා ඉඩම් පරිහරණය ආදී සිතියම් පිළියෙල කිරීම. සිතියම් වර්ණ කිරීම හා ක්ෂේත්‍ර ඵලයන් ගණනය කිරීම, සිතියම් විශාල කර ඇඳීම සහ කුඩා කර ඇඳීම, විවිධ පස් පැතිකඩ හු දර්ශන ඇඳීම,මෙම අංශයෙන් නිකුත්කළ වාර්තාවලට රූප සටහන් ප්‍රස්ථාර ආදිය ඇඳීම,වර්ණ සිතියම් නිෂ්පාදනයට අවශ්‍ය දෑ පිළියෙල කිරීම.<br>■ පරිගණක ආශ්‍රිත මෘදුකාංග භාවිතයෙන් පාංශු සිතියම් පිළියෙල කිරීම. |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පැවරෙන කාර්යයන්* |
|---|---|---|
| 6. | ජල විද්‍යා සහකාර | ශ්‍රී ලංකාවේ දිවයින පුරා ජල ද්‍රෝණි හා ජලාශ ආශ්‍රිතව එක් රැස් කර ගන්නා වූ මූලික ජල විද්‍යාත්මක හා කාලගුණික දත්ත, විද්‍යාත්මක සිද්ධාන්ත ප්‍රායෝගිකව උපයෝගී කොට ගෙන ජල විද්‍යාත්මක අවශ්‍යතාවය සඳහා ගණනය කිරීම,විශ්ලේෂණය කිරීම, දත්ත පරිගණකගත කිරීම, පරිගණක භාවිතයෙන් විශ්ලේෂණය කිරීම, දෛනික, මාසික, වාර්ෂික හා දිගුකාලීන වාර්තා පිළියෙල කිරීම හා පවත්වාගෙන යාම,මහජනතාවට හා අදාළ ආයතනවලට එම තොරතුරු පිළියෙල කිරීම.<br><br>■ එක් රැස් කර ගන්නා ජල විද්‍යාත්මක හා කාලගුණ දත්තවල නිරවද්‍යතාව ආරක්ෂා කිරීම හා ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම සහ සහතික කර දත්ත බැංකුව නිරතුරුව පවත්වාගෙන යාම.<br>■ ගංගාවල ගංවතුර මට්ටම ඉහල යාම නිර්ණය කිරීම සඳහා අවශ්‍ය දත්ත ලබාගෙන පරිගණකගත කිරීම හා නව ගණිතමය මාදිලි භාවිතයෙන් ගංවතුරට ලක්විය හැකි ප්‍රදේශ අධ්‍යයන කිරීම.<br>■ ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් ගංවතුර හානි මට්ටම් හා එම හානිවලට ලක්විය හැකි ප්‍රදේශ මිනුම්ගත කිරීම හා සිතියම් ගත කිරීම.<br>■ එම ප්‍රධාන ගංගාවල එවැනි ගංවතුරක් ඇතිවිය හැකි හෝ ඊට ආසන්න වන සෑම අවස්ථාවකදීම එම දත්ත නිරතුරුවම ලබා ගැනීම හා ඒ අනුව අනතුරු ඇඟවීම. |
| 7. | ජල විද්‍යා ක්ෂේත්‍ර සහකාර | ජල විද්‍යා අංශය මගින් තෝරා ගත් ගංගා නිම්න සඳහා ජල විද්‍යා ක්ෂේත්‍ර මිනුම් ඒකක පවත්වා ගෙන යාම හා අවශ්‍ය වන කාලගුණ දත්ත, වර්ෂාපතනය, ගංගා වල ගලා යන ජල මට්ටම සහ අවට ඇති වැව්වල ජල ධාරිතාවන්හි වෙනස්වීම් ආදිය පිළිබඳ දත්ත එක් රැස් කිරීම.<br>■ එසේ ලබා ගන්නා ලද සියළුම ජල විද්‍යා හා කාලගුණ දත්ත පරීක්ෂා කර ලේඛන ගත කිරීම සඳහා මාසය අවසානයේ දී ප්‍රධාන කාර්යාලට ඉදිරිපත් කිරීම.<br>■ ගංගාවල හා අතු ගංගාවල එම ජල මට්ටම පවතින අවස්ථාවලදී ගලා යන ජල ධාරිතාවය මිනුම් ගැනීම.<br><br>ගංවතුර අනතුරක් ඇති විය හැකි අවස්ථාවලදී හෝ ඊට ආසන්න අවස්ථාවේදී ඒ සඳහා අනතුරු ඇඟවීම අවශ්‍ය වන ක්ෂේත්‍ර දත්ත නිරතුරුවම ප්‍රධාන කාර්යාලයට වාර්තා කිරීම, ප්‍රධාන ගංවතුර අවස්ථාවලදී එම වේලාවන් සමග ගංවතුර මට්ටම් වෙනස්වීම් සටහන් කර ගැනීම. |
| 8. | පර්යේෂණ සහකාර (ඉංජිනේරුමය ද්‍රව්‍ය) | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාරි ව්‍යාපෘතීන් ඉදිකිරීම් සඳහා අවශ්‍ය ඉංජිනේරුමය ද්‍රව්‍යවල යෝග්‍යතාව පිළිබඳව දී ඇති පිරිවිතරවලට අනුව පර්යේෂණ කටයුතුවල නිරත වීම හා පර්යේෂණාත්මක සාධක මත ප්‍රමිතීන් සහතික කිරීම,එම ක්ෂේත්‍රයේ ඉංජිනේරුමය ද්‍රව්‍ය සඳහා තත්ත්ව පාලන කටයුතුවල (පස් සහ කොන්ක්‍රීට් ද්‍රව්‍යයන්හි ගතිගුණ හා ශක්තීන් පිළිබඳ) සේවයේ අවශ්‍යතාව මත නිරත වීම.<br>රජයේ හා පුද්ගලික ආයතන වල ඉල්ලීම් මත කෙරෙන ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ඉංජිනේරුමය ද්‍රව්‍ය පර්යේෂණ කටයුතුවල නිරත වීම හා එම ප්‍රමිතීන් සහතික කිරීම. |

| අනු අංකය | තනතුරු නාමය | පැවරෙන කාර්යයන් |
|---|---|---|
| 9. | පස් සමීක්ෂක | 1) දැනට කෙරෙමින් පවතින හා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන වාරිමාර්ග හා වෙනත් සංවර්ධන ව්‍යාපෘතීන්හි මෙම අංශය මඟින් සිදු කරනු ලබන පස් සමීක්ෂණ කටයුතු ඉඩම් පරිහරණ කටයුතු සඳහා අවශ්‍ය වන ක්ෂේත්‍ර දත්ත හා අනෙකුත් දත්ත ලබා ගැනීම සහ අන්තර්ජාතික වර්ගිකරණයට අනුකූලව එක් එක් පස් වර්ග වර්ගිකරණය කිරීම.<br>2) පස නිර්මාණය වීමේ සාධක (දේශගුණය, භූ විෂමතාවය භූ විද්‍යාත්මක කරුණු යනාදිය) සැලකිල්ලට ගනිමින් ඒ ඒ පාංශු ගණ හෝ ශ්‍රේණිවල පිහිටීම හා පැතිරීම තීරණය කිරීම.<br>3) අන්තර්ජාතික සම්මතයන්ට අනුකූලව පාංශු පැතිකඩයන්හි සවිස්තරාත්මක සටහනක් සකස් කිරීම සඳහා අවශ්‍ය වන පරිද්දෙන් පාංශු නියැදි ලබා ගැනීම. එම පාංශු නියැදි විශ්ලේෂණය සඳහා රසායානාගාරයට භාර දීම,එම විශ්ලේෂණ දත්ත හා ක්ෂේත්‍ර නිරීක්ෂණ දත්ත පදනම් කරගනිමින් අවසාන පාංශු සිතියම්හි නිරවද්‍යතාවය තහවුරු කරගැනීම සහ පාංශු යතුර පිළියෙල කර ගැනීම.<br>4) අදාළ ප්‍රදේශ වල ගුවන් ඡායාරූප ත්‍රිමානේක්ෂය උපයෝගී කරගනිමින් ගුවන් ඡායාරූප විශ්ලේෂණය කිරීම.<br>5) දත්ත අවශ්‍ය වන තීව්‍රතාවය අනුව පාංශු සමීක්ෂණ කටයුතු සිදු කර ක්ෂේත්‍ර දත්ත ලබා ගැනීම,පස් පැතිකඩ අනුව පස් වර්ග හඳුනා ගැනීම.<br>6) ක්ෂේත්‍රයේදී ලබාගන්නා වූ නිරීක්ෂණ දත්ත මත දළ පාංශු සිතියම (Draft Soil Map) පිළියෙල කිරීම සහ පෙන්ටොග්‍රාස් යන්ත්‍රය භාවිත කරමින් අවශ්‍ය පරිමාණයට සකස් කිරීම.<br>7) ක්ෂේත්‍රයේදී ලබාගන්නා වූ නිරීක්ෂණ දත්ත හා අන්තර්ජාලය උපයෝගී කරගෙන ඉඩම් පරිහරණ සිතියම් පිළියෙල කිරීම.<br>8) ජී.පී.එස්. (Global Position System) උපකරණ මඟින් දත්ත ලබාගැනීම.<br>9) පසේ ජල සන්නායකතාව පිළිබඳ දත්ත ලබා ගැනීම.<br>10) ක්ෂේත්‍රයේදී ක්ෂේත්‍ර කම්කරු මුරකරු සහ රියදුරන්ගේ පාලන කටයුතු (අධීක්ෂණ කටයුතු) සිදු කිරීම සහ ඔවුන්ගේ මූල්‍යමය රාජකාරී කටයුතු ඍජුවම සිදු කිරීම. |
| 10. | පර්යේෂණ සහකාර (ජල ශක්ති) | ජල ශක්ති අංශයේ ඉංජිනේරුවරුන්ගේ කටයුතුවලට සහය වීම, ජල ශක්ති අංශයට අදාළ ඉදිකිරීම් වැඩවලට සියලුම ක්ෂේත්‍ර කටයුතු උපකරණ,ද්‍රව්‍ය,කම්කරු පාලනය,ජලශක්ති ආදර්ශන මෙහෙය වීම, ගොඩනැගිලි හා අනෙකුත් යටිතල පහසුකම් නඩත්තුව,ජල ශක්ති අංශයේ ඉදිකිරීම් වැඩවලට අදාළ ඇස්තමේන්තු,සැලසුම්පත් සකස් කිරීම,දෙපාර්තමේන්තුවට අදාළ සියලුම යාන්ත්‍රික හා ඉලෙක්ට්‍රොනික උපකරණ අලුත්වැඩියාවන්ට සම්බන්ධ වීම,එම උපකරණ මිලදී ගැනීමට අදාළ පිරිවිතර සකස් කිරීම සහ ඒවා මිලදී ගැනීමේදී හා තත්ත්ව වාර්තා සකස් කිරීමේදී අදාළ කටයුතුවලට සහාය වීම. |
| 11. | යාන්ත්‍රික මූලික | සුළු සේවකයින් පාලනය කිරීමේදී සහ රථ වාහන, යන්ත්‍ර ආදිය සඳහා ලදුපත් පිළියෙල කිරීමේදී යාන්ත්‍රික ඉංජිනේරුවරයාට සහය වීම, තාක්ෂණ සහායක (යාන්ත්‍රික) හෝ වැඩ ලිපිකරු සමඟ වැඩ ආරම්භ කිරීම, ගබඩා භාරකරු නොමැති අවස්ථාවලදී අලුත්වැඩියාව සඳහා පැමිණෙන අයිතමයන් තමන් භාරයට ගැනීම, අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය අමතර කොටස් ආයුධ සහ ද්‍රව්‍ය ආදිය ලබා ගැනීම,ගබඩා පොත් නඩත්තු කිරීම, ඇස්තමේන්තු පිළියෙල |

| අනු අංකය | තනතුරු නාමය | පැවරෙන කාර්යයන් |
|---|---|---|
| | | කිරීමේදී යාන්ත්‍රික ඉංජිනේරුවරයාට සහය වීම, අලුත්වැඩියා කිරීමෙන් පසු නිසි පරිදි ආපසු භාර දීම සහ අබලි අමතර කොටස් ද්‍රව්‍ය සහ භාණ්ඩ ආපසු ගබඩාවට භාරදීම කරන ලද අලුත්වැඩියාවන් ලොග් පොත්වල ඇතුළත් කිරීම,තාක්ෂණ සහායක (යාන්ත්‍රික) හෝ පිරිවැය ලිපිකරු සමඟ මුළු පිරිවැය (බිල්පත්) පිළියෙල කිරීම,පාවිච්චි කරන ලද අමතර කොටස් ඉන්ධන ලිහිසි තෙල් සහ අනෙකුත් දේ වෙනුවෙන් ද්‍රව්‍ය වාර්තාව ඉදිරිපත් කිරීම.<br><br>අලුත්වැඩියාවලට යාන්ත්‍රික වැඩපලට රැගෙන එන යන්ත්‍ර හා වාහන, ගබඩා භාරකරුගෙන් යාන්ත්‍රික වැඩපලට භාරගෙන, අලුත්වැඩියාව නිම වීමෙන් පසු නැවත ගබඩා භාරකරු වෙත භාර දීම. |

2. *බඳවා ගැනීමේ ක්‍රමය :*

2.1. වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින් පවත්වනු ලබන ලිඛිත තරඟ විභාගයක ප්‍රතිඵල අනුව පිරවීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

2.2. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය අයදුම්කරුවන්ගේ ශාරීරික යෝග්‍යතාවය හා සහතික පත්‍ර පරීක්ෂා කර බැලීම සඳහා වන අතර , සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

3. *වැටුප් පරිමාණය :*

පුහුණු කිරීමේ ශ්‍රේණිය - රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව පළමු වසර පුහුණුව සඳහා රු. 27140/- ක හා දෙවන වසර පුහුණුව සඳහා රු. 27440/- ක මාසික දීමනාවක් හිමි වේ.

III වන ශ්‍රේණිය - රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛණ I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 31,040-10X445-11X660-10X730-10X750- රු.57,550/- වේ. (MN3 -2016)

4. සේවා ගණය - අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික

4.1. ශ්‍රේණි- III ශ්‍රේණිය
II ශ්‍රේණිය
I ශ්‍රේණිය

4.2. තනතුරෙහි ස්වභාවය - III ශ්‍රේණියේ පත්වීම ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. අදාළ විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය.

5. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :*

5.1. පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කර ගනු ලබන අයදුම්කරුවන් අදාළ පුහුණු කාලසීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්වනු ලබන විභාගය සමත් බවට නිකුත් කරනු ලබන සහතිකය ඉදිරිපත් කිරීමෙන් පසු සේවයේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

5.2. පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත් වීමට අපොහොසත් වන ආධුනිකයින් වෙතොත් ඔවුනට මාස 06 කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාලසීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන ආධුනිකයන්ගේ සේවය අවසන් කරනු ලැබේ.

5.3. III ශ්‍රේණියේ පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ. III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

5.4. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 අනුව තනතුරට බැඳී වසර 03 ක් ඇතුළත තමන්ට නියමිත අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව අදාළ ප්‍රවීනතාවය ලබා ගත යුතුය.

5.5. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යපරිපාටික රීතිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග වලටද මෙම පත්වීම යටත් වේ.

5.6. තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ දුෂ්කර ප්‍රදේශවල පිහිටි වාරිමාර්ග ක්ෂේත්‍රයේ වැඩබිම්වල සේවයේ යෙදීමට හැකියාව තිබිය යුතුය.

6. *වයස් සීමාව* :
අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර,උපරිම වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

7. *අවශ්‍ය සුදුසුකම්* :

7.1. අධ්‍යාපන සුදුසුකම් :

7.1.1. සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව ,ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හය (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

7.1.2. සැලසුම් ශිල්පී,විදුලි සහකාර,සිවිල් ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂක,පාංශු ප්‍රස්ථාරක, ජල විද්‍යා සහකාර, ජල විද්‍යා ක්ෂේත්‍ර සහකාර, පර්යේෂණ සහකාර(ඉංජිනේරුමය ද්‍රව්‍ය), පර්යේෂණ සහකාර (ජල ශක්ති), යාන්ත්‍රික මූලික යන තනතුරු සඳහා

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ව්‍යවහාරික ගණිතය/ශුද්ධ ගණිතය/සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව සහිතව විද්‍යා විෂයන් තුනකින් (03) එකවර සමත්ව තිබීම

7.1.3. පර්යේෂණ සහකාර (සාමාන්‍ය) සහ පස් සමීක්ෂක තනතුරු සඳහා -

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ තවත් එක් විද්‍යා හෝ ගණිත විෂයක් සහිතව විද්‍යා විෂයයන් තුනකින් (03) එකවර සමත්ව තිබීම.

7.2. *වෘත්තීය සුදුසුකම්* :

සැලසුම් ශිල්පී තනතුර සහ යාන්ත්‍රික මූලික තනතුර සඳහා ඉහත 7.1 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව පහත සඳහන් වෘත්තීය සුදුසුකම් තිබිය යුතුය :-

සැලසුම් ශිල්පී -

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණකර අදාල සහතිකය ලබා තිබීම.

යාන්ත්‍රික මූලික -

I. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව;

හෝ

II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව;

හෝ

III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව;

හෝ

IV. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව ලබා තිබීම;

හෝ

V. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම;

හෝ

VI. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;

හෝ

VII. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

7.3. *කායික සුදුසුකම් :*

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.4. *වෙනත් සුදුසුකම් :*

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
III. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරණ කිසිඳු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.
IV. සේවයට බඳවා ගැනීම සඳහා වන තරඟ විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

8. *සාවද්‍ය තොරතුරු සැපයීම :*

මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව හෝ බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාල ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

9. *විභාග පරිපාටිය :*

විභාගය විෂයයන් දෙකකින් යුත් ලිඛිත පරීක්ෂණයකි. මෙම විභාගය සිංහල සහ දෙමළ මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 03 | 100 | 40 |

9.1. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

1. බුද්ධි පරීක්ෂණය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූල භාවයත් සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත් තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත වේ. |

2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය ඃ

■ සැලසුම් ශිල්පී තනතුර සඳහා -

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | දෙන ලද නිර්මිතයක ප්‍රමාණය ගණනය කිරීම සහ ඉදිකිරීම් ද්‍රව්‍යවල ගුණාත්මක ස්වභාවය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සහ ඇඳීමේ මූල ධර්ම පාවිච්චි කර දෙන ලද සටහන් අනුව වස්තුවක හෝ කොටසක හරස්කඩක් සහ පෙර හෝ පසු පෙනුමක් ඇඳීම. |

■ සිවිල් ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂක/විදුම් සහකාර/පර්යේෂණ සහකාර (ඉංජිනේරුමය ද්‍රව්‍ය)/පර්යේෂණ සහකාර (ජල ශක්ති)/පාංශු ප්‍රස්ථාරක තනතුරු සඳහා -

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | වීජ ගණිතය, ජ්‍යාමිතිය, ත්‍රිකෝණමිතිය, ද්‍රව සහ ද්‍රවවල භෞතික ගුණ, ද්‍රවස්ථිති විද්‍යාව,මිනුම් ඒකක,පරිමාණ සිතියම් කියවීම,විද්‍යාත්මක ගණනය කිරීම ආදී විෂයයන් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. |

■ පස් සමීක්ෂක /පර්යේෂණ සහකාර (සාමාන්‍ය) තනතුර සඳහා -

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | I කොටස (භෞතික විද්‍යාව)<br>a) ආලෝකය<br>b) තාපය<br>c) යන්ත්‍ර විද්‍යාව<br>d) විද්‍යුතය හා චුම්භකත්වය<br><br>II කොටස (රසායන විද්‍යාව)<br>a) කාබනික රසායනය<br>b) ප්‍රමාණාත්මක හා ගුණාත්මක විශ්ලේෂණය<br>c) අකාබනික රසායනය<br>d) සාමාන්‍ය රසායන විද්‍යාව |

■ ජල විද්‍යා ක්ෂේත්‍ර සහකාර /ජල විද්‍යා සහකාර තනතුර සඳහා

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | ඛණ්ඩාංක ජ්‍යාමිතිය,ගති විද්‍යාව, ස්ථිති විද්‍යාව, ත්‍රිකෝණමිතිය, ද්‍රවස්ථිති විද්‍යාව, සංඛ්‍යානය,යාන්ත්‍ර විද්‍යාව,ආලෝකය (වර්තනය සහ පරාවර්තනය පිළිබඳ නියමයන්) තාපය, ආද්‍රතාවය,විදුලිය, ඉලෙක්ට්‍රොනික විද්‍යාව ආදී විෂයයන් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්ණ වලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. |

- යාන්ත්‍රික මූලික තනතුර සඳහා -

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | ඇඳීමේ මූලධර්ම පාවිච්චි කරගෙන දෙන ලද රූපසටහන් අනුව යන්ත්‍රයක හෝ කොටසක හරස්කඩක් හෝ පෙර හෝ පසු පෙනීමක් ඇඳීම සහ භෞතික විද්‍යාව, යාන්ත්‍රික විද්‍යාව හා ව්‍යවහාරික ගණිතය යන විෂයයන් පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්න පත්‍ර පිළියෙල කරනු ලැබේ. |

9.2. මෙම විභාගය 2021 පෙබරවාරි මස කොළඹ දිස්ත්‍රික්කය තුළදී සහ තෝරා ගත් දිස්ත්‍රික්ක කිහිපයකදී පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීම පිළිබඳ අවසන් තීරණය වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් සතු වන්නේය.

10. *අයදුම්පත් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම :*

10.1. මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සෙ.මී 21X29 ( ඒ4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම්පත්‍රය සකස් කර ගත යුතුය. අංක 1 සිට 6 දක්වා ශීර්ෂ 01 පිටුවේද, අංක 7 සිට 11 දක්වා 02 පිටුවේද ,අංක 12 සිට 15 දක්වා 03 පිටුවේද, අංක 16, 04 පිටුවේද ඇතුළත් වන පරිදි ඉල්ලුම් පත්‍රය සැකසිය යුතුය.

10.2. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ද රාජ්‍ය සංස්ථා පළාත් පාලන ආයතන ආදියේ සේවයේ නියුතු වූවන් සිය ආයතන ප්‍රධානීන් මඟින් ද නියමිත දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතු වේ.

10.3. අයදුම්පත් සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන්ය.

10.4. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිඳු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10.5. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේ දී අස්ථාන ගත වන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිඳු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

10.6. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

10.7. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙලවරේ ඔබ ඉල්ලුම් කරන තනතුර අනුව " වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ .............................. තනතුරට බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

10.8. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

10.9. මෙම පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ පුරප්පාඩු වලින් කොටසක් පිරවීම හා අනෙකුත් සියලුම කරුණු පිළිබඳව අවසන් තීරණය වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් සතු වන්නේය.

11. *අයදුම්පත් යොමු කිරීම :*
සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2021 ජනවාරි මස 10 වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
230, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

12. *විභාගයට පෙනී සිටීම* :
විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු විභාග මධ්‍යස්ථානයේ විභාග ශාලාධිපතිට තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදීම විභාගයට පෙනී සිටිය යුතුය.

13. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය* :
විභාග ශාලාවේදී තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

14. මෙම ගැසට් නිවේදනයේ සිංහල,දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

ඉංජි.කේ.ඩී.නිහාල් සිරිවර්ධන,
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්

2020 දෙසැම්බර් 04 දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 07

**ආදර්ශ අයදුම්පත්‍රය**

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරඟ විභාගය - 2020

[ ]
කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

1. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 1 [ ]
දෙමළ - 2
(අදාල කොටුව තුළ ලියන්න)

2. අයදුම්කරනු ලබන තනතුරු නාමය : ..........................................................................................
(එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය)

3. මුලකුරු සමඟ නම (මුලකුරු අගට යොදා) : (මයා/මිය/මෙනෙවිය)

සිංහලෙන් / දෙමළෙන් : ..........................................................................................
ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) : ..........................................................................................
(උදා. PERERA, A. B. C)

3.1. සම්පූර්ණ නම :
සිංහලෙන් / දෙමළෙන්: ..........................................................................................
..........................................................................................
ඉංග්‍රීසි (කැපිටල් අකුරින්): ..........................................................................................
..........................................................................................

4. ජාතික හැඳුනුම්පත් අංකයඃ

5. ස්ත්‍රී /පුරුෂ භාවය (අදාල කොටුව තුළ ලියන්න)
පුරුෂ - M
ස්ත්‍රී - F

6. ස්ථිර ලිපිනය : (පැහැදිලි අකුරින්)
සිංහලෙන්/ දෙමළෙන් : ................................................................................................................................................
................................................................................................................................................
ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) : ................................................................................................................................................
................................................................................................................................................

6.1. ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :
සිංහලෙන්/ දෙමළෙන් : ................................................................................................................................
ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) : ................................................................................................................................

7. දුරකථන අංකය : ස්ථාවර : .......................................... ජංගම : ..................................................

8. පදිංචිය :

8.1. පදිංචි දිස්ත්‍රික්කය :................................................................
8.2. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය : .................................................................

9. විවාහක / අවිවාහක බව :
අවිවාහක - 1 විවාහක - 2

10. උපන් දිනය :

වර්ෂය මාසය දිනය

10.1. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට (2021.01.10 දිනට ) වයස :

අවුරුදු මාස දින

11. අධ්‍යාපන සුදුසුකම් :

11.1. අ.පො.ස (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර :

I. විභාගයේ වර්ෂය හා මාසය : .......................................................
II. විභාග අංකය : .......................................................
III. ප්‍රතිඵල :

| | *විෂය* | *ශ්‍රේණිය* | | *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|---|---|
| 1. | | | 6. | | |
| 2. | | | 7. | | |
| 3. | | | 8. | | |
| 4. | | | 9. | | |
| 5. | | | 10. | | |

11.2. අ.පො.ස (උ/පෙළ) විභාගය පිළිබඳ විස්තර :

I. විභාගයේ වර්ෂය හා මාසය : ........................................................
II. විභාග අංකය : ........................................................
III. ප්‍රතිඵල :

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |

12. වෘත්තීය සුදුසුකම් :

| හදාරා ඇති පාඨමාලාව | පිරිනමනු ලැබූ ආයතනය | හදාරා ඇති කාල සීමාව | සහතික පත් අංකය හා වලංගු දිනය |
|---|---|---|---|
| | | | |

13. ඔබ කවදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියක් වරදකරු කරනු ලැබ තිබේද?
(අදාළ කොටුවේ X ලකුණ යොදන්න)

ඔව් ☐ නැත ☐

13.1. "ඔව්" නම් විස්තර සඳහන් කරන්න.
.......................................................................................................................................................
.......................................................................................................................................................

14. අයදුම්කරුගේ සහතිකය :
......................................................................................... වන මම මෙහි සඳහන් කරන සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබ හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත්, තනතුර අතහැර ගිය අයෙකු සේ සලකා නොමැති බවත් සහතික කරමි. මෙහි ඇතුළත් කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත් සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු කිරීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්ත්වයක් අනාවරණය වුවහොත් කිසිඳු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මම දනිමි.මා මෙම තනතුරට තෝරා පත් කර ගනු ලැබුවහොත් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක වාරිමාර්ග ක්ෂේත්‍රයේ වැඩ බිම් වල රාජකාරී කිරීමට එකඟ වෙමි.

.................................
දිනය : ..................................... අයදුම්කරුගේ අත්සන.

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :
මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................................................................... මයා/මිය/මෙනෙවිය , මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ ඇය ..............................වැනි දින මා ඉදිරිපිටදී ඉහත 14 ඡේදය යටතේ අත්සන් තබන ලද බවත් සහතික කරමි.

දිනය : ..............................................

සහතික කරන නිලධාරියාගේ නම : ....................................................
තනතුර : ....................................................
ලිපිනය : ....................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

16. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/ ආයතන ප්‍රධානියාගේ සහතිකය : (දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

................................................. මයා/මිය/මෙනෙවිය .................................................සේවයේ නියුතු ....................................................... තනතුර දරණ නිලධාරියෙකු බවත්, ඔහු/ඇය ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා ඔහු /ඇය තෝරා ගනු ලැබුවහොත්, .......................................සේවයෙන් ඔහු/ ඇය මුදා හැරිය හැකි /නොහැකි බවත් වැඩි දුරටත් දන්වා සිටිමි.

දිනය : ..........................................

12-371

---

## ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා ක්ෂේත්‍රගත /කාර්යාලගත - ඛණ්ඩ 2 සේවා ගණයේ (MN-05-2016) තනතුරු සඳහා වන බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2020/2021

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා ක්ෂේත්‍රගත /කාර්යාලගත - ඛණ්ඩ 2 (MN-05-2016) සේවා ගණයට අදාළ පහත දක්වා ඇති තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. අදාළ පුරප්පාඩු තනතුරු පහතින් දැක්වෙන අතර, පහත දක්වා ඇති ආකෘතිය අනුව පිළියෙල කළ අයදුම්පතක් 2021.01.13 දිනට හෝ එදිනට පෙර විභාග කොමසාරිස් ජනරාල් වෙත ලැබෙන සේ එවිය යුතුය. මෙම විභාගය 2021 මාර්තු මස කොළඹ නගරයේදී පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල්දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

| | | | |
|---|---|---|---|
| 01. | ප්‍රාදේශීය ගවේෂක | - | 04 |
| 02. | ප්‍රාදේශීය කැණීම් හා කෞතුකාගාර නිලධාරී | - | 02 |
| 03. | ප්‍රාදේශීය සංරක්ෂක | - | 05 |
| 04. | ප්‍රාදේශීය නඩත්තු කළමනාකරු | - | 02 |

01. *බඳවා ගැනීමේ ක්‍රමය* : නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් ලිඛිත විභාගය සමත්, අදාළ සුදුසුකම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයන්ගේ ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව සහ ඉල්ලුම් කර ඇති තනතුරු අනුපිළිවෙළ අනුව එක් එක් තනතුරේ පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවා අධ්‍යාපන සුදුසුකම් හා ශාරීරික යෝග්‍යතාව සනාථ කර ගැනීමෙන් පසු බඳවා ගනු ලැබේ.

02. ලිඛිත විභාගය : මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර වලින් සමන්විත වේ.

I. පුරාවිද්‍යාව
II. ශ්‍රී ලංකාවේ ඉතිහාසය

*සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය* .- ලිඛිත විභාගයේ සියලු ප්‍රශ්න පත්‍රවලට අයදුම්කරුවන් පෙනී සිටිය යුතු අතර, සමත් වීම සඳහා එක් එක් විෂයයට 40% ක් වූ අවම ලකුණු ලබාගත යුතුය. විභාගය සමත් අයදුම්කරුවන් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව සහ ඉල්ලුම් කර ඇති තනතුරු අනුපිළිවෙළ අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. මෙම සම්මුඛ පරීක්ෂණයේදී අධ්‍යාපන සුදුසුකම් හා ශාරීරික යෝග්‍යතාව සනාථ කරගනු ලබන අතර ඒ සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි .-* මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතුය. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද 2016.09.01 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත- බණ්ඩ 2 සේවා ගණයේ (MN-05-2016) තනතුරු සඳහා වන බඳවාගැනීමේ පරිපාටියට අදාළ සියලු කොන්දේසි වලටද පසුව 2019.07.04 දිනැතිව අනුමත කරන ලද සංශෝධනවලට ද එම බඳවාගැනීමේ පරිපාටියට කර ඇති හෝ මින් මතු කෙරෙන සංශෝධනවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙහි ක්ෂේත්‍රගත/ කාර්යාලගත - බණ්ඩ 2 සේවා ගණයේ II වැනි ශ්‍රේණියේ තනතුරකට පත්කරනු ලැබේ.

3.1 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරී නියමිත දිනයේදී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද රාජකාරියෙහි හෝ පත්කරන ලද ප්‍රදේශයක රාජකාරී භාරගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබීමට ඉඩ ඇත.

04. *මාසික වැටුප් පරිමාණය :*

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු.34,605 -10x660 - 11 x 755 -15x930- 63,460/-(MN-05-2016) වේ.ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

(පත්වීම් දින සිට වසර 03 ක් ඇතුළත 1 වැනි කාර්යක්ෂමතා කඩඉම සහ I පන්තියේ පත්වීම් දින සිට වසර 05 ක් ඇතුළත 2 වැනි කාර්යක්ෂමතා කඩඉමද සමත් විය යුතුය. පත්වීම් ලබා වසර 05 ක් ගතවීමට පෙර 2007.05.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 පරිදි අදාළ මට්ටමේ රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය.)

05. *සෞඛ්‍යය :*
අපේක්ෂකයා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි වන පරිදි මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

06. *සුදුසුකම් :*
මේ සඳහා පෙනී සිටින අපේක්ෂකයකු -

I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
II. (අ) ප්‍රාදේශීය ගවේෂක තනතුර සඳහා-

* අධ්‍යාපන සුදුසුකම් ලෙස,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන,

(i) පුරාවිද්‍යාව පිළිබඳව විශේෂ (සිව්වසරක) උපාධියක්,
හෝ
(ii) උපාධියක් සමග එක් අවුරුද්දකට නොඅඩු පුරාවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්,
හෝ
(iii) උපාධියක් සමග විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පිරිනමන එක් අවුරුදු පුරාවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාවට සමාන හෝ ඊට ඉහළ අධ්‍යාපන සුදුසුකමක් ලබා තිබීම.

* පළපුරුද්ද ලෙස,

(i) ඉහත අධ්‍යාපන සුදුසුකම් සහිතව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත සේවා ගණය යටතේ වන ගවේෂණ විෂය ක්ෂේත්‍රයට අයත් ගවේෂණ නිලධාරී / පුරාවිද්‍යා පර්යේෂණ නිලධාරී තනතුරක හෝ සංවර්ධන නිලධාරී යන තනතුරක වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියකු වීම.
හෝ
(ii) ඉහත අධ්‍යාපන සුදුසුකම් අදාළ නොවන පරිදි පළපුරුද්ද ලෙස පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර තාක්ෂණ නොවන බණ්ඩ 02 සේවා ගණයේ (MN-01) ගවේෂණ සහකාර තනතුරේ I ශ්‍රේණියේ වසර 02ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ I ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

(ආ) ප්‍රාදේශීය කැණීම් හා කෞතුකාගාර නිලධාරී තනතුර සඳහා -

* අධ්‍යාපන සුදුසුකම් ලෙස

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන,

(i) පුරාවිද්‍යාව පිළිබඳව විශේෂ (සිව්වසරක) උපාධියක්

හෝ

(ii) උපාධියක් සමග එක් අවුරුද්දකට නොඅඩු පුරාවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්

හෝ

(iii) උපාධියක් සමග විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පිරිනමන එක් අවුරුදු පුරාවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාවට සමාන හෝ ඊට ඉහළ අධ්‍යාපන සුදුසුකමක් ලබා තිබීම.

* පළපුරුද්ද ලෙස,

(i) ඉහත අධ්‍යාපන සුදුසුකම් සහිතව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත සේවා ගණය යටතේ වන කැණීම් හා කෞතුකාගාර විෂය ක්ෂේත්‍ර අයත් කැණීම් නිලධාරී / කැණීම් හා කෞතුකාගාර නිලධාරී / පුරාවිද්‍යා පර්යේෂණ නිලධාරී තනතුරක හෝ සංවර්ධන නිලධාරී යන තනතුරක වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියකු වීම.

හෝ

(ii) ඉහත අධ්‍යාපන සුදුසුකම් අදාළ නොවන පරිදි පළපුරුද්ද ලෙස පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර තාක්ෂණ නොවන ඛණ්ඩ 02 සේවා ගණයේ (MN-01)කැණීම් සහකාර / කැණීම් හා කෞතුකාගාර සහකාර තනතුරේ I ශ්‍රේණියේ වසර 02ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ I ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

(ඇ) ප්‍රාදේශීය සංරක්ෂක තනතුර සඳහා-

* අධ්‍යාපන සුදුසුකම් ලෙස

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන,

(i) වාස්තු විද්‍යාව හෝ වාස්තු විද්‍යා සංරක්ෂණය පිළිබඳ උපාධියක්

හෝ

(ii) ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පී ආයතනයේ පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

* පළපුරුද්ද ලෙස,

(i) ඉහත අධ්‍යාපන සුදුසුකම් සහිතව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත සේවා ගණය යටතේ වන සංරක්ෂණ විෂය ක්ෂේත්‍රයට අයත් පුරාවිද්‍යා පර්යේෂණ නිලධාරී තනතුරක වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියකු වීම.

හෝ

(ii) ඉහත අධ්‍යාපන සුදුසුකම් අදාළ නොවන පරිදි පළපුරුද්ද ලෙස පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ (MN-03) කාර්මික නිලධාරී (සංරක්ෂණ සහකාර) / සැලසුම් ශිල්පී යන තනතුරක II ශ්‍රේණියේ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හෝ I ශ්‍රේණියේ නිලධාරියකු වීම.

හෝ

(iii) ඉහත අධ්‍යාපන සුදුසුකම් අදාළ නොවන පරිදි පළපුරුද්ද ලෙස පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර තාක්ෂණ නොවන ඛණ්ඩ 02 සේවා ගණයේ (MN-01)රසායනාගාර සහකාර / රසායන සංරක්ෂණ සහකාර තනතුරේ I ශ්‍රේණියේ වසර 02ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ I ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

(ඈ) ප්‍රාදේශීය නඩත්තු කළමනාකරු තනතුර සඳහා-

* අධ්‍යාපන සුදුසුකම් ලෙස

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන,

(i). සිවිල් ඉංජිනේරු උපාධියක් ලබා තිබීම.

හෝ

(ii). නිර්මිත පරිසරය / වාස්තු විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම.

හෝ

(iii). පුරාවිද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම.

හෝ

(iv). පුරාවිද්‍යාව විෂය සහිත උපාධියක් සහිතව එක් අවුරුදු පුරාවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

හෝ

(v). පුරාවිද්‍යාව විෂය සහිත උපාධියක් සමග විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පිරිනමන එක් අවුරුදු පුරාවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාවට සමාන හෝ ඊට ඉහළ අධ්‍යාපන සුදුසුකමක් ලබා තිබීම.

හෝ

(vi). තාක්ෂණවේදී උපාධියක් ලබා තිබීම.

* පළපුරුද්ද ලෙස,

(i) ඉහත අධ්‍යාපන සුදුසුකම් සහිතව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත සේවා ගණය යටතේ වන පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍ර අයත් වැඩබිම් කළමනාකරු / පුරාවිද්‍යා පර්යේෂණ නිලධාරී තනතුරක හෝ සංවර්ධන නිලධාරී යන තනතුරක වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියකු වීම.

හෝ

(ii) ඉහත අධ්‍යාපන සුදුසුකම් අදාළ නොවන පරිදි පළපුරුද්ද ලෙස පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ (MN-03) කාර්මික නිලධාරී (සංරක්ෂණ සහකාර) / සැලසුම් ශිල්පී යන තනතුරක II ශ්‍රේණියේ වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හෝ I ශ්‍රේණියේ නිලධාරියකු වීම.

හෝ

(iii) ඉහත අධ්‍යාපන සුදුසුකම් අදාළ නොවන පරිදි පළපුරුද්ද ලෙස පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර තාක්ෂණ නොවන බණ්ඩ 02 සේවා ගණයේ (MN-01) නඩත්තු සහකාර තනතුරේෂ ශ්‍රේණියේ වසර 02ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ I ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

III. උපාධිය බලපවත්නා දිනය 2021.01.13 දින හෝ එදිනට පෙර දිනයක් විය යුතුය.

IV. මෙම විභාගය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් 2021.01.13 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

V. රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ට වයස් සීමාව බලපානු නොලැබේ.

07. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

(අ) ඉල්ලුම්පත්‍ර නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල වියයුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8 1/2" x 12" (A4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර ඉදිරිපත් කළ යුතුය. 1.0 සිට 5.0 තෙක් වන ශීර්ෂ ඉල්ලුම් පත්‍ර කඩදාසියේ පළමුවැනි පිටුවේද, 6.0 සිට 9.0 තෙක් එහි දෙවන පිටුවේද, 10.0 සිට 12.0 තෙක් තුන්වන පිටුවේ ද වන පරිද්දෙන් තම ඉල්ලුම් පත්‍ර සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.අයදුම්පතේ ශීර්ෂයේ සඳහන් විභාග යේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය. විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන මාධ්‍යයෙන් තම අත් අකුරින්ම අයදුම්පත සම්පූර්ණ කළ යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍ර අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර නියමිත පරිදි සම්පූර්ණ නොකරන ලද ඉල්ලුම් පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම් පත්‍ර අනුකූලද යන්න පිළිබඳව හා නියමිත විභාග ගාස්තු ගෙවා එහි විස්තර අයදුම්පතට ඇතුළත්කොට ලදුපත අලවා ඇත්ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුණහොත් ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප විය හැක. (ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ ලදුපතෙහි ජායා පිටපතක් ළග තබාගැනීම ප්‍රයෝජනවත් විය හැක.)

(ආ) ඉල්ලුම් පත්‍ර අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන්ම සම්පූර්ණ කළයුතුය.

(ඇ) විභාග ගාස්තුව රු. 600 ක් වන අතර, එම ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක් / දිස්ත්‍රික් / ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබාගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතු ය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරනු ලැබේ. එසේම ලදුපතේ ඡායා පිටපතක් ළග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ඈ) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් 2021.01.13 දින හෝ ඊට පෙර ලැබෙනු පිණිස විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග), ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ යන ලිපිනය වෙත එවිය යුතුය. ඉල්ලුම් පත්‍රය බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව

"පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත /කාර්යාලගත - ඛණ්ඩ 2 (MN-05-2016) සේවා ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2020/2021" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසන් දිනයෙන් පසුව ලැබෙන ඉල්ලුම් ප්‍රතික්ෂේපකරනු ලැබේ.

(ඉ) අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු / ඇය විසින් බලය පැවරූ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

(ඊ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී ඉල්ලුම් පත්‍ර නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

08. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍ර නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි වන පරිදි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත/විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාග ශාලාවට ඇතුළුවීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළයුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකමක් සපුරා ඇති බවට වන පිළිගැනීමක් ලෙස සැලකිය නොහැකිය.

09. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව* :

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට අතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

10. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම : විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට/ඇයට සිදුවනු ඇත. අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කෙරේ. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව තහවුරු වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කෙරේ.

11. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

12. විභාග ක්‍රමය හා විභාග මාධ්‍ය : විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

13. *තෝරා ගැනීමේ ක්‍රමය* :- පහත සඳහන් විෂය නිර්දේශයන්ගෙන් සමන්විත ලිඛිත පරීක්ෂණයකින් මෙම විභාගය පවත්වනු ලබයි. ලිඛිත පරීක්ෂණයේ සියලු ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන් අතරින් සුදුසුකම් ලැබූවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 1. පුරාවිද්‍යාව | 1. ගවේෂණ හා කැණීම් කටයුතු මගින් ලබාගන්නා ලද (භෞතික සාධක) පුරාවස්තු අධ්‍යයනය කිරීමෙන් ශ්‍රී ලංකාවේ අතීතය ගොඩනැගීමට අදාළ කරුණු.<br>2. ගවේෂණ හා කැණීම් කටයුතු මගින් සොයාගන්නා පුරාවස්තු සංරක්ෂණය කර පවත්වාගෙන යාම (නඩත්තුව) හා ඒ පිළිබඳව පොදු ජනතාව දැනුවත් කිරීම හා සම්බන්ධිත කරුණු. |
| 2. ශ්‍රී ලංකා ඉතිහාසය | 1. ලිඛිත සාධක වංශකතා හා අභිලේඛන තොරතුරු යනාදිය අධ්‍යයනය කිරීමෙන් අතීතය ගොඩනැංවීමට අදාළ කරුණු. |

14. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ආචාර්ය සෙනරත් දිසානායක,
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්

2020 දෙසැම්බර් මස 02 වැනි දින,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
කොළඹ 07.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම්පත**

ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා ක්ෂේත්‍රගත/කාර්යාලගත - ඛණ්ඩ 2 සේවා ගණයේ (MN-05-2016) තනතුරු සඳහා වන බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2020/2021

Limited Competitive Examination for Recruitment to the Posts in Field/Office Based -Segment 2 (MN-05-2016) of the Department of Archaeology under the State Ministry of National Heritage, Performing Arts and Rural Arts Promotion - 2020/2021

(අයදුම්කරන භාෂා මාධ්‍යය මෙහි සඳහන් කරන්න.)
(සිංහල - 2, දෙමළ - 3, ඉංග්‍රීසි - 4)

| |
|---|
| 1. |
| 2. |
| 3. |
| 4. |

(ඉල්ලුම් කරන තනතුර/තනතුරු)

1.0 1.1 සම්පූර්ණ නම : ..................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..................................................................................

1.2 සම්පූර්ණ නම (මයා/මිය/මෙය) : ..........................................................................
(සිංහලෙන්/දෙමළෙන්) ..........................................................................

1.3 මුලකුරු සමග නම : ..........................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 මුලකුරු සමග නම : ..........................................................................
(මයා/මිය/මෙය)
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.0 2.1 ස්ථිර ලිපිනය : ..........................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..........................................................................
2.2 ස්ථිර ලිපිනය : ..........................................................................
(සිංහලෙන්/දෙමළෙන්) ..........................................................................

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : [ ] පුරුෂ - 0 ස්ත්‍රී - 1

3.2 උපන් දිනය : වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ ]

3.3 2021.01.13 දිනට වයස : අවුරුදු [ | ] මාස [ | ] දින [ | ]

4.0 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | | | ]

5.0 දුරකථන අංකය : ස්ථාවර - [ | | | | | | | | | | | ]

ජංගම - [ | | | | | | | | | | | ]

6.0 අධ්‍යාපන සුදුසුකම් :

6.1 උපාධි සුදුසුකම් :

| විශ්වවිද්‍යාලය | හදාරා ඇති උපාධි පාඨමාලාව | වලංගු දිනය | සාමර්ථ්‍යය |
|---|---|---|---|
| | | | |

6.2 වෙනත් අධ්‍යාපන සුදුසුකම් :

| විශ්වවිද්‍යාලය/ආයතනය | හදාරා ඇති පාඨමාලාව | වලංගු දිනය | සාමර්ථ්‍යය |
|---|---|---|---|
| | | | |

7.0 සේවා පළපුරුද්ද :

| *තනතුර* | *සේවා කාලය* |
|---|---|
| | |

8.0 දැනට දරන තනතුර පිළිබඳ විස්තර :

8.1 වර්තමාන සේවා ස්ථානය :————.
8.2 දැනට දරන තනතුර හා ශ්‍රේණිය :————.
8.3 තනතුරට පත්වූ දිනය :————.
8.4 දෙපාර්තමේන්තුවේ සම්පූර්ණ සේවා කාලය :————.
8.5 තනතුරෙහි ස්ථිර කළ දිනය :————.

9.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?
(අදාළ කොටුවේ ලකුණ (√ ) යොදන්න.) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

| ඔව් | | | නැත | |
|---|---|---|---|---|

විභාග ගාස්තු ගෙවා ලබාගත් කුවිතාන්සිය නොගැලවෙන සේ එක් දරයකින් මෙහි අලවන්න.

10.0 අයදුම්කරුගේ සහතිකය :

මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සියලු කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මා දන්නා බවත්, සියලු නීතිරීතිවලට මම යටත් වන බවත් ප්‍රකරමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

................................................
අයදුම්කරුගේ අත්සන.

දිනය : ..............................

11.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :
මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු /ඇය මා ඉදිරිපිට දී ......................... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

................................................
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය : ..............................

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : .................................................................................

තනතුර : ................................................................................

ලිපිනය : ................................................................................

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

12.0 අංශභාර අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ හෝ ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂගේ නිර්දේශය :
මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ....................................................... මයා/මිය/මෙනවිය මාගේ අංශයේ/කාර්යාලයේ .............................. දින සිට ...................................... තනතුරේ සේවය කරන බවත්, ඔහුගේ වැඩ හා පැමිණීම සතුටුදායක බවත්, ඔහුට විරුද්ධව කිසිදු චෝදනාවක් නොමැති බවත්, ඔහු විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් මෙයින් සහතික කරමි.

................................................................................
අංශභාර අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ හෝ ප්‍රාදේශීය
සහකාර අධ්‍යක්ෂගේ අත්සන
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

දිනය : ..............................

12 - 332/1

---

**ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා ක්ෂේත්‍රගත /කාර්යාලගත - ඛණ්ඩ 2 සේවා ගණයේ (MN-05-2016) තනතුරු සඳහා වන බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2020/2021**

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා ක්ෂේත්‍රගත /කාර්යාලගත - ඛණ්ඩ 2 (MN-05-2016) සේවා ගණයට අදාළ පහත දක්වා ඇති තනතුරු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. අදාළ පුරප්පාඩු තනතුරු පහතින් දැක්වෙන අතර, පහත දක්වා ඇති ආකෘතිය අනුව පිළියෙල කළ අයදුම්පතක් 2021.01.13 දිනට හෝ එදිනට පෙර විභාග කොමසාරිස් ජනරාල් වෙත ලැබෙන සේ එවිය යුතුය. මෙම විභාගය 2021 මාර්තු මස කොළඹ නගරයේ දී පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල්දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

| | | | |
|---|---|---|---|
| 01. | ප්‍රාදේශීය ගවේෂක | - | 02 |
| 02. | ප්‍රාදේශීය කැණීම් හා කෞතුකාගාර නිලධාරී | - | 02 |
| 03. | ප්‍රාදේශීය සංරක්ෂක | - | 03 |
| 04. | ප්‍රාදේශීය නඩත්තු කළමනාකරු | - | 02 |

01. *බඳවා ගැනීමේ ක්‍රමය* .- නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් ලිඛිත විභාගය සමත්, අදාළ සුදුසුකම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයන්ගේ ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව සහ ඉල්ලුම් කර ඇති තනතුරු අනුපිළිවෙළ අනුව එක් එක් තනතුරේ පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවා අධ්‍යාපන සුදුසුකම් හා ශාරීරික යෝග්‍යතා සනාථ කර ගැනීමෙන් පසු බඳවා ගනු ලැබේ.

02. *ලිඛිත විභාගය* : මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

I. පුරාවිද්‍යාව
II. ශ්‍රී ලංකාවේ ඉතිහාසය

*සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය* .- ලිඛිත විභාගයේ සියලු ප්‍රශ්නපත්‍රවලට අයදුම්කරුවන් පෙනී සිටිය යුතු අතර, සමත් වීම සඳහා එක් එක් විෂයට 40%ක් වූ අවම ලකුණු ලබාගත යුතුය. විභාගය සමත් අයදුම්කරුවන් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව හා ඉල්ලුම් කර ඇති තනතුරු අනුපිළිවෙළ අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. මෙම සම්මුඛ පරීක්ෂණයේදී අධ්‍යාපන සුදුසුකම් හා ශාරීරික යෝග්‍යතාව සනාථ කරගනු ලබන අතර ඒ සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* : මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතුය. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද 2016.09.01 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත-බණ්ඩ 2 සේවා ගණයේ (MN-05-2016) තනතුරු සඳහා වන බඳවාගැනීමේ පරිපාටියට අදාළ සියලු කොන්දේසිවලට ද පසුව 2019.07.04 දිනැතිව අනුමත කරන ලද සංශෝධනවලට ද එම බඳවාගැනීමේ පරිපාටියට කර ඇති හෝ මින් මතු කෙරෙන සංශෝධනවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙහි ක්ෂේත්‍රගත/ කාර්යාලගත - බණ්ඩ 2 සේවා ගණයේ II වැනි ශ්‍රේණියේ තනතුරකට පත්කරනු ලැබේ.

3.1 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරී නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද රාජකාරියෙහි හෝ පත්කරන ලද ප්‍රදේශයක රාජකාරී භාරගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබීමට ඉඩ ඇත.

04. *මාසික වැටුප් පරිමාණය* :

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු.34,605 -10 x 660 - 11x 755 -15 x 930- 63,460/-(MN-05-2016) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන IIහි සඳහන් පරිදි වේ.

(පත්වීම් දින සිට වසර 03 ක් ඇතුළත 1 වැනි කාර්යක්ෂමතා කඩඉම සහ I පන්තියේ පත්වීම් දින සිට වසර 05 ක් ඇතුළත 2 වැනි කාර්යක්ෂමතා කඩඉම ද සමත් විය යුතුය. පත්වීම් ලබා වසර 05 ක් ගතවීමට පෙර 2007.05.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 පරිදි අදාළ මට්ටම් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය.)

05. *සෞඛ්‍ය* :
අපේක්ෂකයා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි වන පරිදි මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්තවිය යුතුය.

06. *සුදුසුකම්* :
මේ සඳහා පෙනී සිටින අපේක්ෂකයකු,

I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
II. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
III. 2021.01.13 වැනි දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 2000.01.13 දිනට හෝ ඊට පෙර හා 1986.01.13 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

IV. (අ) ප්‍රාදේශීය ගවේෂක සහ ප්‍රාදේශීය කැණීම් හා කෞතුකාගාර නිලධාරී තනතුරු සඳහා-
* **අධ්‍යාපන සුදුසුකම් ලෙස,**
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන
(i) පුරාවිද්‍යාව පිළිබඳව විශේෂ (සිව්වසරක) උපාධියක්;
හෝ
(ii) පුරාවිද්‍යාව විෂයය සහිත උපාධියක් සමග පුරාවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්;
හෝ
(iii) පුරාවිද්‍යාව විෂයයක් සහිත උපාධියක් සමග විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පිරිනමන එක් අවුරුදු පුරාවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාවට සමාන හෝ ඊට ඉහළ අධ්‍යාපන සුදුසුකමක් ලබා තිබීම.

(ආ) ප්‍රාදේශීය සංරක්ෂක තනතුර සඳහා-

* **අධ්‍යාපන සුදුසුකම් ලෙස,**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන වාස්තු විද්‍යාව හෝ වාස්තු විද්‍යා සංරක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම;

හෝ

ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පී ආයතනයේ පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

(ඇ) ප්‍රාදේශීය නඩත්තු කළමනාකරු තනතුර සඳහා-

* **අධ්‍යාපන සුදුසුකම් ලෙස,**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් සිවිල් ඉංජිනේරු/ නිර්මිත පරිසරය / වාස්තු විද්‍යාව පිළිබඳව උපාධියක් ලබා තිබීම.

V. උපාධිය බලපවත්නා දිනය 2021.01.13 දින හෝ එදිනට පෙර දිනයක් විය යුතුය.

VI. මෙම විභාගය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් 2021.01.13 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

07. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :-

(අ) ඉල්ලුම් පත්‍ර මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8 1/2" x 12 " (A 4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර ඉදිරිපත් කළ යුතුය. 1.0 සිට 5.0 තෙක් වන ශීර්ෂ ඉල්ලුම් පත්‍ර කඩදාසියේ පළමුවැනි පිටුවේ ද, 6.0 සිට 9.0 තෙක් එහි දෙවන පිටුවේ ද වන පරිද්දෙන් තම ඉල්ලුම්පත්‍ර සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය. අයදුම්පතේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර හා නියමිත පරිදි සම්පූර්ණ නොකරන ලද ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් විය හැක. ) සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුණහොත් ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප විය හැක.

ඔබගේ පහසුව සඳහා නිවැරදිව සකස් කරන ලද විභාග ඉල්ලුම් පත්‍රය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් (www.archaeology.gov.lk) බාගත කළ හැක.

(ආ) ඉල්ලුම් පත්‍ර අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන්ම සම්පූර්ණ කළ යුතුය.

(ඇ) අයදුම්පත සමග කිසිදු සහතිකයක පිටපතක් අමුණා එවීම අවශ්‍ය නොවේ.

(ඈ) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් 2021.01.13 දින හෝ ඊට පෙර ලැබෙනු පිණිස විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ.1503, කොළඹ, යන ලිපිනය වෙත එවිය යුතුය. ඉල්ලුම් පත්‍රය බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව "පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත /කාර්යාලගත - ඛණ්ඩ 2 (MN-05-2016) සේවා ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2020/2021" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසන් දිනයෙන් පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ඉ) ඉල්ලුම් පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සමාදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන පූජකවරයකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

(ඊ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී ඉල්ලුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

08. *විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය* : විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

සටහන :

I. අපේක්ෂකයකු විභාගයේ දී පෙනී සිටින සියලු ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

II. තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් විභාග භාෂා මාධ්‍ය වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ.

09. *විභාග ගාස්තුව*.- මෙම විභාගය සඳහා අයදුම්කරන අයදුම්කරුවකු රු.1,200 ක විභාග ගාස්තුවක් විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක්/දිස්ත්‍රික් / ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබාගන්නා ලදුපත එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. එම ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරනු ලැබේ.

10. *තෝරා ගැනීමේ ක්‍රමය* :

පහත සඳහන් විෂය නිර්දේශයන්ගෙන් සමන්විත ලිඛිත පරීක්ෂණයකින් මෙම විභාගය පවත්වනු ලබයි. ලිඛිත පරීක්ෂණයේ සියලු ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන් අතරින් සුදුසුකම් ලැබුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 1. පුරාවිද්‍යාව | 1. ගවේෂණ හා කැණීම් කටයුතු මගින් ලබාගන්නා ලද (භෞතික සාධක) පුරාවස්තු අධ්‍යයනය කිරීමෙන් ශ්‍රී ලංකාවේ අතීතය ගොඩනැගීමට අදාළ කරුණු.<br>2. ගවේෂණ හා කැණීම් කටයුතු මගින් සොයාගන්නා පුරාවස්තු සංරක්ෂණය කර පවත්වාගෙන යාම (නඩත්තුව) හා ඒ පිළිබඳව පොදු ජනතාව දැනුවත් කිරීම හා සම්බන්ධිත කරුණු. |
| 2. ශ්‍රී ලංකා ඉතිහාසය | 1. ලිඛිත සාධක, වංශ කතා හා අභිලේඛන තොරතුරු යනාදිය අධ්‍යයනය කිරීමෙන් අතීතය ගොඩනැංවීමට අදාළ කරුණු. |

11. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි වන පරිදි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත/විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළයුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.

12. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය* : විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ. :-

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

13. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම : විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට කටයුතු කෙරේ. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව තහවුරු වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කෙරේ.

14. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

15. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ආචාර්ය සෙනරත් දිසානායක,
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්

2020 දෙසැම්බර් මස 02 වැනි දින,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
කොළඹ 07.

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම්පත**

ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා ක්ෂේත්‍රගත/කාර්යාලගත - ඛණ්ඩ 2 සේවා ගණයේ (MN-05-2016)
තනතුරු සඳහා වන බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2020/2021

Open Competitive Examination for Recruitment to the Posts in Field/Office Based -Segment 2 (MN-05-2016) of the Department of Archaeology under the State Ministry of National Heritage, Performing Arts and Rural Arts Promotion - 2020/2021

| |
|---|
| |

(අයදුම්කරන භාෂා මාධ්‍යය මෙහි සඳහන් කරන්න.)
( සිංහල - 2, දෙමළ - 3, ඉංග්‍රීසි - 4)

| |
|---|
| 1. |
| 2. |
| 3. |
| 4. |

(ඉල්ලුම් කරන තනතුර/තනතුරු)

1.0 1.1 සම්පූර්ණ නම : ..........................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..........................................................................

1.2 සම්පූර්ණ නම (මයා/මිය/මෙය) : ..........................................................................
(සිංහලෙන්/දෙමළෙන්) ..........................................................................

1.3 මුලකුරු සමග නම : ..........................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 මුලකුරු සමග නම (මයා/මිය/මෙය) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ................................................................................
................................................................................

2.0 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ................................................................................
................................................................................

2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) : ................................................................................
................................................................................

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ☐ පුරුෂ - 0 ස්ත්‍රී - 1

3.2 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.3 2021.01.13 දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

4.0 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

5.0 දුරකථන අංකය : ස්ථාවර - ☐☐☐☐☐☐☐☐☐☐☐☐

ජංගම - ☐☐☐☐☐☐☐☐☐☐☐☐

6.0 අධ්‍යාපන සුදුසුකම් :

6.1 උපාධි සුදුසුකම් :

| *විශ්වවිද්‍යාලය* | *හදාරා ඇති උපාධි පාඨමාලාව* | *වලංගු දිනය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

6.2 වෙනත් අධ්‍යාපන සුදුසුකම්

| *විශ්වවිද්‍යාලය/ආයතනය* | *හදාරා ඇති පාඨමාලාව* | *වලංගු දිනය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

7.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?
(අදාළ කොටුවේ ලකුණ (√ ) යොදන්න.) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

ඔව් ☐ නැත ☐

විභාග ගාස්තු ගෙවා ලබාගත් කුවිතාන්සිය නොගැලවෙන සේ එක් දරයකින් මෙහි අලවන්න

8.0 අයදුම්කරුගේ සහතිකය ඃ

මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සියලු කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මා දන්නා බවත්, සියලු නීතිරීතිවලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

...............................................
අයදුම්කරුගේ අත්සන

දිනය ඃ .............................

9.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු /ඇය මා ඉදිරිපිට දී ......................... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

...............................................
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

දිනය ඃ.......................................

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම ඃ...........................................
තනතුර ඃ ......................................
ලිපිනය ඃ ......................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

12- 332/2

---

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

කුසලතා පදනම මත රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීම
සඳහා වන තරග විභාගය - 2018 (2020)

කුසලතා පදනම මත රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන තරග විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2021 මාර්තු මස කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කෙරේ.

01. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, අංක 2053/18 දරන 2018.01.09 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙන් පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට යටත්ව 2020.10.31 දිනට ගණනය කර ඇති රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සේවයේ අධි ශ්‍රේණියේ පුරප්පාඩුවලින් 65% ක ප්‍රමාණයක් කුසලතා පදනම මත උසස් කිරීම මඟින් සම්පූර්ණ කරනු ලැබේ.

02. සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින රෝහල් හා සෞඛ්‍ය ආයතනවල සේවයේ නියුතු, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව MN-02-2016 වැටුප් කේතය යටතේ වැටුප් ලබන සහ එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටින 2020.10.31 දිනට මෙහි 06 ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධරයන් මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලබති. පළාත් රාජ්‍ය සේවයට අයත් නිලධරයන්ට මෙම විභාගයට පෙනී සිටිය නොහැකිය.

03. 2016.02.25 දිනැති හා අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN 7-2016 වැටුප් බණ්ඩය මෙම තනතුරට හිමිවන අතර එයට අදාළ මාසික වැටුප් පරිමාණය 41,580/-11x755-18x1030-68,425/- ක් වේ.එම වැටුප ඔබට හිමිවනුයේ 2020.01.01 දින සිට වේ. එම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

04. *සේවා කොන්දේසි* :

I. පත් කරනු ලබන නිලධරයන් සංඛ්‍යාව සහ පත්වීම් ක්‍රියාත්මකවන දිනය පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

II. රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවාවේ නිලධාරීන්ගේ සාමාන්‍ය රාජකාරි වේලාව අවුරුද්දේ සියලු දිනවල පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ. එහෙත් රාජකාරි අවශ්‍යතාව මත හා රාජකාරි ස්වාභාවය අනුව ඉහත වේලාවන් වෙනස් විය හැක. තවද සේවා අවශ්‍යතාව අනුව රාත්‍රී සේවයේ යෙදවිය හැකි වන අතර, රාජකාරි ස්වාභාවය අනුව අමතර රාජකාරි සඳහාද නියෝග කරනු ලැබිය හැකිය. බඳවා ගනු ලබන නිලධාරීන් වසරේ දින තුන්සිය හැට පහේම (365) සේවයට යටත් වනු ඇත.

III. සේවා අවශ්‍යතාව අනුව සෞඛ්‍ය ආයතන සහ රෝහල්වල සේවයේ නියුතු නිලධරයන්ට සෙනසුරාදා, ඉරිදා සහ රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනවල සේවය කිරීමට නියම කළ හැකිය. එම සේවය වෙනුවෙන් අතිකාල හෝ නිවාඩු දින වැටුප් හෝ හිලව් නිවාඩු ලබා ගත හැකිය.

IV. සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් නියම කරන රාජකාරි ඉටු කරන නිලධාරීන් විසින් රුපියල් 5000/- ක ඇප මුදලක් තැබිය යුතුය.

05. *ඇගයීමේ ක්‍රමවේදය* :

අධිශ්‍රේණියේ පුරප්පාඩුවලින් 65% ක ප්‍රමාණයක් කුසලතා පදනම මත සම්පූර්ණ කරනු ලැබේ. මේ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අභියෝග්‍යතාව හා සිද්ධි අධ්‍යයනය පිළිබඳ ලිඛිත පරීක්ෂණයට මුහුණ දී අවම වශයෙන් ලකුණු 50%ක් ලබා සමත් විය යුතුය. එහි ප්‍රතිඵල මත හා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මඟින් ජ්‍යෙෂ්ඨතාව හා පළපුරුද්ද පදනම් කර ගෙන දෙනු ලබන ලකුණුවල එකතුවේ අනුපිළිවෙළ අනුව ප්‍රමුඛත්වය තීරණය කරනු ලැබේ. එම මණ්ඩලය මඟින් ලකුණු ලබාදීමට තෝරා ගනු ලබන්නේ උක්ත සඳහන් ආකාරයට අවම ලකුණු 50% ක් ලබා ගත් අයදුම්කරුවන් පමණි. සෞඛ්‍ය සේවා කමිටුව මඟින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියේ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට ද එම අයදුම්කරුවන් පෙනී සිටිය යුතු අතර එම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු නොලැබේ. කුසලතා අනුපිළිවෙළ හා පවත්නා පුරප්පාඩු ප්‍රමාණය අනුවම පත් කිරීම කරනු ලැබේ.

| ප්‍රශ්න පත්‍රය /ලකුණු ලබා දෙන නිර්ණායක | කාලය | මුළු ලකුණු |
|---|---|---|
| I. අභියෝග්‍යතාව හා සිද්ධි අධ්‍යයනය (ලිඛිත පරීක්ෂණය) | පැය 1 1/2 | 100 |
| II. ජ්‍යෙෂ්ඨත්වය | | 60 |
| III. පළපුරුද්ද | | 40 |

I. අභියෝග්‍යතාව හා සිද්ධි අධ්‍යයනය - ලිඛිත පරීක්ෂණය(කාලය පැය 1 1/2 ලකුණු 100)

මෙම පරීක්ෂණය පවත්වනු ලබන දිනය විභාග කොමසාරිස් ජනරාල් විසින් දැනුම් දෙනු ඇත. අභියෝග්‍යතාව හා සිද්ධි අධ්‍යයනය වෙනුවෙන් වන ලිඛිත පරීක්ෂණයේ ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.

(අ). I කොටස

සියලුම ප්‍රශ්න කාර්යාල පරිපාලනයට සම්බන්ධ වන අතර එහිදී සාමාන්‍ය දැනීම,තීරණ ගැනීමේ හැකියාව,තාර්කික විසඳීම හා කාර්යාල පරිපාලනයට සම්බන්ධ ගැටලු ඉදිරිපත් වනු ඇත.

(ආ). II කොටස

අපේක්ෂකයන්ට කාර්යාල පරිපාලනයට සම්බන්ධ සිද්ධි අධ්‍යයන ආශ්‍රිත ගැටලුවලට පිළිතුරු සැපයීමට සිදු වේ.මෙහිදී ඡේදයක් හෝ ඡේද කිහිපයකින් යුක්ත වන පරිදි ප්‍රශ්න පත්‍රය සකස් කරනු ඇත.

II. ජ්‍යෙෂ්ඨත්වය

ජ්‍යෙෂ්ඨත්වය සඳහා,2019.06.13 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

III. පළපුරුද්ද

සේවයේ I ශ්‍රේණියේ අධීක්ෂණ නිලධරයකු ලෙස සතුටුදායක එක් වසරක් සඳහා ලකුණු 02 බැගින් ලකුණු 40 ක උපරිමයක් දක්වා පමණි.

**සටහන** : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් ජ්‍යෙෂ්ඨතාව හා පළපුරුද්ද සඳහා ලකුණු ලබා දීම සිදු කරනු ලැබේ. අයදුම්කරුවන් ජ්‍යෙෂ්ඨතාව සහ පළපුරුද්ද සම්බන්ධව ඇතුළත් කරන ලකුණු එම නිලධාරීන්ගෙන් පෞද්ගලික ලිපි ගොනුව පදනම් කරගෙන ඇගයීමකට ලක් කරනු ලැබේ. මෙහිදී සිතාමතා අසත්‍ය තොරතුරු ඇතුළත් කරන ලද බව පෙනී ගියහොත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ උපදෙස්වලට යටත්ව අයදුම්කරුවන්ට සහ එම අයදුම්පත් සහතික කරන ලද දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කරනු ලැබේ. පෞද්ගලික ලිපිගොනුවෙන් සනාථ නොවන සුදුසුකම් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

06. *සුදුසුකම්* :

6.1 වෘත්තීය සුදුසුකම් :

i. නියමිත දිනට සේවයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධරයකු වීම.
ii.නියමිත දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

6.2 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්,තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

6.3. වෙනත් සුදුසුකම් :

(i). අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(ii). තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් නියමිත දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

6.4. පළපුරුද්ද :
නියමිත දිනට සෞඛ්‍ය අමාත්‍යාංශය, එම අමාත්‍යාංශය යටතේ පවතින සෞඛ්‍ය ආයතනවල සේවයේ නියුතු ස්ථිර පත්වීමක යටත් පිරිසෙන් අවුරුදු 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.

**සටහන** : අයදුම්කරුවන් නියමිත දිනට පූර්වාසන්න වසර පහක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුවේ. මෙහිදී සතුටුදායක සේවය යන්නෙන් පහත කරුණු අදහස් වේ.

- නියමිත දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළදී ලැබෙන සියලු වැටුප් වර්ධක ලබා තිබීම.
- නියමිත දිනට පූර්වාසන්න වර්ෂ 05ක් තුළදී කිසිදු විනයානුකූල දඬුවමකට යටත් කර නොතිබීම.

මෙහි නියමිත දිනය යනු සුදුසුකම් පරීක්ෂා කිරීමේ අවසන් දිනය වන 2020.10.31 වේ.

07. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

(අ) ඉල්ලුම් පත්‍රය මෙම චක්‍රලේඛයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර එය A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අපේක්ෂකයා විසින්ම සම්පූර්ණ කළ යුතුය. අයදුම්පත් 2021.01.04 දිනට ප්‍රථම ආයතන ප්‍රධානියා වෙත බාර දිය යුතු අතර, ඔහු විසින් සෑම අයදුම්කරුවකු/ අයදුම්කාරියකුම ඉදිරිපත් කරන ලද තොරතුරු සත්‍ය සහ නිවැරදි බවට පෞද්ගලිකව සහතික කිරීමෙන් පසු සියලු අයදුම්පත්,

"අධ්‍යක්ෂ (පාලන) 06,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
තැ.පෙ.385,
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10."

ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් 2021.01.18 දිනට පෙර ඉදිරිපත් කළ යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ "රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවය සඳහා වූ කුසලතා පදනම මත තරග විභාගය සඳහා ඉල්ලුම්පත්‍රය" ලෙස සඳහන් කර එවිය යුතු වේ.

සැ.යු.- (අ) තෝරා ගන්නා අයදුම්කරුවන් වෙත පත්වීම් ලිපි නිකුත් කරනු ලබන්නේ අයදුම්පතේ සටහන් කරනු ලබන මුලකුරු සමඟ නමට පමණක් වන බැවින් අයදුම්පතේ සඳහන් ආදර්ශය අනුගමනය කරමින් නම නිවැරදිව සඳහන් කළ යුතුය. පත්වීම නිකුත් කරනු ලබන අවස්ථාවේ නමෙහි සංශෝධනයක් කිරීමට හෝ යම් කොටස් ඇතුළත් කිරීමට/ඉවත් කිරීමට හෝ ඉඩ දෙනු නොලැබේ.

(ආ) විභාගය ඉල්ලුම්කරන අවසාන දිනට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස් වීම් කිසිවක් පිළිබඳව සලකා බලනු නොලැබේ.

(ඇ) මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අපේක්ෂකයින්ට සිය මනාපය පරිදි මින් එක් භාෂා මාධ්‍යයකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැකි අතර ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ඈ) අවශ්‍ය සුදුසුකම් සපුරා ඇත්නම් එක් නිලධරයකුට, සීමිත තරග විභාගය මත උසස් කිරීම හා කුසලතා මත උසස් කිරීම යන දෙයාකාරයෙන්ම අයදුම් කළහැකි අතර, අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී වෙන් වෙන්ව අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

(ඉ) මෙහි නියමිත සුදුසුකම් තමන් විසින් සපුරා ඇති බවට අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අයදුම්කරුවන්/අයදුම්කාරියන් සෑහීමට පත් විය යුතුය.මෙම නිවේදනයේ දැක්වෙන සුදුසුකම් නොමැතිව විභාගයට ඉදිරිපත්වන අයදුම්කරුවන්/ අයදුම්කාරියන් විභාගයේදි ප්‍රමාණවත් ලකුණු මට්ටමක් ලැබුවද පත්වීම් ලැබීමට නුසුදුස්සෝ වෙති.

(ඊ) පත්වීම සඳහා අයදුම්කරු/අයදුම්කාරිය තෝරා ගනු ලැබී නම් ඔහු/ඇය මුදා හැරීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ එකඟතාව තිබිය යුතුය.

(උ) අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා චක්‍රලේඛය අනුව සුදුසුකම් පරීක්ෂා කිරීමේදී අවශ්‍ය මූලික සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

08. *විභාග ගාස්තු* :

විභාග ගාස්තුව රු. 1200/- ක් වන අතර එම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක්/දිස්ත්‍රික්/ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබාගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය.මෙම විභාග ගාස්තුවලට අමතරව වෙනත් කිසිදු අයකිරීමක් සිදු නොකෙරේ.විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන බවද, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකෙරේ.එමෙන්ම ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

09. *විභාගයට පෙනී සිටීම* :

i. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ පසු යම් අයදුම්කරුවකු වෙත ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනයද, ගාස්තු ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපතෙහි සටහන් කරමින් ඒ බව විභාග දෙපාර්තමේන්තුවට දන්වා සිටිය යුතුය. (කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් ප්‍රවේශ පත්‍ර එවිය යුතු ෆැක්ස් අංකයද ඉහත විස්තර සමඟ ඉදිරිපත් කළ යුතුය).

ii. අයදුම්පතේ සහ විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. විභාගයට ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවකුම තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා, සහතික කරවා ගත යුතුය. පළාත් මට්ටමින් පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථාන තුළ, තමාට නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේදී

පමණක් විභාගයට පෙනී සිටීමට අවසර ලැබෙන අතර එසේ පෙනී සිටීමේදී ප්‍රථමයෙන් විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. එසේ ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.

10. විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(i) ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

10.1. එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණ කිරීමෙන් තොරව සිටිය යුතුය.

11. ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :

ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වීමේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

12. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වේ.

13. මෙහි සඳහන් නොවන වෙනත් කරුණක් වේතොත්, ඒ සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

14. මෙම සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කළ යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියෝගය පරිදි,

වෛද්‍ය එස්.එච්. මුණසිංහ,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2020 නොවැම්බර් මස 30 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශය.
385,
සුවසිරිපාය,
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ආදර්ශ අයදුම්පත්‍රය

**කුසලතා පදනම මත රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සේවයේ අධි ශ්‍රේණියට**
**උසස් කිරීම සඳහා වන තරග විභාගය - 2018 (2020)**

COMPETITIVE EXAMINATION FOR PROMOTION TO THE SUPERGRADE OF THE PUBLIC HEALTH MANAGEMENT SERVICE ON MERIT BASIS - 2018/2020

විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3 ☐
ඉංග්‍රීසි - 4

(නිලධාරියා විසින්ම සම්පූර්ණ කළ යුතුය)

01. 1.1. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා (SILVA A.B.) :..........................

1.2. සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්) :..........................................................................................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) :..........................................................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

02. 2.1. රාජකාරී ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................................................

2.2. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................................................

2.3. ස්ථිර ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) :..........................................................................................

03. ස්ත්‍රී / පුරුෂ භාවය (අදාළ අංකය කොටුව තුල ලියන්න)

පුරුෂ - 1
ස්ත්‍රී - 0 ☐

04. දුරකථන අංකය ☐☐☐☐☐☐☐☐☐☐

05. උපන් දිනය :

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

06. 6.1. වර්තමාන සේවා ස්ථානය හා ලිපිනය :..........................................................................................

6.2. සේවයේ මුල් පත්වීම් දිනය හා පත්වීම් ලිපි අංකය :..........................................................................

6.3. වර්තමාන තනතුර :..........................................................................................

6.4 වර්තමාන තනතුරට අන්තර්ග්‍රහණය වූ දිනය :..........................................................................
(අන්තර්ග්‍රහණ ලිපිය අමුණන්න)

6.5. සේවයේ I ශ්‍රේණියට උසස්කරන ලද දිනය :..........................................................................
(ලිපි අමුණන්න)

6.6. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කළ දිනය:..........................................................................

6.7. I ශ්‍රේණියට පත්වූ දින සිට අයදුම්පත් කැඳවීමේ අවසාන දින දක්වා සේවා කාලය
වර්ෂ : …………….මාස :………………දින :……………

6.8. අයදුම්පත් කැඳවන අවසාන දිනට වාර්ෂික ඒකාබද්ධ වැටුප:…………………………

6.9. 2015.10.31 දින සිට 2020.10.31 වන දින දක්වා උපයාගත් වැටුප් වර්ධක දිනයන් හා වාර්ෂික වැටුප් තල :

| | *වැටුප් වර්ධක දින* | *වාර්ෂික වැටුප් තල(රුපියල්)* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |

6.10. ඉකුත් අවුරුදු 05 තුළ විනයානුකූල නීති යටතේ ඔබට විරුද්ධව ක්‍රියා කරනු ලැබ ඇත්ද?
…………………………………………………………………………………………………………..................…
එසේ නම් වරදේ සහ පනවන ලද දඬුවමේ ස්වභාවය සහ දඬුවම් කළ දිනය ආදියේ විස්තර දක්වන්න.(පිටපත් අමුණන්න)
……………………………………………………………………………………………………………........
……………………………………………………………………………………………………………........

6.11 වැටුප් රහිත නිවාඩු/ අඩ වැටුප් නිවාඩු ලබා ගෙන ඇත්නම් එම කාල වකවානු දින ගණන
…………........

07. රාජ්‍ය සේවා කළමනාකරණ සහකාර I ශ්‍රේණියට ඇතුළත් වූ දින සිට 2020.10.31 දින දක්වා කාර්යාල අධීක්ෂණය පිළිබඳ, පළපුරුද්ද පිළිබඳ තොරතුරු: (මෙහි සඳහන් කරන පළපුරුද්ද සනාථ කරන ලිපිවල ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද පිටපත් ඉල්ලුම් පත්‍රයට පිළිවෙළින් අමුණන්න. නිලධරයාගේ කාර්ය සාධන වාර්තාවල මුල්පිටුවල (පළමු ශ්‍රේණියට උසස් වූ පසු) සහතික කළ පිටපත් අමුණා තිබීම ප්‍රයෝජනවත් වේ. සියලු ලිපි අයදුම්පතට අමුණා තිබිය යුතු අතර පසු අවස්ථාවක ඉදිරිපත් කරන ලේඛන ලකුණු ලබා දීමට සලකා බලනු නොලැබේ.)

| රෝහල/කාර්යාලය/ දෙපාර්තමේන්තුව | කාල වකවානුව | | නිලධාරියා දැරූ අධීක්ෂක තනතුර | කාලය | | සනාථ කිරීමේ ලිපි අමුණා ඇති/නැති බව |
|---|---|---|---|---|---|---|
| | දින සිට | දින දක්වා | | අවුරුදු | මාස | |
| | | | | | | |

08. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

i. විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලය/උපතැපැල් කාර්යාලය:.....................................................
ii. ලදුපත් අංකය හා දිනය : ................................................................
iii. ගෙවූ මුදල :...................................................................................

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න
(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.)

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට යටත්වන බවද ප්‍රකාශ කරමි.

දිනය :————.

————,
අයදුම්කරු/අයදුම්කාරියගේ අත්සන

අත්සන සහතික කිරීම

මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ..................................... මහතා/මහත්මිය/මෙනවිය ................................ දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුවෙන් නිදහස් බවත්/නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

දිනය :————.

————,
අත්සන සහතික කරන්නාගේ අත්සන

සහතික කරන නිලධරයාගේ නම :
තනතුර :
ලිපිනය :
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

II කොටස

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/ ආයතන ප්‍රධානියාගේ සහතිකය

1. නිලධරයාගේ පෞද්ගලික ලිපි ගොනුවේ I ශ්‍රේණියට පත් වූ දින සිට වන කාර්යය සාධන වාර්තා ඇසුරෙන් පහත තොරතුරු සම්පූර්ණ කරන්න.

| කාර්යය සාධන වර්ෂය | | නිලධරයා දැරූ අධීක්ෂක තනතුර | කාර්යය සාධන වාර්තාව අනුව | |
|---|---|---|---|---|
| දින සිට | දින දක්වා | | සනාථ වේ | සනාථ නොවේ |
| 2020/ / | 2019/ / | | | |
| 2019/ / | 2018/ / | | | |
| 2018/ / | 2017/ / | | | |
| 2017/ / | 2016/ / | | | |
| 2016/ / | 2015/ / | | | |
| 2015/ / | 2014/ / | | | |
| 2014/ / | 2013/ / | | | |
| 2013/ / | 2012/ / | | | |
| 2012/ / | 2011/ / | | | |

| කාර්යය සාධන වර්ෂය | | නිලධරයා දැරූ අධීක්ෂක තනතුර | කාර්යය සාධන වාර්තාව අනුව | |
|---|---|---|---|---|
| දින සිට | දින දක්වා | | සනාථ වේ | සනාථ නොවේ |
| 2011/ / | 2010/ / | | | |
| 2010/ / | 2009/ / | | | |
| 2009/ / | 2008/ / | | | |
| 2008/ / | 2007/ / | | | |
| ................. | ................. | | | |
| ................ | ................ | | | |

2. නිලධරයා රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ නිලධරයකු බව :————.

3. අවම වශයෙන් සේවයේ වසර 05 කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති /නැති බව :———
—.

4. පූර්වාසන්න වසර 05 තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබෙන බව හා සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බව :————.

5. අදාළ කාලය තුළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී ඇති බව
II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය :————.
I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය :————.

6. I. වැටුප් රහිත නිවාඩු/අඩ වැටුප් නිවාඩු ලබාගෙන ඇත්නම් එම කාල වකවානු දින ගණන
(II ශ්‍රේණියට පත් කළ/උසස් කළ දින සිට)
II. මොනයම් ආකාරයක හෝ දඬුවමකට/දඬුවම්වලට (අවවාද කිරීම් හැර) ලක් කර ඇත්නම් ඒ පිළිබඳ කෙටි විස්තරයක් සඳහන් කරන්න (යොමු අංකයද සඳහන් කරන්න)..........................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................

7. සංස්ථාවක හෝ වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය සඳහා නිලධාරියා/නිලධාරිණිය මුදාහැර සිටී නම් අදාළ කාල වකවානුව පිළිබඳ විස්තර ..........................................................................................................2020.10.31
දිනට සේවයේ I ශ්‍රේණියේ /II ශ්‍රේණියේ වසර 05ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති/නැති බවත්,අවම වශයෙන් වසර 05ක සතුටුදායක හා සක්‍රීය සේවා කාලයක් සපුරා ඇති/නැති බවත්,ඉහත සඳහන් කළ සියලු කරුණු පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදි බවත් රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාව අනුව සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීම සඳහා නිලධාරියා සියලුම සුදුසුකම් සපුරා ඇති බවත් නිර්දේශ කරමි.

ආයතන ප්‍රධානියාගේ අත්සන :............................
නම :..................................................................
පදවි නාමය :......................................................
(නිල මුද්‍රාව තබන්න)

12-334

**වාරිමාර්ග අමාත්‍යාංශය**

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගබඩා භාරකරු III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021**

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගබඩා භාරකරු III ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 *බඳවා ගැනීමට අපේක්ෂිත තනතුර හා පුරප්පාඩු සංඛ්‍යාව* .- ගබඩා භාරකරු (III) - 07

1.2 *තනතුරේ රාජකාරි ස්වභාවය* .- සාමාන්‍ය කාර්යාලයීය ගබඩා භාණ්ඩ වලට අමතරව දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම් හා ව්‍යාපෘතීන්ට අදාළ යන්ත්‍රෝපකරණ, ඉංජිනේරුමය ද්‍රව්‍ය භාරයේ තබා ගැනීම, විධිමත් පරිදි නිකුත් කිරීම මෙම තනතුරට අදාළ රාජකාරි වේ.

2.0 *බඳවා ගැනීමේ ක්‍රමය* :

මෙම බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයකි. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය සමත් අයදුම්කරුවන් අතුරින් ඉහළම ලකුණු ලබාගත් අනුපිළිවෙලට තෝරාගනු ලැබේ. (මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් සියල්ලම සපුරා තිබීම අනිවාර්ය වේ.)

3.0 *මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය* :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව MN 01 - 2016 වැටුප් ඛණ්ඩයට අදාළව රු. 27,140-300x10-350x11-495x10-660x10-45,540 වන අතර වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධි විධාන අනුවය. තනතුරට පත්වීමෙන් පසු හතරවන වැටුප් පියවර එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

4.0 *සේවා ගණය* .- කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 02

4.1 ශ්‍රේණි - III ශ්‍රේණිය
II ශ්‍රේණිය
I ශ්‍රේණිය

5.0 *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

5.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. අදාළ විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. පත් කිරීම අවුරුදු තුනක (03) පරිවාස කාලයකට යටත් වේ.

ii. 2009.02.20 වැනි දින රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් නිකුත් කරන ලද අංක 1589/30 දරන කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ විධි විධාන අදාළ වේ.

iii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හා ඊට ආනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ භාෂා ප්‍රවීණතාවය නියමිත කාලය තුළ ලබාගත යුතුය.

iv. දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම් වැඩබිම් ආශ්‍රිත කාර්යාල, ප්‍රවාහන පහසුකම් අඩු දුෂ්කර ප්‍රදේශවල පිහිටා ඇත. ව්‍යාපෘති රාජකාරි හා ගංවතුර වැනි හදිසි ආපදා අවස්ථාවන්හි සේවා අවශ්‍යතාව මත දිවා රාත්‍රී සේවය අනිවාර්ය වේ. එම සේවා ස්ථාන වන්නේ අම්පාර, පොතුවිල්, කල්මුණේ, අක්කරපත්තු, පදවිය, රාජාංගනය, හුරුළුවැව, මාපාකඩ, බදුල්ල, කන්දකැටිය, නවකිරි, රුගම්, තිස්ස, වීරකැටිය, හම්බන්තොට, ලුණුගම්වෙහෙර, වැල්ලවාය, බිබිල, මොනරාගල, පොළොන්නරුව, කවුඩුල්ල, ඇලහැර, ඉඟිනිමිටිය, පුත්තලම, මුතූර්, කන්තලේ, මුරුන්කන්, වවුනියාව යන වාරිමාර්ග ප්‍රාදේශීය සහ ව්‍යාපෘති කාර්යාල වේ.

6.0 *වයස් සීමාව* :

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

7.0 *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

7.1 අධ්‍යාපන සුදුසුකම් :

(අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වී තිබීම;

සහ

(ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් සමත්ව තිබීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

7.2 කායික සුදුසුකම් :

ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3 වෙනත් :

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ආ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(ඇ) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාල සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.
(ඈ) ඉහත 7(1)(අ)(ආ) සුදුසුකම්වලට අමතරව පරිවාස කාලය තුළදී ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනය මගින් පවත්වන ගබඩාකරණය පිළිබඳ මාස තුනක (03) පුහුණුව සාර්ථකව හදාරා තිබීම තනතුරේ ස්ථිර කිරීමට අවශ්‍ය සුදුසුකමක් වේ.

8.0 *සාවද්‍ය තොරතුරු සැපයීම :*

අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැතිබව අනාවරණය වුවහොත්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වීමේ දී හෝ විභාගයෙන පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත. අපේක්ෂකයෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව අනාවරණය වුවහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කරනු ඇත.

9.0 *විභාග පරිපාටිය :*

9.1 ලිඛිත විභාග

| ප්‍රශ්න පත්‍රය | ලකුණු | සමත් ලකුණු | කාලය |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40 | පැය 01 |

අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලභාවයත්, සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත් සහ තීරණය කිරීමේ ශක්තියත් විනිශ්වය කිරීම සඳහා වූ ප්‍රශ්නාවලියකින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ.

9.2 මෙම විභාගය 2021 පෙබරවාරි මස කොළඹ දිස්ත්‍රික්කය තුළ දී සහ තෝරාගත් දිස්ත්‍රික්ක කිහිපයක පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල්දැමීම හෝ අවලංගු කිරීම, පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ පුරප්පාඩුවලින් කොටසක් පිරවීම හා අනෙකුත් සියලුම කරුණු පිළිබඳව අවසන් තීරණය වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් සතු වන්නේය.

10.0 මෙම *ගැසට්* නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතියට අනුව ඒ 4 ප්‍රමාණයේ (සෙ.මී. 21 x 29) කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අපේක්ෂකයා විසින් අයදුම්පත් සකස් කර ගත යුතුය. අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 1.0 සිට 4.0 තෙක්

පළමුවන පිටුවටද, 5.0 සිට 7.0 තෙක් දෙවන පිටුවට ද ඉතිරිය තුන්වන පිටුවට ද වන ලෙස පිළියෙල කර, ඊට අදළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම අයදුම්කරුට ප්‍රයෝජනවත් වනු ඇත. තවද ආදර්ශ අයදුම්පත්‍රය පිළියෙල කිරීමේ දී අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදීම අත්‍යවශ්‍ය වේ.

(අ) අයදුම්පත් එවීමේදී ''ගබඩා භාරකරු තනතුර සඳහා බඳවා ගැනීම - 2021'' යනුවෙන් අයදුම්පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ සඳහන් කළ යුතුය.

(ආ) අයදුම්පත් ලැබුනු බව දන්වනු නොලැබේ. අයදුම්පත් හෝ ඊට සම්බන්ධ වෙනත් ලියවිල්ලක්, තැපෑලේ දී අස්ථාන ගත වූ බවට හෝ ප්‍රමාද වූ බවට කරන පැමිණිලි පිළිබඳව සළකා බලනු නොලැබේ.

(ඇ) අදළ ආකෘතියට අනුකූල නොවන, අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11.0 අයදුම්පත් යොමු කිරීම :

අපේක්ෂකයා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන්ම සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2021.01.11 වැනි දින හෝ ඊට පෙර පහත දක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්,<br>
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,<br>
තැ.පෙ. 230, බෞද්ධාලෝක මාවත,<br>
කොළඹ 07.

12.0 *විභාගයට පෙනී සිටීම* :

විභාගය පැවැත්වෙන දිනට සතියකට කලින් ලැබෙන සේ විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය සඳහා පෙනී සිටින අයදුම්කරුවන් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

13.0 *අපේක්ෂකයාගේ අනන්‍යතාවය* :

විභාග ශාලාවේදී තමා පෙනී සිටින සෑම විෂයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත<br>
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

14.0 විභාග අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, රාජ්‍ය සේවයේ මාණ්ඩලික තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

15.0 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන සියලුම නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදු වේ.

16.0 මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

ඉංජි. කේ.ඩී.නිහාල් සිරිවර්ධන,<br>
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්

2020 දෙසැම්බර් මස 09 වන දින,<br>
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,<br>
අංක 230,<br>
බෞද්ධාලෝක මාවත,<br>
කොළඹ 07.

**ආදර්ශ අයදුම්පත්‍රය**

(කාර්යාලයීය ප්‍රයෝජන සඳහා පමණි)

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගබඩා භාරකරු III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ
විවෘත තරග විභාගය - 2021
The Open Competitive Examination for the Recruitment to the post of Store Keeper (Grade III) in the Irrigation Department - 2021

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 1
දෙමළ - 2

1.0 1.1 අයදුම්කරුගේ මුලකුරු සමඟ නම :.........................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (PERERA A. B. C.)

1.2 අයදුම්කරුගේ මුලකුරු සමඟ නම :.........................................
(සිංහලෙන්/දෙමළෙන්)

1.3 මුලකුරුවලින් හැඳින්වෙන නම :.........................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.4 මුලකුරුවලින් හැඳින්වෙන නම :.........................................
(සිංහලෙන්/දෙමළෙන්)

1.5 ජාතික හැඳුනුම්පත් අංකය :

1.6 ස්ත්‍රී/පුරුෂ භාවය :
(අදාළ අංකය කොටුව තුල ලියන්න) ස්ත්‍රී 1
පුරුෂ 2

2.0 2.1 ස්ථිර ලිපිනය :..................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය :………………
(සිංහලෙන්/ දෙමළෙන්)

2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :………………
(i) (සිංහලෙන්/දෙමළෙන්) :………………
(ii) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :…...............

2.4 දුරකථන අංකය :…...............

3.0 පදිංචිය :

3.1. පදිංචි දිස්ත්‍රික්කය :.........................................
3.2. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :.........................................

4.0 4.1 විවාහක/අවිවාහක බව : විවාහක - 2 අවිවාහක - 1
අදාළ කොටුව තුළ ලියන්න.

4.2 උපන් දිනය :

වර්ෂය මාසය දිනය

4.3 අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස :

වර්ෂ මාස දින

4.4 ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද ? ලියාපදිංචිවීමෙන් ද ?

5.0 *අධ්‍යාපන සුදුසුකම් :*

5.1. අ.පො.ස (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර :

I. විභාගයේ වර්ෂය හා මාසය : වර්ෂය :.............මාසය :..............
II. විභාග අංකය : ....................................
III. ප්‍රතිඵල :

| *විෂය* | *සාමාර්ථය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.2 අ.පො.ස (උ/පෙළ) විභාගය පිළිබඳ විස්තර :

I. විභාගයේ වර්ෂය හා මාසය : වර්ෂය :.............මාසය :..............
II. විභාග අංකය : ........................................................
III. ප්‍රතිඵල :

| *විෂය* | *සාමාර්ථය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

6.0. ඔබ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

| ඔව් | |
|---|---|

| නැත | |
|---|---|

එසේ දඬුවම් ලැබ ඇත්නම්, ඒ කුමන වරදක් සඳහා කවර අධිකරණයකින් කවර දඬුවමක් ලැබ ඇත් ද යන තොරතුරු සපයන්න.
..........................................................................................................................................................................
..........................................................................................................................................................................

7.0 අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් තොරතුරක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් විය හැකි අලාභය විඳ දරා ගැනීමට මම එකඟ වෙමි. තවද මෙහි සියලුම තොරතුරු නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) විභාග පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීති වලට අනුකූලව ක්‍රියා කිරීමටත්, මෙම කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව අනාවරණය වුවහොත් විභාගට පෙර හෝ විභාගයෙන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයක් පිළිගැනීමට එකඟ වෙමි.

(ඇ) ............................ලද මෙම ප්‍රකාශනය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්වීම නොලැබීමට යටත් වන බවත් මම දනිමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

8.0. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :
මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................................................ මයා/මිය/මෙනෙවිය , මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ ඇය ..............................වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන සහ
නිල මුද්‍රාව

සහතික කරන නිලධාරියාගේ නම : ...................................................
තනතුර : ...................................................
ලිපිනය : ...................................................

9.0. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (දැනට රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට පමණක් අදළ වේ.)

................................................ මයා/මිය/මෙනෙවිය .................................................සේවයේ නියුතු ................................................. ....... තනතුර දරන නිලධාරියෙකු බවත්, ඔහු/ඇය ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා ඔහු /ඇය තෝරා ගනු ලැබුවහොත්, ........................................සේවයෙන් ඔහු/ ඇය මුදා හැරිය හැකි /නොහැකි බවත් වැඩි දුරටත් දන්වා සිටිමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ
නිල මුද්‍රාව

දිනය :————.

12-370

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.